sinhalaebooks.com

Enid Blyton ගේ St. Clare's කතා මාලාවේ එකොළොස්වැන්න

# අපූරු ඉස්කෝලේ හිම මිදෙන කාලේ



සුදත් රොහාන්

Scanned with CamScanner

sinhalaebooks.com

## අපූරු ඉස්කෝලේ කතා මාලාවේ
## මෙතෙක් නිකුත් වී ඇති පොත්

හරි අපූරු ඉස්කෝලේ
අපූරු ඉස්කෝලේ අපූරු දවස්
අපූරු ඉස්කෝලේ අපූරු සොයුරියෝ
අපූරු සොයුරියන්ගේ අපූරු රහස්
අපූරු ඉස්කෝලේ ගිම්හාන කාලේ
අපූරු ඉස්කෝලේ බිහිසුණු රැයක්
අපූරු ඉස්කෝලේ දෙවැනි වාරය
අපූරු ඉස්කෝලේ අපූරු සාදය
අපූරු ඉස්කෝලේ අපූරු මිතුරිය
අපූරු ඉස්කෝලේ රාත්‍රී සවාරිය
අපූරු ඉස්කෝලේ හිම මිදෙන කාලේ

## ඉදිරියේ දී නිකුත් වන පොත්

අපූරු ඉස්කෝලේ අවසන් වාරේ

මේ සෑම පොතක්ම
කියවන්න අමතක කරන්න එපා

Scanned with CamScanner

sinhalaebooks.com

# අපූරු ඉස්කෝලේ

## රසවත් මතක සටහන් සමඟින්

පොත් දොළහකින් සමන්විත අපූරු ඉස්කෝලේ කථා මාලාවේ එකොළොස් වැනි පොතයි ඔයාලා මේ කියවන්න සූදානම් වෙන්නේ. පැට් සහ ඉසබෙල් ඔසුලිවාන් නිවුන් සොයුරියන් දෙදෙනා සමග අපූරු ඉස්කෝලේ ඉගෙන ගන්නා සෑම දෙනාම දැන් ඔයාලට ගොඩාක් පුරුදුයි. ඒ අයත් හරියටම දැන් ඔයාලගේ යෙහෙළියෝ කියලා කීවොත් ඒකෙත් වරදක් නෑ. ඒ අයගේ රසවත් මතක සටහන් රැසක් මේ පොතෙනුත් කියවන්න ලැබෙයි.

මේ පොත් පෙළේ දොළොස් වැනි පොතත් ළඟදීම ඔයාලට කියවන්න ලැබෙයි. ඒ පොතත් සමඟම අපූරු ඉස්කෝලේ කථාමාලාව අවසන් වෙනවා. හැබැයි මම මේ පොත් පෙළ නිමා කරන්නේ ඔයාලට පොරොන්දුවකුත් දෙන ගමන්. මේ පොත් පෙළටත් වඩා අපූරු. ඒ වගේම රසවත් පොත් පෙළක් ඉක්මනින් ඔයාලට තිළිණ කරනවා කියන එක තමයි මගේ පොරොන්දුව. මම ඒ ගැන විස්තර පසුව දන්වන්නම්. එතෙක් මේ පොත පිළිබඳව ඔයාලගේ ප්‍රතිචාරත් නොවරදවාම මට දන්වන්න.

ස්තුතියි.

සුදත් රොහාන්
'විහඟ ගීත්'
හේවාදිවෙල
රඹුක්කන
0777 642298

Scanned with CamScanner

sinhalaebooks.com



අපි ඉස්සර

පොත් කියවන්නට කම්මැලියි.

පොතක් අතින්වත් අල්ලන්නේ නෑ.

ඒ වුනත්

අපූරු ඉස්කෝලේ පොත් පෙළ

කියෙව්වට පස්සේ

අපි පොත් කියවන්නට ආසයි.

ඒ නිසා අපි දැන්

හැමදාම පොත් කියවනවා.

එවැනි හෘදයාංගම ප්‍රතිචාර දැක්වූ

ආදරණීය දූ දරුවන් සැමට

සෙනෙහසින් පිදේ.

Scanned with CamScanner

# ශීත සෘතුවට පාසල ආරම්භ වෙලා

ගිම්හාන නිවාඩුවට සති අටක්ම ගතවුනා. මේ දිගු කාලය පුරාවටම සෙන්ට් ක්ලෙයාර් පාසල හිස් බවෙන් සහ නිහඬතාවයේ ගිලී තිබුනා. නිවාඩු කාලය තුළදී පාසලේ ගොඩනැගිලි අළුත් වැඩියා කිරීමේ කටයුතු සඳහා මිනිසුන් පිරිසක් පැමිණ සිටිහය. පාසලේ නිහඬතාවය යන්තමෙන් හෝ නැතිවූනේ ඔවුන්ගේ විවිධාකාර හඬවල් වලිනි. බුරුසු එමෙන්ම කොසුවලින් පාසලේ ගොඩනැගිලි සහ පොළව පිරිසිදු වෙද්දී ඇසෙන හඬවල් හැරෙන්නට වෙනත් කිසිම හඬක් කොහෙන්වත් ඇ[illegible]ත් නැත. පාසලේ සුරතල් පූසන්ටද සිදුවූ මේ වෙනස අදහා[illegible] බැරි වූවා සේය. ඔවුන් ගැහැණු ළමයින් සොයා සෑම තැනම ඇවිද ගියේ ඒ නිසා ය.

Scanned with CamScanner

sinhalaebooks.com



එහෙත් දැන් පාසල නැවතත් ආරම්භ වෙන දවස පැමිණ තිබේ. ඒ නිසා සියල්ලම වෙනස් වෙලා ය. ගැහැණු ළමුන් පුරවා ගත් බස් රථ නැවතත් සුපුරුදු පරිදි පාසලට එන කන්ද නගින්නට පටන්ගත්තේ ය. ඒ සෑම බස් රථයකම සිනාවෙන් මුව පුරවා ගත් ගැහැණු ළමුන් පිරී සිටිති. ගිත සෘතුව වෙනුවෙන් සෙන්ට් ක්ලෙයාර් පාසල නැවතත් ආරම්භ වන දිනය පැමිණ ඇත.

'මේක ගීත සෘතුව කියලා කවුද හිතන්නේ ?.'

පැට් තම නිවුන් සොයුරිය වන ඉසබෙල්ට කීවා ය.

'අර බලන්නකෝ ගිම්හාන කාලේ වගේම ගොඩාක් සැරට ඉර පායලා තියෙනවා. අපිට ටෙනිස් සෙල්ලම් කරන්න. ඒ වගේම එළිමහනේ සෙල්ලම් කරන්න තවමත් පුළුවන් වෙයි කියලා මට හිතෙනවා.'

'පිහිනුම් තඩාගයට බැහැලා හොඳට පිහිනන්නත් පුළුවන්. අනික දැන් පිහිනුම් තඩාගයට අළුත් වතුරත් පුරවලා ඇති. අද හවස තේ වලින් පස්සේ මම නම් පිහිනන්න යනවා.'

බොබී සතුටින් කීවාය. හිරු එළිය නිසා ඇගේ මුහුණේ ඇතිවූ පැල්ලම් තවමත් මැකී ගිය බවක් පෙනෙන්නටවත් නැත. ඇයට පිළිතුරු ලැබුනේ ක්ලෝඩින් ගෙනි.

'අනේ බොබී. ඔයා හැම වෙලාවෙම ටෙනිස් සෙල්ලම් කරනවා. නැතිනම් පිහිනනවා. එහෙමත් නැතිනම් දුවනවා. පනිනවා. ඔයාගේ මුහුණේ පැල්ලම් ඇතිවෙලා තියෙන්නත් ඒ නිසා වෙන්න ඇති. ඔය වගේ පැල්ලම් ගොඩාක් මම වෙන කාගෙවත් මුහුණක දැකලා නෑ. ඔයා දන්නවද ?. නිවාඩු කාලේ මම නම් ගොඩාක් පරිස්සම් වුනා. ඒ නිසා මගේ මුහුණේ එක පැල්ලමක්වත් නෑ.'

ක්ලෝඩින් ගේ කථාවට ගැහැණු ළමයින් වෙතින් මහා සිනා හඬක් නැගුනේ ය. තමාගේ මුහුණේ පැල්ලමක් හෝ ඇති

Scanned with CamScanner

sinhalaebooks.com



නොවෙන ලෙස පරිස්සම් වන්නට ක්ලෝඩින් නිතරම වග බලා ගත්තීය.

තවත් ටික වෙලාවකින් ගැහැණු ළමෝ පාසල වෙතට දුව යන්නට පටන්ගත්හ. ඔවුන්ට හුරු පුරුදු පඩිපෙළ දිගේ නැගගෙන එකිනෙකා පරදවා ඉදිරියට දුවගෙන ගිය ගැහැණු ළමුන් රංචුව පංති කාමර තිබෙන පැත්තට ගියහ. සෑම ගැහැණු ළමයෙක් අතේම ලක්‍රොස් පිත්තක් බැගින් ද නොවරදවාම දැක ගත හැකිය.

' හලෝ හිලරි. හලෝ ජැනට්. ආ මේ ඉන්නේ අපේ කාලෝටා. දැන්නම් එයාගේ අභිගුන්ඨික පෙනුම තවත් හොඳට පෙනෙනවා. ඒයි කාලෝටා නිවාඩු කාලේ ඔයා කොහෙද ගියේ ?. ඔයා තවත් කළු වෙලා. දැන්නම් හරියට ජිප්සි කෙල්ලෙක් වගේමයි.'

' නිවාඩු කාලේ මම හිටියේ ස්පාඤ්ඤයේ. මගේ නෑයෝ වගයක් එහේ ජීවත් වෙනවා කියලා ඔයාලා දන්නවනේ. ඉතින් මම ඒ අයව බලන්න ගියා. ෂා හරිම අපූරු දවස් ටිකක් තමයි ගෙවුනේ'

කාලෝටා සතුටෙන් කීවා ය. ඒ සමඟම ඉසබෙල් ද සතුටින් බෙරිහන් දුන්නා ය.

' මෙන්න මිරාබෙල් එනවා. දෙයියනේ. එයා තවත් උස ගිහිං වගේ. එයා එක්ක ඉන්න කොට. ග්ලැඩිස් පුංචි මී පැටියෙක් වගේ.'

' හලෝ... කොහොමද යාළුවනේ. ඉතින් හැම දෙනාම සනීපෙන් ඉන්නවද ?'

ඔවුන් සිටින තැනට එන ගමන්ම මිරාබෙල් ඇසුවා ය ගැහැණු ළමෝ ඇය අසලට දුවගෙන ගියහ.

'හලෝ මිරාබෙල්. හලෝ ග්ලැඩිස්. කොහොමද ?. ඔයාලා දෙන්න නිවාඩු කාලේ එකට නේද හිටියේ ?. මොනවද ඔට්ටු ?. ඔයාලා දෙන්න නම් ඇති වෙනකම් ටෙනිස් සෙල්ලම් කරන්න ඇති.'

Scanned with CamScanner

sinhalaebooks.com



මිරාබෙල් සහ ග්ලැඩිස් දෙදෙනාම ක්‍රීඩාවලට දැඩි කැමැත්තක් දක්වති. ඒ නිසාම මේ වාරයේදී සෙන්ට් ක්ලෙයාර් පාසලේ ක්‍රීඩා නායිකාව ලෙස පත්වන්නට ද මිරාබෙල් ගේ හිතේ අදහසක් තිබෙ. මෙතෙක් දිනක් පාසලේ ක්‍රීඩා නායිකාව වූයේ ඈනී තෝමස් ය. එහෙත් දැන් ඈනී තෝමස් පාසලෙන් අයින් වෙලා ය. ඒ නිසා ක්‍රීඩා නායිකාව වන්නට වැඩිම සුදුසුකමක් තිබෙන්නේ මිරාබෙල් ටයි.

' අපේ පංති කාමරේ පැත්තට ගිහිං බලමු ද ?. නිවාඩු කාලේ පංති කාමර හැම එකක්ම පිරිසිදු කරලා වගේ. අපේ පංති කාමරෙත් පිරිසිදු කරලා කියලා මට හිතෙනවා. එහෙම නම් දැන් අපේ පංති කාමරේ ගොඩාක් ලස්සනට ඇති. එන්න අපි ගිහිං බලමු.'

බොබී එලිස් ගේ අදහසට හැම දෙනාම අවනත වූහ. ඉන්පසුව ඔවුන් සැම දෙනාම පඩිපෙළ දිගේ නැග පස් වැනි වසරේ පංති කාමරය දෙසට යන්නට වූහ. ඇත්තෙන්ම දැන් පංති කාමරය මොන තරම් ලස්සන ද ?. ලා කහ පැහැය ආලේප කර ඇති පංති කාමරය පුරා සිත්ගන්නා සුන්දරත්වයක් සහ පිරිසිදුබවක් දැකගත හැකිය. ජනේලයෙන් එපිට පෙනෙන්නේ ද අපූරු දසුනකි.

' අපිට මේ පංති කාමරේ ඉන්න ලැබෙන්නේ මේ වාරේ විතරයි. ඊට පස්සේ අපි හයවැනි වසරට යනවා. ඒක තමයි මේ ඉස්කෝලේ තියෙන ඉහළම පංතිය. මම මේ ඉස්කෝලෙට ආපු මුල්ම දවස් ගැන මට තාමත් මතක් වෙනවා. ඒ දවස්වල පහ. හය වසර වල ඉන්න ළමයින්ට මම කථා කලේ ගොඩාක් බයෙන්. ඒ අය හරිම ලොකු අය වගෙයි මට පෙනුනේ. ඔන්න ඉතින් අපිත් දැන් ඒ වගේ ලොකු ළමයි වෙලා.'

හිලරි ගොඩාක් සතුටෙන් එහෙම කියද්දි ජැනට් ද කථාවට එකතු වූවා ය.

Scanned with CamScanner

sinhalaebooks.com



' ඇත්ත තමයි. පොඩි පංතිවල ළමයින්ට දැන් අඬිවත් පෙනෙනවා ඇත්තෙත් ඒ විදිහට තමයි. ඔයාලා දන්නවද ?. පොඩි ළමයි ඉස්සරහට හම්බ වුනාම ඒ අය ගොඩාක් බයෙන් පාරෙන් එහාට වෙනවා. හරියට පුංචි හා පැටවු වගේ.'

' මේ සැරේ මගේ නංගිත් දෙවැනි වසරට ඇවිත් ඉන්නවා.'

අපූරු ප්‍රංශ ගැහැණු ළමයා. ක්ලෝඩින්. ඔවුන්ට කීවේ මොන තරම් අපූරු ආරංචියක් ද ?.

' නංගියි මම යි දෙන්නම ප්‍රංශේ ඉඳලා එකටමයි ආවේ. ආ. අර බලන්න. අන්න අතන ඉන්න පුංචි ළමයා තමයි මගේ නංගි. එයාගේ නම ඇන්ටනට්'

ගැහැණු ළමුන් පිරිස වහ වහා ජනේලයෙන් පිටතට නෙත් යොමු කළහ. වයස දා හතරක පමණ ගැහැණු ළමයෙක් ඔවුන්ට දැක ගත හැකිය. ඇගේ සුදුමැලි මුහුණ සහ කළු පැහැති හිස කෙස් ක්ලෝඩින්ට බොහෝ සෙයින් සමානය.

' ක්ලෝඩින්. ඇන්ටනට් ව එක්ක ගිහිං ඉස්කෝලේ විස්තර ටිකක් පෙන්නුවොත් හොඳ නැද්ද ? එයාට තනිකම දැනෙනවා කියලා මට හිතෙනවා.'

පැට් එසේ කියද්දි ක්ලෝඩින් සිනාසුනා ය. ඉන්පසුව ඈ මෙසේ කීවා ය.

' ඇන්ටනට් කිසිම දවසක තනිවෙන්නේ නෑ. ඇත්තටම එයත් මම වගේම ඕනෑ දේකට ඕට්ටු ළමයෙක්.'

' ආ... නංගිත් එහෙනම් ඔයා වගේම ළමයෙක්. ඇත්තමයි. ඒක නම් හොඳ ආරංචියක් නෙමෙයි. ක්ලෝඩින්. ආ... අන්න අපේ වයසක මැඩමොසෙල්.'

බොබී සමච්චල් සහගත ලෙස එසේ කියද්දි ගැහැණු ළමෝ ජනේලයෙන් පිටත බලන්නට වූහ. මැඩමොසෙල් පාසලේ පිට්ටනිය

Scanned with CamScanner

sinhalaebooks.com



දිගේ ඉදිරියට ඇවිද යන ආකාරය ඔවුන්ට දැකගත හැකිය. ඇගේ මුහුණ පුරා තිබෙන්නේ කිසියම් ප්‍රීතිමක් බවකි.

'මැඩමොසෙල් යන්නේ ඇන්ටනට් හොයාගෙන. එයා ඇන්ටනට් ව අවුරුදු දෙකකින් දැකලා නෑ. ආ... දෙයියනේ දැන් ඉතින් ඇන්ටනට් ට එපා වෙනකම් මැඩමොසෙල් එයාට අනුකම්පා කරන්න පටන් ගනියි. ඇන්ටනටු ත් මම වගේම හරිම අපූරු ළමයෙක් කියලයි මැඩමොසෙල් නැන්දා හිතාගෙන ඉන්නේ'.

ක්ලෝඩින් දිගින් දිගටම කියාගෙන ගියා ය. සත්තකින්ම මැඩමොසෙල් ඇගේ නැන්දා ය. මෙම නෑකම නිසා සමහර අවස්ථාවලදි ක්ලෝඩින් ට වාසිදායක දේවල් සිදුවෙන බවද කිසිවෙකුටක් රහසක් නොවෙ. එහෙත් සමහර අවස්ථාවලදි සිදුවන්නේ ක්ලෝඩින් අපහසුවට පත්වෙන දේවල් ය. මේ අතර කුඩා ප්‍රංශ ගැහැණු ළමයා ඇන්ටනට්ව් පාසලේ සිදුවෙන දේවල් දෙස සතුටෙන් බලා සිටියා ය. ඉංග්‍රීසි ගැහැණු ළමෝ එකිනෙකාගේ අත්වලින් අල්ලා ගෙන සතුටෙක් එහෙ මෙහෙ ඇවිද යති. මෙවැනි සුහදශීලි පාසලක් ඇන්ටනට් මෙයට පෙර කිසිම දවසක දැක තිබුනේ නැත. ඒ නිසා මෙය ඇයට සැබෑම අත්දැකීමකි.

එහෙත් ඉන්පසුව සිදුවූයේ ඇන්ටනට් කිසිලෙසකින් හෝ බලාපොරොත්තු වූ දෙයක් නොවේ. එක්වරම තමන් ඉදිරියේ ඇති පොළව දෙදරන්නාක් මෙන් ඇයට දැනේ. ඉන්පසුව කිසිවෙකුගේ දැවැන්ත අත් දෙකක් ඇන්ටනට් ගේ ගෙල වටා එතුනේ ය. ඒ සමඟ ආදරණීය ප්‍රංශ වචන වැස්සක් මෙන් කඩා වැටෙන්න විය. තවත් මොහොතකින් පුංචි ප්‍රංශ ගැහැණු ළමයාගේ දෙකම්මුල් පුරාම හාදු වැස්සක් පතිත වෙද්දි ඇය හුස්ම ගන්නට නොහැකි වූවාක් මෙන් වටපිට බලන්නට විය.

'ආනේ පුංචි ඇන්ටනට්. දැන් ඔයා මොන තරම් අපූරු ගැහැණු ළමයෙක් ද ?.'

Scanned with CamScanner

sinhalaebooks.com



මැඩමොසෙල් තමන්ගේ උපරිම කටහඬෙන් කෑ ගසා බෙරිහන් දෙද්දී පිට්ටනියේ ක්‍රීඩා කරන ගැහැණු ළමෝ තමන් ගේ ක්‍රීඩාවන් නවතා ඇන්ටනට් සහ මැඩමොසෙල් දෙස බලන්නට වූහ. එයින් නොනැවතුණු ගැහැණු ළමෝ නොයෙකුත් අන්දමේ උසුළු විසුළු ද කරන්නට වූහ. බොහෝ දෙනෙකු සිටින ස්ථානයකදී මෙවැනි දෙයක් අත් දකින්නට ඇන්ටනට් තිකමටවත් කැමැති වූයේ නැත. ඒ නිසා මෙම කරදරකාරි අවස්ථාවෙන් මග හරින්නට ඈ සෑහෙන උත්සාහයක් ගත්තා ය.

ඇන්ටනට් වටපිට බලන්නට වූවා ය. තමන්ගේ වැඩිමහල් සහෝදරිය ක්ලෝඩින් ප්‍රීතියෙන් සිනාසෙමෙන් පාසලේ ඉහළ මාලයේ ජනේලයෙන් පහත බලා සිටින ආකාරය ඇයට දැකගත හැකිවිය. ඇන්ටනට් වහාම ඒ බව මැඩමොසෙල්ට පෙන්නුවා ය.

' මැටිල්ඩා නැන්දේ. අර බලන්න. ක්ලෝඩින් අක්කා ඔයා දිහා බලාගෙන ඉන්නවා. ඔයා මට සුභ පතනවා දැක්කම එයාට ඉරිසියා හිතෙයි. ඒ හින්දා ඔයා එයාටත් සුබ පැතුවොත් හොඳයි කියලා මට හිතෙනවා.'

මැඩමොසෙල් උඩ බැලුවා ය. ජනේලයේ එල්ලි පහත බලා සිටින ක්ලෝඩින් ඇයට දැකගත හැකි ය. ඇන්ටනට් වැළඳ ගෙන සිටින ගමන්ම ක්ලෝඩින්ට අතවනා මැඩමොසෙල් මෙසේ කීවා ය.

'හා... පුංචි ක්ලෝඩින්. ටිකක් ඉන්න. මම ඔයාවත් බලන්න ඉක්මනට එනවා.'

ඒ අවසරයෙන් ඇන්ටනට් මැඩමොසෙල් ගේ ග්‍රහණයෙන් ගැලවී අසල සිටි ගැහැණු ළමුන් රොත්ත අතරට දිව ගියා ය. ඒ සමගම මැඩමොසෙල් ඉහළ මාලයට නගින පඩිපෙළ දෙසට ඇවිද යන්නට වූවා ය. 'මම එනවා. මම එනවා ක්ලෝඩින් ' එසේ කියමින් දුවගෙන එන මැඩමොසෙල් ගෙන් ගැළවෙන්නට කල්පනා

Scanned with CamScanner

sinhalaebooks.com



කළ ක්ලෝඩින් වෙනතකට දුව ගියා ය. මේ අපූරු ජවනිකාව දෙස බලා සිටින ගැහැණු ළමයින්ගේ මුහුණු සිනාවෙන් ඔපවත් වෙලා ය.

' මේ සැරේ නම් මැඩමොසෙල්ට කිසිම නිවාඩුවක් නැතිවෙයි.. ඇයි එයාට හිතේ හැටියට ආදරේ කරන්න පුංචි ලේලියෝ දෙන්නෙක්ම ඉන්නවනේ.'

තවත් ස්වල්ප වෙලාවකින් අහිංසක මැඩමොසෙල් පස්වැනි වසර පංති කාමරයට කඩා වැදුනා ය. ක්ලෝඩින් වැළඳගෙන සුබ පතන්නට සූදානම් වුවද ක්ලෝඩින් පෙනෙන්ටවත් නැත.

' ආ... ක්ලෝඩින් මෙතැන නැහැනේ. කමක් නෑ. මම එයාව කොහොම හරි හොයාගන්නම්කෝ.'

සිනාවෙන් රතුවූ මුහුණු ඇති පස්වැනි වසරේ ගැහැණු ළමයින් රොත්ත දෙස විපරමෙන් බලා මැඩමොසෙල් කීවා ය.

' ආ.. බා......බී ඔයා ආයෙමත් ඇවිත්. එතකොට ඇන්ජෙලා. ඇලිසන් ඔයාලා හැම දෙනාම ඇවිත්. බොහොම හොදයි. ඔයාලා හැම දෙනාම හරිම හොද ළමයි. හැබැයි මේ වාරෙදි නම් ඔයාලට මාත් එක්ක ටිකක් මහන්සිවෙලා වැඩ කරන්න වෙනවා. ඊළඟ වාරෙදි ඔයාලා මේ ඉස්කෝලේ තියෙන ඉහළම පංතියට යනවනේ. හය වැනි වසර. ඒ හින්දා මේ වාරෙදි සෑහෙන්න මහන්සි වෙන්න වෙයි.'

එසේ කියූ ප්‍රංශ ගුරුවරිය ක්ලෝඩින් සොයාගෙන නැවත වතාවක් පංති කාමරයෙන් නික්ම ගියා ය. මෙතෙක් වෙලාවක් මැලවී තිබූ ගැහැණු ළමයින්ගේ මුහුණු වල සිනාමල් නැවත වතාවක් පිපෙන්නට විය.

' හරිම හොද මැඩමොසෙල්. මම අවුරුදු සීයක් ජීවත් වුනත් මට නම් එයාව කවදාවත් අමතක වෙන්නේ නෑ. අපි එයාට මොන තරම් විහිළු කරලා තියෙනවද ?. අපි ගිය වාරේ කරපු සුවද බෝලයේ සෙල්ලම මතක ද?. ඒ ගැන දැනෙන කොට මැඩමොසෙල්ගේ මුහුණ

sinhalaebooks.com



තිබුන හැටි මතක් වෙනකොට මට නම් කඳුළු එනකම් වුනත් හිනාවෙන්න පුළුවන්.'

'මේ වාරේ අපේ පංතියට ඇවිත් ඉන්නේ එක අළුත් ළමයෙක් විතරයි.'

ජැනට් කථාව වෙනතකට යොමු කරන ගමන් කීවා ය.

'පහළ බෝඩ් එකේ තිබුන නම් ලැයිස්තුව මම දැක්කා. අළුත් ළමයගේ නම ඈන් මාරි ලොන්ග්ඩෙන්. එතකොට හතරවැනි වසර පංතියේ හිටපු ෆෙලිසිටි රේ ට උසස් වීමක් හම්බවෙලා අපේ පංතියට ඇවිත් ඉන්නවා.

' ෆෙලිසිටි ට වයස කීය ද ?. මම හිතන විදිහට එයාට අපිටත් වඩා වයස ඇති. අනික එයා කිසිම කමකට නැති ළමයෙක් කියලත් මම අහලා තියෙනවා.'

එසේ කියුවේ මිරාබෙල් ය. ඒ සමගම ග්ලැඩිස් ගේ කටහඬ ඇසිනි.

' නෑ... එයා එහෙම කෙනෙක් නෙමෙයි. හැබැයි සංගීතයට නම් හරිම දක්ෂයි. ඔයාලා දන්නවද ?. එයාට සංගීතය ඇරෙන්න වෙන කිසිම දෙයක් වැදගත් නෑ. ඒ හින්දා අනිත් පාඩම් කටයුතු එයා අතින් මග ඇරෙනවා. හරියට තාරාවෙකුගේ පිටේ වතුර රැඳෙන්නේ නෑ වගේ. සංගීතය ඇරෙන්න අනිත් පාඩම් වලින් එයා අන්තිමයා වෙන්නෙ ඒ නිසයි.'

'එයා සංගීතය ඇරෙන්න අනිත් පාඩම් ගැන ෆෙලිසිටි ගේ උනන්දුවක් නෑ කියන එක කාරණේ ගැන නම් මිස් කෝන්වෙලිස් කොහොමටවත් සතුටු වෙන්නේ නැති වෙයි.'

බොබී කීවා ය. පස්වැනි වසරේ පංති භාර ගුරුවරිය ගැන ඇයට හොඳ වැටහීමක් තිබේ. ඈය තදබල නීති රීති සහිතව ළමයින්ට උගන්වන හොඳ ගුරුවරියකි.

Scanned with CamScanner

sinhalaebooks.com



'ෆෙලිසිටි ඉතිහාසය. භූගෝලය. ගණිතය වගේ පාඩම් ගැනත් දන්නවා කියලා මට නම් කිසිම සැකයක් නෑ. මේ වාරෙදි එයාට මේ හැම දේම ගොඩාක් හොඳට ඉගෙන ගන්න අවස්ථාවක් ලැබෙයි.'

'තවත් අළුත් ළමයි ඇවිත් ඉන්නව ද?'

මිරාබෙල් ඇසුවා ය.

'ඇත්තටම ඒක නම් හරිම විහිළු නමක්. අල්මා පුඩිං ගේ නමත් පස් වැනි වාරයේ ළමයින්ගේ ලැයිස්තුවෙ තිබුනා.'

ජැනට් කීවා ය.

'එයා ඉන්නේ හය වැනි වසරේ නේද ?. ඒ වුනාට මොනව හරි හේතුවක් නිසා එයා ආයේ පාරක් පස් වැනි වසරට ම දමලා තියෙනවා.'

'මම නම් ඒකට කැමැති නෑ. ඒ ළමයා ඒතරම් අපූරු ළමයෙක් කියලා මම නම් හිතන්නේ නෑ. බලන්නකෝ එයාගේ නම වුනත් වෙනස් පුඩිං. එයා නම් නරක් වුන පුඩිමක් කියලා මට හිතෙනවා.'

බොබී එසේ කියද්දී හිලරිටද කියන්නට යමක් තිබුනා සේය.

'අල්මා ගොඩාක් තරහ යන ළමයෙක්. ආයෙමත් පස් වැනි පංතියේ ඉන්න වුන එක ගැන එයා ගොඩාක් කේන්තියෙන් ඉන්නවා ඇති. ඒ ගැන නම් කිසිම සැකයක් නෑ.

මේට්‍රන් වරිය පංති කාමරයේ දොරෙන් ඇතුළු වූයේ ඒ අවස්ථාවේදී ය. ඇය සමඟ උස. කෙට්ටු එමෙන්ම කළු පැහැති ඇස් ඇති ගැහැණු ළමයෙක් ද සිටියා ය. එම ගැහැණු ළමයාගේ අළු පැහැති කෙස් කළඹ නිසා ඇස්වල කළු පැහැය වඩාත් කැපී පෙනෙන බව ළමයින්ට වටහාගත හැකි වූහ.

'හලෝ... පස් වැනි වසරේ ළමයි. කොහොමද ? ඔයාලා

Scanned with CamScanner

හැම දෙනාම ආණනු ආව ද ? හොඳ ළමයි. ඔයාලා කාටවත් සරළව සෙම් ගෙඩි. පැපොල වගේ ලෙඩ හැදුනේ නැති එක නම් වාසනාවක්. ඒක නෙවෙයි. ඔන්න මම ඔයාලට අළුත් යාළුවෙක් එක්ක ආවා. මෙයාගේ නම ඇන් මාරි ලොන්ග්ඩෙන්.

ඇන් මාරි ලැජ්ජාවෙන් මෙන් සිනාසුනාය. ඇය එතරම් ප්‍රිය මනාප ළමයෙක් නොවේ. එහෙත් ඇගේ රත්තරන් පාට හිසකෙස් සහ කළු පැහැති දෑස නිසා කිසියම් ආකර්ශනීය බවක් ඇය වෙතින් දැක ගත හැකිය. ටික වෙලාවකට පසුව ගැහැණු ළමයා සිහින් ලෙස මෙසේ ඇසුවා ය.

' හලෝ.. ඔයාලා හැමෝම පස් වැනි පංතියේ ළමයි ද? මොනවද ඔයාලගේ නම් ?.'

හිලරි පංතියේ නායිකාවයි. ඒ නිසා ළමයින් අඳුන්වා දෙන්නට භාර වුනේ ද ඇයටයි.

' මේ ඉන්නේ සුලිවාන් සහෝදරියෝ. එක්කෙනෙක් පැට් අනිත් කෙනා ඉසබෙල්. ඒ අය අවුරුදු ගණනක් තිස්සේ ඉඳන් තමයි මේ ඉස්කෝලේ ඉන්නේ. මේ ඉන්නේ ජැනට්. මෙයාගේ නම තමයි රොබෙටා. හැබැයි හැමදෙනාම කථා කරන්නේ බොබී කියලයි. එයාගේ මුහුණේ පැල්ලම් තියෙනවා. ඒ නින්දා ඔයාට බොබී ව අඳුන ගන්න ඒ තරම් අමාරු නෑ. අනිත් කාරණාව තමයි මේ දෙන්න ගැන ටිකක් විමසිල්ලෙන් ඉන්න ඕනෑ. ඒ අය විහිළු කරන්න හරිම දක්ෂයි.'

හිලරි එසේ කියද්දී, ඇන් මාරි ආචාරශීලිව සිනාසුනාය. ඒ අතර හිලරි තමා ඉදිරියේ සිටින සෑම ගැහැණු ළමයාම ඇන් මාරිට හඳුන්වා දෙන්නට වූවා ය.

' මේ ඉන්නේ ඩොරිස්. එයාට මේ ඉර හඳ යට ඉන්න ඕනෑම කෙනෙක් අනුකරණය කරන්න පුළුවන්. වැඩි දවසක් යන්න ඉස්සර

Scanned with CamScanner

sinhalaebooks.com



වෙලා එයා ඔයාවත් අනුකරණය කරයි කියලා මට හිතෙනවා ඈන් මාරි.'

ඈන් මාරි ඩොරිස් දෙසට යොමු කළේ එතරම් සතුටුදායක බැල්මක් නොවේ. ඇයට ඩොරිස් ව පෙනුනේ මෝඩ ළමයෙකු ලෙසිනි. ඩොරිස් සතුව ඇති තීක්ෂණ දෑස ත්. කරුණාවන්ත මුහුණත් ඈන් මාරි නුදුටුවා ය.

' මේ ඉන්නේ කාලෝටා. එයා අභිගුන්ඨික ළමයෙක් වගේ කළු පාටයි.'

හිලරි එසේ කියද්දී කාලෝටා තමාට හුරුපුරුදු නොසන්සුන් බැල්මෙන් ඈන් මාරි ට සංග්‍රහ කළා ය. ඉන්පසුව ඈ මෙසේ කීවා ය.

' මම ඔයාට ඇත්තම කියන්නම් ඈන් මාරි. මම ඉස්සර සර්කස් කණ්ඩායමක හිටියා. ඒ දවස්වල මම අශ්වයෝ පැද්දා. සර්කස් සෙල්ලම් කෙරුවා. වැඩි දවසක් යන්න ඉස්සර වෙලා ඇන්ජෙලා ඒ කථාව ඔයාට කියලා දෙයි. ඊට ඉස්සර වෙලා තමයි මම ඔයාට ඒ කථාව කියන්න හිතුවේ.'

කාලෝටා එසේ කියද්ද රත්තරන් පාට හිසකෙස් ඇති ඇන්ජෙලා ලැජ්ජාවෙන් වටපිට බලන්නට වූවා ය. සාමන්‍යයෙන් ඇන්ජෙලා කේලාම් කියන බව කාලෝටා දනියි. එහෙත් දැන් ටික දිනක සිට. ඇන්ජෙලා එවැනි දේවල් වලට තම කාලය වැඩිපුර යොදවන්නේ නැත. එහෙත් තමා අකැමැති ඕනෑම අයෙකුට එරෙහිව පහර දෙන්නට කාලෝටා තම තියුණු දිව උපයෝගි කර ගනියි. දැන් සිදුවූයේ ද එවැනි සිදුවීමකි.

කාලෝටා සහ ඇන්ජෙලා අතර ඇතිවන්නට සූදානම් වූ උණුසුම් වචන හුවමාරුව සමනය කරන්නට ද හිලරි වහාම මැදිහත් වූවා ය.'

'ඈන් මාරි. මේ ඉන්නේ ඇන්ජෙලා. අපේ පංතියේ ඉන්න

Scanned with CamScanner

sinhalaebooks.com



සිහින කුමාරි තමයි මෙයා.'

ඒ සමඟම නැවත වතාවක් කාලෝටා ගේ අනුකම්පා විරහිත සමච්චල් සහගත කටහඬ පංතිය පුරාම පැතිර ගියේ ය.

'හිලරි ඔයාට ගෞරවනීය කියන කෑල්ල කියන්න අමතක වුනා. ගෞරවනීය ඇන්ජෙලා ෆෙවර්ලීග්. අන්න එහෙම තමයි ඔයා ඇන්ජෙලා ට කථා කරන්න ඕනෑ.'

' කටවහ ගන්න කාලෝටා.'

හිලරි සැරෙන් මෙන් කාලෝටා ට කීවා ය. ඒ සමඟම ඇන්ජෙලාගේ ලස්සන මුහුණ කෝපයෙන් කළු වූයේය. ඈ තම හිස ගස්සා ගෙන කාමරයෙන් පිටව ගියා ය. කාලෝටා ගේ තියුණු වචන වලට මුහුණ දෙන්නට තරම් තමාගේ ලස්සන සහ ධනවත් කම ශක්තිමත් නොවන බව ඇන්ජෙලා දැන් වටහා ගෙන ඇති බවකි. ඇය පාසලේම සිටින ලස්සනම සහ ධනවත්ම ගැහැණු ළමයා ය. එහෙත් කාලෝටා තමාගේ තියුණු වදන් වලින් ඇන්ජෙලා ට නිරතුරුවම පහර දෙන්නීය.

' මේ ඉන්නේ පැම්. අපේ පංතියේ ඉන්න හොඳම මොල කාරි.'

හිලරි කීවා ය. විශාල කණ්නාඩි දෙකක් දමාගෙන සිටින ලැජ්ජාශීලි ගැහැණු ළමයා පැම් යාන්තමට සිනාසුනා ය.

' මෙයා ගොඩාක් මහන්සි වෙලා ඉගෙන ගන්නවා. හැබැයි කාටවත් මෙයාව නතර කරන්න නම් ලැබෙන්නේ නෑ.'

කිසිවෙකු පංති කාමරයේ දොරෙන් ඇතුළට එබුනේ ඒ වෙලාවේදී ය. ඒ ක්ලෝඩින් ය. මැඩමොසෙල් තවමත් පංතියේ සිටිනවා දැයි සැකයෙන් යුතුව ක්ලෝඩින් වටපිට බලද්දී කාලෝටා මෙසේ කීවා ය.

' බයවෙන්න එපා ක්ලෝඩින්. මැඩමොසෙල් නෑ. හැබැයි

Scanned with CamScanner

sinhalaebooks.com


එයා තවමත් ඔයාව හොයනවා කියලා නම් සහතිකයි. ඈන් මාරි ගුණ් ඉන්නේ ක්ලෝඩින්. අපේ පංතියේ ඉන්න නරකම කෙල්ල එයාට කැමැති දේවල් විතරයි එයා කරන්නේ. අනිත තමන් ට හිතෙන ඕනෑම දෙයක් කරන්නත් එයා පරක්කු වෙන්නේ නෑ. ඔයා දන්නවද ? එයා ඉංග්‍රිසි අයගේ තියෙන ආත්ම ගරුත්වය ගැන තමයි මේ දවස්වල හොයන්නේ. අනේ එයාට තවම නම් ඒක හොයාගන්න ලැබුනේ නෑ.'

' අනේ ඔයා නම් හරිම නරක ළමයෙක් කලෝටා. ඔයා හැමවෙලාවෙම මාව විහිළුවකට ගන්නවා. ඇත්තම කියනවා නම් මම ගොඩාක් හොද කෙනෙක් නෙමෙයි. ඒ වගේම නරක ළමයෙකුත් නෙමෙයි.'

මිරාබෙල් සහ ග්ලැඩිස් හිලරි විසින් ඈන් මාරිට හඳුන්වා දුන්නා ය. එමෙන්ම කළකට පෙර ඇන්ජෙලා සමඟ හරි හරියට තරඟ කොට හොද පාඩමක් ඉගෙන ගත් එහෙත් දැන් ඉතාම හොද ගැහැණු ළමයෙක් බවට පරිවර්තනය වී සිටින පෝලීන් ව හඳුනාගන්නට ද ඈන් මාරි ට හැකි විය.

' දැනට ඉන්නේ එච්චරයි. මේ අයට අමතරව හතර වසරේ ඉදලා අපේ පංතියට උසස් වෙලා එන ෆෙලිසිටි ඉන්නවා. එයා සංගීතයට හරිම දක්ෂ ළමයෙක්. ඒත් ෆෙලිසිටි තවම ඇවිත් නෑ. එතකොට හය වැනි වසර පංතියේ ඉදන් අපේ පංතියට ආපු අල්මා පුඩිං කියලා ළමයෙකුත් ඉන්නවා. හැබැයි එයත් මම තවම දැක්කේ නෑ. අනිත් එක තමයි ඔයා හරිම අපූරු ළමයෙක් කියලා මට හිතෙනවා. එහෙම නේද ඈන් මාරි ?.'

' සමහර විට වෙන්න ඇති. ඒ වුනත් මට කවි ලියන්න පුළුවන්.'

ඈන් මාරි ලැජ්ජාවෙන් රතුවූ මුහුණෙන් යුතුව ළමයින් දෙසට හැරී කීවා ය. ඉන්පසුව කාමරය පුරා පැතිර ගියේ දැඩි

Scanned with CamScanner

sinhalaebooks.com



නිහඬතාවයකි. ඈන් මාරි කියන්නේ කුමක් ද ?. සෑහෙන වෙලාවකට පසුව කථා කළේ බොබී ය.

' ඔයා කියන්නේ මොකක් ද ?. ඔයා කවි ලියනවා කියලද මේ කියන්නේ ? ෂා නියමයි නේ. අනේ අපිටත් කවි ලියන හැටි කියල දෙන්න කෝ.'

' කිසිම කෙනෙකුට කවි ලියන හැටි උගන්වන්න බෑ. කවියෙක් වෙන්නේ උපතින්. ඔයා දන්නවද මගේ සීයා ප්‍රසිද්ධ කවියෙක්. එතකොට ආච්චි ප්‍රසිද්ධ ලේඛිකාවක්. ඇත්තටම මගේ පවුලේ හැම දෙනාම කලා කාරයෝ. ඉතින් මට ත් ඒ ආභාෂය ලැබුනා. ඇත්තටම මමත් ගොඩාක් කවි ලියනවා. ඒවා ගොඩාක් වෙලාවට ලියන්නේ මහ රෑ.'

ඈන් මාරි ආඩම්බරයෙන් මෙන් කියද්දි බොබී නැවතත් ඇයට බාධා කළා ය.

' අනේ අපිට කියලා දෙන්නකෝ. සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලේ සිද්ධ වුන හරිම ලස්සන දේවල් ගැන අපි දන්නවා. මම කවියෙක් නොවෙන හින්දා ඒ දේවල් ලස්සනට ලියන්න බෑ. කොහොම වුනත් ඔය යි ෆෙලිසිටි යි දෙන්නා එකම කාමරේකට වැටුනොත් නම් නියමයි. එතකොට දෙන්නටම මහ රෑ නැගිටින්න පුළුවන්. ෆෙලිසිටි සිංදුවක් පුරුදු වෙන කොට ඔයාට පුළුවන් කවියක් ලියන්න. ඇත්තටම ඔයාලා දෙන්න නම් හරියට ගැළපෙන ජෝඩුවක්.'

ඒ සමඟම තවත් ගැහැණු ළමයෙක් කාමරයට හිස ඇතුළු කළා ය. ඒ සමඟ තිවුන් සොයුරියෝ හයියෙන් බෙරිහන් දුන් හ.

' ඒයි ඇලිසන්. ඔයා කොහෙද ගියේ ?. මෙහාට එන්න ඉක්මනට. ඇවිත් අපේ කවියා හඳුනාගන්නා.'

'ප්‍රිය මනාප එමෙන්ම හුරුබුහුටි ගැහැණු ළමයා පංතියට ඇතුළු වූවා ය. ඒ ඇලිසන් ය.

Scanned with CamScanner

sinhalaebooks.com



'මේ ඉන්නේ ඇලිසන්. අපේ පංතියේ හරිම සැහැල්ලුවෙන් ඉන්න ගැහැණු ළමයා. ඔයාගේ ලස්සන කොණ්ඩෙටත් දිලිසෙන නහයටත් ගොඩාක් ස්තූතියි.....'

පැට් එසේ කියද්දි ඇලිසන් කෝපයෙන් රවා අහක බලා ගත්තාය. මෙය වසර දෙකකට පෙර නම් නිසැකවම ඇගේ දෑස් වලින් කඳුළු ගලා යනු ඇත. එහෙත් දැන් ඇලිසන් ගේ හිත දැඩි වෙලාය. ඕනෑම විහිළුවක් නොහඬා දරාගන්නට තරම් හැකියාවක් දැන් ඇයට ඇත. ඒ නිසා ඇලිසන් හිස සොලවා ඈන් මාරි දෙස විමසිලිමත් බැල්මක් යොමු කළා ය.

'ක්ලෝඩින්. පරෙස්සම් වුනොත් හොඳයි. ඔන්න ඔයාගේ නැන්දා මැඩමොසෙල් පැසේජ් එක දිගේ එනවා.'

ක්ලෝඩින් කළබල වි වටපිට බැලුවද ඈ ප්‍රමාද වැඩිය. මැඩමොසෙල් දැන් ළඟටම ඇවිත් ය. ඒ නිසාම හිලරි ඇයට මෙසේ කීවා ය.

'ඔයාට දැන් පැනලා යන්න අමාරුයි ක්ලෝඩින්. ඒ වුනත් ඔයා ගිහිං මැඩමොසෙල් හම්බ වෙන එක හොඳයි. එයා ඔයාට හරිම ආදරෙයි. ඒ නිසා ඔයා දැක්කම මැඩමොසෙල් ට ගොඩාක් සතුටු හිතෙයි.'

ඒ සමඟම මැඩමොසෙල් පංති කාමරයට කඩා වැදුනා ය. ක්ලෝඩින් දුටු වහාම ඈ සතුටෙන් එතැනට දුව ගියා ය.

' අනේ මගේ පුංචි ක්ලෝඩින්. ඔයාට කොහොමද ?. ඔයාගේ අම්මයි තාත්තයි දෙන්නා සනීපෙන් ඉන්නවද ?. එතකොට පවුලේ අනිත් අය. පුංචි ඈන්ටනට් නම් ඇවිත් ඉන්නවා මම දැක්කා. අනේ දෙයියනේ ඒ ළමයා මොන තරම් කළබල වෙලාද කියලා මට දැකපු ගමන්ම හිතුනා. එකෙ නෙවෙයි මම ළඟ ඔයාලා දෙන්නටම ඇති වෙන්න කේක් තියෙනවා. ඉතින් ඉක්මනට ආවොත් අපි ඔක්කොටම එකතු වෙලා කේක් කෑල්ලක් කාලා හොඳ තේ එකක්

Scanned with CamScanner

බොන්න පුළුවන් වෙයි.'

මැඩමොසෙල් ගේ කථාව අසා සිටි ක්ලෝඩින් ඉක්මනින් ම ඇය සමඟ යන්නට සූදානම් වූවා ය. අනින් ගැහැණු ළමයින්ට සිනාව නවතා ගන්නට අපහසු වූවාක් මෙනි.

'ක්ලෝඩින් පස් වැනි වසරේ ළමයෙක් කියලා හිතාගන්නත් අමාරුයි. මොනව වුනත් ඉස්කෝලේ ඉහළ පංතිවලට යනකොට එයා ජීවිතේ අළුත් පිටුවක් පෙරලයි කියලා මට සහතිකයි.'

එහෙත් ක්ලෝඩින් කරන්නේ කුමක් දැයි කිසිවෙකුටත් විශ්වාස කළ නොහැකි ය. ඇය නිතරම ගමන් කරන්නේ තමන් කැමැති මාර්ගය ඔස්සේ ය. තමන් කැමැති දේ කිරීම ඇයට සතුටකි. මෙවැනි දේවල් ගැන කල්පනා කිරීමේදී ක්ලෝඩින් මොන තරම් අපූරු ළමයෙක් දැයි කිසිවෙකුටවත් සිතාගත නොහැකි ය.

sinhalaebooks.com

# හැම දෙනාටම අපූරු කාමරයක්

සෙන්ට් ක්ලෙයාර් පාසලේ අපූරු නීතියක් ඇත. පාසලේ පස් වැනි වසරට සමත් වෙන සෑම ගැහැණු ළමයෙකුටම වෙන වෙනම කාමරයක් බැගින් ලබාදීම එම අපූරු නීතියයි. පස් වැනි වසරේ ගෙවන වාර දෙකක කාලය පුරාම ඒ කාමරය තව ළමයෙකුත් සමඟ හවුලේ පරිහරණය කිරීමේ අවස්ථාව සෑම ළමයෙකුටම ලැබේ. ඇත්තෙන්ම මේ කුඩා කාමර ඉතාම ලස්සනය. තමන් කැමැති ආකාරයට එම කාමර සකස් කරගැනීමේ අවස්ථාවද ගැහැණු ළමයින් ට ලැබේ. මේසයක්. පුටු දෙකක්. ඇඳ ඇතිරිලි සහ කබඩයක් බැගින් සෑම කාමරයකම තිබේ.

එහෙත් සෑම ගැහැණු ළමයෙක්ම තමන් කැමැති පින්තූරයක් හෝ දෙකක් කාමරයේ එල්ලන්නට ද අමතක නොකරති. තමන්ගේ මල් වාස් ගෙනවිත් තබාගෙන ඒවාට මල් දමන්නටද. තමන්ගේ පුද්ගලික ඇද ඇතිරිලි මේස රෙදි ආදිය රැගෙන එන්නටත් බොහෝ

Scanned with CamScanner

sinhalaebooks.com



ගැහැණු ළමෝ අමතක නොකරති. සමහර ළමයින් තම තමන්ගේ නිවෙස් වලින් පුටු. ඇඳ ඇතිරිලි. ඔර්ලෝසු ආදියත් රැගෙන එති.

සෑම ගැහැණු ළමයෙකුටම තමන් ගේ කාමරය පරිහරණය කරන්නට කැමැති යෙහෙළියක් තෝරාගත හැකිය. ඇත්තෙන්ම එය ඉතාම බරපතල කාර්යයක් නොවේ. මේ වනවිට පංතියේ සෑම දෙනාම තම තමන්ගේ හොඳම යෙහෙළියන් තෝරාගෙන අවසන් ය. ඇත්තෙන්ම හතර වසර පංතියේදීම පාඩම් කාමර එකට පරිහරණය කරන්නට හොඳ යෙහෙළියක් තෝරා ගැනීම සෙන්ට් ක්ලෙයාර් පාසලේ ගැහැණු ළමයින් අතර තිබෙන සිරිතකි.

පාඩම් කාමර සකස් කිරීම ද සෑම දෙනාටම සතුට ගෙන දෙන අපූරු ක්‍රියාකාරකමකි. මුලින්ම කළ යුත්තේ කාමරය පරිහරණය කරන ගැහැණු ළමුන් දෙදෙනා ගොස් මේට්‍රන් වරිය හමුවීමයි. ඉන්පසුව මේට්‍රන් වරිය මෙවැනි වචන පෙළකින් එම ගැහැණු ළමයින්ට සංග්‍රහ කරනු නො අනුමානය.

'ෂා... හරිම අපූරුයි. ඔයාලා දෙන්නද පාඩම් කාමරේ එකට ඉන්නේ ?. පළමු වසර පංතියට ආපු දවස්වල ඉඳලම ඔයාලා දෙන්න ඒ ගැන කල්පනා කළා ද ?. කමක් නෑ. දැන් ඉතින් ඔයාලගෙන් මට කරදරයක් නැතිවුනොත් ඒ හොඳටම ඇති.'

නිවුන් සොයුරියන් දෙදෙනා වන පැට් සහ ඉසබෙල් එක කාමරයක් පරිහරණය කරන්නට සූදානම් වූහ. මිරාබෙල් සහ ග්ලැඩිස් තවත් කාමරයකට ගියහ. ඇන්ජෙලා සහ ඇලිසන් තවත් කාමරයකට යන්නට සූදානම් වූහ. මේ සෑම ගැහැණු ළමයෙක් ම බොහෝ කාලයක සිට අඹ යහළුවන් ලෙස කටයුතු කළ අයයි. ඒ නිසා අළුත් පාඩම් කාමරවලට යනවිටත් ඔවුන් ගේ යහළුකම නොවෙනස් ව ඇත.

'කිසිම සැකයක් නෑ. ඔයාලගේ කාමරේ පුරාම මුහුණ බලන කණ්නාඩි නම් කිසිම අඩුවක් නැතිව තියෙයි කියලා මට හිතෙනවා.'

බොබී. ඇලිසන් ට කීවාය. ඇලිසන් සෑම වෙලාවකම

Scanned with CamScanner

කණ්නාඩියකින් මුහුණ බැලීම පුරුද්දක් වශයෙන් කරන දෙයකි. බොබී ඇලිසන්ට එවැනි විහිළුවක් කළේ ඒ නිසා ය. සෑම අවස්ථාවකදීම තම හිසකෙස් ද අපූරුවට සකස් කරගන්නට ද ඇලිසන් අමතක කරන්නේ නැත.

බොබී සහ ජැනට් එක පාඩම් කාමරයක් පරිහරණය කරන්නට තීරණය කළ හ. හරිම අපූරු විහිළු ඉදිරිපත් කරන්නට ඔවුන් දෙදෙනාම දක්වන්නේ පුදුම සහගත දක්ෂකමකි. ඒ නිසා අනාගතයේදී ඔවුන් ගේ පාඩම් කාමරයෙන් මොන ආකාරයේ විහිළු රැසක් උපදිනු ඇති දැයි කිසිවෙකුටත් සිතාගත නොහැකි ය.

සෑම දෙනාම කාමර බෙදා හදා ගත්ත ද එකිනෙකාට නොගැළපෙන ගැහැණු ළමුන් දෙදෙනෙක් ද එකම කාමරයක් පරිහරණය කරන්නට සූදානම් වෙන බව ළමුන් සෑම දෙනෙක්ම දැනගෙන සිටිති. ඔවුන් දෙදෙනා නම් පැම් බෝඩ්මන් සහ ඩොරිස් එඩ්වඩ් ය. පැම් ඉතාම දක්ෂ නුවණක්කාර සිසුවියකි. ඩොරිස් සැමදාම පංතියේ අන්තිමයා වන අදක්ෂ සිසුවියයි. ඕනෑම කෙනෙක් අනුකරණය කරන්නට දක්ෂ වුවද ඩොරිස් හට සාමාන්‍ය පාඩමක් වත් මතක නැත. එහෙත් පැම් සහ ඩොරිස් එකම කාමරයේ සිටින එක ඩොරිස් ගේ වාසනාවට සිදු වූවා විය හැකිය. පැම් එක කාලයකදී සෙන්ට් ක්ලෙයාර් පාසලෙන් අස්ව ගියා ය. එහෙත් වැඩි දවසක් ගතවෙන්නට පෙර ඇයව නැවතත් පාසලට ගෙනවිත් ඇරලන්නට පැම් ගේ දෙමාපියන් ට සිදුවිය.

පැම් පාසලේ දි නිරතුරුවම හුදකලාව, සිටින ගැහැණු ළමයෙකි. මෙතෙක් දිනක් ඇයට කිසිම යෙහෙළියක් සිටියේද නැත. ඒ නිසා ඩොරිස් සමඟ එකම කාමරය පරිහරණය කරන්නට ඇය ඉදිරිපත් වූයේ ඉතා ආශාවෙනි. විශාල කණ්නාඩි යුවලක් පැළඳ සිටින පැම් ගේ හැසිරීම අනුකරණය කරන ඩොරිස්. පැම් ගේ මුහුණ සිනාවෙන් පුරවන්නී ය. ඒ නිසා පැම්. ඩොරිස් ගේ ඇසුර ප්‍රිය කරන්නී ය.

'කාලෝටා කාගේ කාමරේද ඉන්නේ ?' සමහර විට ඔයා හිලරී එක්ක ඉන්නවා වෙන්න පුළුවන් ඒ දෙන්නා හරිම යාළුවෝ'

එසේ කීවෙ පැට් ය. එහෙත් එවැනි දෙයක් සිදුවූයේ නැත. හිලරි පංති නායිකාවයි. ඒ නිසා ඈයට තනියම එක පාඩම් කාමරයක් පරිහරණය කිරීමේ සුවිශේෂ වරප්‍රසාදය හිමිවෙයි. ඒ නිසා කාලෝටා ට හිලරිගේ කාමරය පරිහරණය කරන්නට අවස්ථාවක් ලැබුනේ නැත. ඒ නිසා ඇය ක්ලෝඩින් ව තම කාමර සහායිකාව් වශයෙන් තෝරාගත්තා ය. මේ තෝරා ගැනීම ගැන මෙට්‍රන්වරිය කථා කළේ සැකයෙනි.

'ඔයාලා දෙන්න ළඟම ගොඩාක් නරක හැසිරීම් තියෙනවා කියලා මම දන්නවා. ඉතින් ඔයාලා දෙන්න එක කාමරේක ඉන්න එක ගැන මට නම් ඇත්තටම බය හිතෙනවා. හැබැයි එකක් මතක තියාගන්න ඕනෑ. කාමරේ තියෙන කිසිම ගෘහ භාණ්ඩයක් කඩන්න නම් එපා. අනික කිසිම නපුරු වැඩක් කළා කියලා මට දැන ගන්න ඉඩ තියන්නත් එපා. එහෙම වුනොත් හතරූ වසර පංතියේ විවේක කාමරේට තමයි ඔයාලට යන්න වෙන්නේ. තේරුනාද ළමයි ?.'

' අනේ මෙට්‍රන්. අපි ඒ තරම් නපුරුයි කියලා ඔයා කොහොමද හිතන්නේ ?.'

ක්ලෝඩින් තමාගේ සුපුරුදු අහිංසක පෙනුම මුහුණට එක් කර ගන්නා ගමන් ම ඇසුවා ය.

' ඔයා දන්නවද ?. මෙට්‍රන්. අපි කාමරේ ගොඩාක් ලස්සනට තියාගන්නවා. ඇත්තටම බලන්න ආසා හිතෙන ලස්සනට. මම නිවාඩුවට ගෙදර ගියාට පස්සේ එම්බ්‍රොයිඩර් කරලා ඇඳ ඇතිරිලි දෙකක් ම මැහුවා. එතකොට ලස්සන කුෂන් කවර තුනකුත් තියෙනවා. ඒවායින් කාමරේ ලස්සන කරන්න අපිට පුළුවන්.'

ඈන් මාරි සහ ෆෙලිසිටි එකම කාමරයක් පරිහරණය කරන්නට සූදානම් වූහ. ෆෙලිසිටි පාසලේ සිටි ගැහැණු ළමයෙකි.

sinhalaebooks.com



එහෙත් ඇත් මාරි අළුත් ගැහැණු ළමයෙකි. ඒ නිසා ඔවුන් දෙදෙනා එකම කාමරයක සිටිනවාට මේට්‍රන් ගේ එතරම් කැමැත්තක් තිබුනේ නැත.

' අති දක්ෂයෝ දෙන්නෙක් එකම කාමරේක. කිසිම සැකයක් නෑ මේ දෙන්නා මහ රෑ නැගිටලා කවි ලියයි. සිංදු පුරුදු වෙයි.'

බොබී හයියෙන් සිනාසෙන ගමන් සියල්ලන්ටම ඇසෙන්නට කීවා ය.

එසේ වුවද තමන්ගේ කාමරයට එන ලෙස කිසිවෙකුත් පෝලීන්ට ආරාධනා කළේ නැත. එවැනි දෙයක් අසන්නටවත් යහළුවෙක් ඇයට සිටියේ නැත. ඇත්තෙන්ම පෝලීන් සමඟ යහළු වන්නට කිසිම ළමයෙක් කැමැති නැත. මෙයට පෙර බොරු පුරාජේරු කථා කියා පෝලීන් කළ රඟපෑම නිසා ගැහැණු ළමයින් කිසිවෙකුත් ඇයට කැමැති නැත. ඒ නිසා ඇය කටුව තුළ සැඟවෙන ගොළුබෙල්ලෙක් සේ ඇය නිහඬ. නිසසල ගැහැණු ළමයෙක් බවට පත් වූවාය.

' පෝලීන්. ඔයා අල්මා පුඩිං එක්ක එක කාමරේකට ගියොත් හොඳයි කියලා මට හිතෙනවා. දැන් ඉතින් ඔයාලා දෙන්නා විතරයි ඉතිරි වෙලා ඉන්නේ.'

මේට්‍රන් වරිය පෝලීන් ට කීවා ය. 'අනේ ' පෝලීන් ට ඉබේටම කියවුනේ ය. ඇගේ මුහුණ දුකෙන් පරවෙලා ය. පාසලේ සෑම දෙනාම මෙන් ඇයද අල්මා පුඩිං ට කැමැති නැත. ඇය ඉතාම මහත. ප්‍රිය මනාප පෙනුමක් නැති. ඉක්මනින්ම කේන්ති යන ගැහැණු ළමයෙකි. එවැනි ගැහැණු ළමයෙක් සමඟ එකම කාමරයක සිටින්නට කැමැති වන්නේ කවුද ?.

' හොඳයි... දැන් ඉතින් ඔයාලා හැම දෙනාම මම කියන දේවල් ගැන අහන්න.'

තමා ඉදිරියේ තිබූ විශාල පොත වසා දමන ගමන් මේට්‍රන්

Scanned with CamScanner

sinhalaebooks.com



කීවා ය.

'පාඩම් කාමර වල තියෙන නීති රීති ගැන ඔයාලා දන්නව නේද ? කැම කාමරේට යන්න අකැමැති නම් ඔයාලගේ තේ කාමරේ ඇතුලෙම හදාගන්න පුළුවන්. අනිත් එක තමයි ඔයාලගේ පොඩි පොඩි වැඩ කරගන්න පළමු සහ දෙවැනි වසර වල ළමයින්ව ගෙන්නා ගන්නත් අවසර තියෙනවා. හැමදාම හවස් වරුවට ඔයාලගේ කාමරේ අස්පස් කරන්නත් සිද්ධ වෙන්නේ ඔයාලටමයි. අනිත් කාරණේ තමයි රෑ දහය පහු වුනාට පස්සේ කැමැති වෙලාවක නිදාගන්න යන්නත් ඔයාලට පුළුවන්.'

ගැහැණු ළමයින් ගේ සිත්වලට කිසියම් නිදහස් බවක් දැනේ. දැන් ඔවුන්ටම වෙන්වූ අපූරු පාඩම් කාමරයක් බැගින් තිබේ. එම කාමරය තමන් කැමැති ලෙස අලංකාර කරන්නටත්. ශීත කාලයේදී කාමරය තුළ ඇති ගිණි උදුන දල්වා ගන්නටත් දැන් ඔවුන්ට කිසිම බාධාවක් නැත.

ඇන්ජෙලා තමාගේ පාඩම් කාමරය කුඩා මාළිගාවක් ලෙසට සකස් කරන්නට උත්සාහ කළා ය. එහි මුල්ම පියවර වශයෙන් ඈ පාසලෙන් ලැබුන සෑම ගෘහ භාණ්ඩයක්ම තම පාඩම් කාමරයෙන් ඉවත් කළා ය. ඉන්පසුව ඈ මවට ලිපියක් මගින් දන්වා සිටියේ නිවසින් හොඳම ගෘහ භාණ්ඩ ටිකක් එවන ලෙසටයි. ඉන්පසුව ඇන්ජෙලා ඇලිසන් සමඟ අසල නගරයට ගියා ය. ඉස්තරම් වර්ගයේ කුෂන් කවර. දොර රෙදි. සහ තවත් බොහෝ දේ ගන්නට ඔවුන් දෙදෙනා දවසක් ම ගත කළහ.

මේ සෑම දෙයක්ම සඳහා ඇන්ජෙලා මහා විශාල මුදලක් වියදම් කලා ය. ඇලිසන්ට නම් වියදම් කරන්නට මුදල් තිබුනේ නැත. එහෙත් නිවාඩු කාලයේදී ඇන්ජෙලා ගේ මාමලා සහ නැන්දලා ඇයට දුන් මුදල් එම වියදම් පිරිමසා ගන්නට හොඳටම ප්‍රමාණවත් ය. එමෙන්ම තමන් ගේ පාඩම් කාමරය සකස් කොට අවසන් වෙන

Scanned with CamScanner

sinhalaebooks.com



හෝ කිසිවෙකුටත් කාමරයට පැත්තටවත් එන්නට ඇලිසන් හෝ ඇන්ජෙලා ඉඩ දුන්නේ නැත.

මේ සියල්ල අවසානයේදී ඇන්ජෙලා සහ ඇලිසන් කේක් සහ සැන්ඩවිච් තොගයක් ඇනවුම් කළ හ. ලෙමනේඩ් සහ ජින්ජර් බියර් ද ඇති තරම් තිබුනේ ය. පාඩම් කාමරයේ මේසය කෑම වර්ග වලින් පිරෙද්දී ඇන්ජෙලා සහ ඇලිසන් අනිත් ගැහැණු ළමයින්ට තම කාමරයට එන ලෙසට ආරාධනා කළ හ. කාමරයේ කොනක ඇති ගිණි උදුන ද උණුසුම් ව දැල්වෙයි.

ඇන්ජෙලා ගේ සහ ඇලිසන් ගේ පාඩම් කාමරයට රොක් වූ ගැහැණු ළමෝ පුදුම්යෙන් වට පිට බලන්නට වූහ. කාමරයේ ඇති සෑම ගෘහ භාණ්ඩයක්ම මනාව ඔප දමා ඇත. අලංකාර කණ්නාඩි සහ පින්තූර සෑම තැනම එල්ලා තිබේ. ජනෙල්වලට එල්ලා ඇති සිනිඳු සේද තිර අල්ලා බලන්නටත් ගැහැණු ළමෝ අමතක නොකළ හ. ඒවා ඉතාම වටිනා ඒවා ය. කාමරයේ සෑම තැනම තබා තිබෙන වාස් වල අලංකාර ක්‍රිසන්තිමම් මල් පිරී ඇත.

' හැම දෙයක්ම හොඳයි. හැබැයි මේට්‍රන් මේ දේවල් දකින කම් ඔයාලට කිසිම කරදරයක් වෙන්නේ නෑ. මේට්‍රන් ඔයාගේ කාමරේ දැකපු ගමන් ගිහිං ප්‍රින්සිපල්ට කියයි. අනික ඔයා කාමරේ ලස්සන කරන්නත් සෑහෙන්න වියදම් කරලනේ ඇන්ජෙලා.'

ඔවුන් අතර තිබූ නිහඬතාවය කඩා දමා මුලින්ම කථා කළේ බොබී ය. එයට ඇන්ජෙලා ගේ නොමනාපය විගසින් ම පළ විය.

' මේට්‍රන්ට කළබල වෙන්න තරම් දෙයක් මම කරලා නෑ. අනිත් එක තමයි මේ ඉස්කෝලේ තියෙන සැප පහසුකම් මටත් ඇලිසන්ටත් ගැළපෙන්නේ නෑ. අනික අපි ගෙවල් වලදී මෙය වඩා සතුටින් ඉන්නවා. අන්න ඒ නිසයි අපේ පාඩම් කාමරේ ටිකක් සුව පහසු විදිහට හදාගත්තේ. ඔයා ඒකට කැමැති නැද්ද බොබී ?.'

' ඇයි නැත්තේ. හැබැයි මට නම් ඔයාගේ වැඩේ ගොඩාක්

Scanned with CamScanner

sinhalaebooks.com



සෝබන වැඩක් වගෙයි පෙනෙන්නේ. ඔයා දන්නවනේ මම හරිම සරල කෙනෙක් කියලා. ඒ මොනව වුනත් ඔයා හරිම ලස්සනට කාමරය සකස් කරලා තියෙනවා ඇන්ජෙලා. අනිත් එක තමයි තේ පැන් සංග්‍රහයත් හරිම අනර්ඝයි.'

අනිත් ගැහැණු ළමයින් ද තම තමන්ගේ පාඩම් කාමර හැකි පමණ ලස්සනට සකස් කරන්නට උත්සාහ කළ හ. ක්ලෝඩින් තමන් ගෙනා අලංකාර එම්බ්‍රොයිඩර් මේස රෙදි සහ කුෂන් කවර වලින් කාමරය අලංකාර කළා ය. එයට අමතරව ස්පාඤ්ඤයෙන් ගෙනා තද රතු පැහැති සිල්ක් තිර රෙද්දක් ද ක්ලෝඩින් විසින් කාමරයේ අලංකාර ය සඳහා එල්ලුවා ය.

සෑම ගැහැණු ළමයෙක්ම තම තමන්ට හැකි ආකාරයෙන් කාමර අලංකාර කරගන්නටද උත්සාහ කළද අල්මා සහ පෝලීන් ගේ කාමරවල කිසිම වෙනසක් තිබුනේ නැත. ඔවුන්ගේ කාමරය හිස් සහ පාළු ස්වභාවයක් ගත්තේ ය. කාමරය අලංකාර කරන්නට අවශ්‍ය දේවල් ගන්නට තරම් ඔවුන් අතේ මුදල් තිබුනේ ද නැත. එහෙත් පෝලීන් තද නිල් පැහැති මල් පෝච්චියක් මේසය මත තබා තිබුනා ය. එහෙත් ඔවුන්ගේ පාඩම් කාමරය පාසල් නිවාඩු කාලය මෙන් පාළුවෙන් වැසී ගොස් ඇති බව ළමයින්ට පෙනේ.

සත්තකින්ම අල්මා පුඩිං යන නම මොන තරම් වෙනස් නමක් ද?. ඇය පෙනුමෙන්ද පුඩිමක් මෙනි. පාසල් ඇඳුම ඇගේ විශාල ශරීරය වටා තදින් එති තිබෙන්නාක් මෙනි. එමෙන්ම කිසිම ප්‍රිය මනාප බවක් නැති රවුම් මුහුණේ දෙකෙලවර ඇගේ දෑස ගිලී තිබේ.

පස් වැනි වසරේ ගැහැණු ළමයින් අල්මා හඳුන්වන ආරූඪ නාමය වූයේ ද පුඩිං යන්නයි. එයට අල්මා දක්වන්නේ ඉමහත් නොකැමැත්තකි. සමහර වෙලාවට අල්මා කෝපයෙන් මෙසේ කියන්නී ය. ' මම පුඩිමක් වගේ තමයි. හැබැයි වැඩි දවසක් යන්න

Scanned with CamScanner

sinhalaebooks.com



ඉස්සර වෙලා මම කෙට්වු වෙයි.' අල්මා ක්ෂේත්‍රියෙන් කියන මෙවැනි වදන් ගැහැණු ළමයින් ට නිතර අසාගත හැකිය.

සත්තකින්ම අල්මා හට තිබුනේ අපූරු චරිත ස්වභාවයකි. කාලෝවා ට සහ ජැනට් හට මෙන් ඇයද බොහෝ ඉක්මනින්ම කෝපවෙයි. එහෙත් එම කෝපය වැඩි වෙලාවක් ඇගේ සිතේ තිබෙන්නේ නැත. ඉක්මනින්ම නිවී යයි.

අල්මා සමඟ එකම කාමරයේ විසීම මොන තරම් අමාරු වැඩක් ද යන බව පෝලින් ට වටහා ගන්නට එතරම් දවසක් ගියේ නැත. අල්මා වෙතින් කිසිම ආකාරයක දක්ෂ කමක් හෝ කඩිසර කමක් දැකගත නොහැකි ය. කාමරය අස්පස් කිරීමේ වගකීම නිතරම පැටවෙන්නේ පෝලින් ගේ කරපිටයි. එ පමණක් නොව අල්මා ආත්මාර්ථ ගති ඇති ළමයෙකි. ඇය නිතරම වඩා සුව පහසු පුටුව ලබාගන්නට ගන්නට පෝලීන් සමඟ තරග වදියි. තේ වෙලාවෙදි නිතරම ලොකු කේක් කැබැල්ල ඩැහැ ගන්නේ ද අල්මා ය.

ඈන් මාරි සහ ෆෙලිසිටි ද එකම කාමරයේ ඉන්නට අපහසුවෙන් මෙන් හැඩ ගැසෙන ආකාරය ළමයින්ට දැක ගත හැකිය. ෆෙලිසිටි ට සංගීතයෙන් තොර වෙනත් ලොවක් නැත. ඇ බොහෝ අවස්ථාවලදි සිංදුවක් තෙපලන්නීය. නැතිනම් වයලීනයෙන් කිසියම් තාලයක් වාදනය කරන්නී ය. එහෙත් ඈන් මාරි ට ලියන්නට ඇවැසිය.

'ෆෙලිසිටි. ඔයා අර ජරා සිංදුව ආයෙමත් වාදනය කරන්න පටන්ගත්ත ද?. මම මේ කවියේ අන්තිම පදය ලියන්න පටන්ගත්තා විතරයි.'

එක් දිනක් ඈන් මාරි අමනාපයෙන් කීවා ය. ඇයට ෆෙලිසිටිගෙන් ලැබුනේ සමච්චල් සහගත උත්තරයකි.

' මොන කවිය ද ?. ඔයා අර සතියක් තිස්සේ ලියන එක ද?. දෙයියනේ ඒක මොන තරම් නරක කවියක්ද කියලා ඔයාට.

Scanned with CamScanner

sinhalaebooks.com



පේරෙන්නේ නැති හැටි. ඒකේ වචන වලයි. අදහසෙයි කිසිම තේරුමක් නෑ. අනිත් එක තමයි ඇත් මාරි ඔයාට කවි ලියන්න බෑ. ඉතින් ඔයා වගේ තුන් වැනි පංතියේ කවියෙක් හින්දා මගේ අපූරු සිංදුව නතර කරගන්න එක අපරාදයක් කියලා මට හිතෙනවා.'

ඇත්තෙන්ම ෆෙලිසිටි නපුරු එමෙන්ම අකාරුණික ළමයෙක් නොවේ. බොබ් කියන ආකාරයට ඇය තම සංගීත හැකියාව ගැන නිහඬවම ආඩම්බර වන ළමයෙකි. එමෙන්ම ෆෙලිසිටි මේ දිනවල ඉතාම අමාරු සංගීත විභාගයක් සඳහා ද සූදානම් වන්නී ය. ෆෙලිසිටිගේ වයස හා සසඳා බලන කළ ඒ විභාගය ඇයට කෙසේවත් ගැළපෙන්නේ නැත. විදුහල්පතිනිය ද ඇය එම අපහසු විභාගයට පෙනී සිටිනවාට කැමැත්තක් නොදැක්වූවා ය. ෆෙලිසිටි ගේ දෙමාපියන් ද කැඳවා ඒ ගැන කථා කරන්නට විදුහල්පතිනිය අමතක නොකළා ය.

' මේ ළමයා වැඩෙන්නේ එක පැත්තකින් විතරයි.'

ඊළඟ දිනයේ පාසලට ආ ෆෙලිසිටිගේ දෙමාපියන් සමඟ කථාව ආරම්භ කළ මිස් තියෝබෝල්ඩ් එසේ කීවා ය.

' සමහර වෙලාවට මට හිතෙනවා එයා මේ ලෝකේ ජීවත් වෙන ළමයෙක් නෙවෙයි ද කියලත්. ඇත්තටම ෆෙලිසිටි වගේ තරුණ ළමයෙකුට ඒක එච්චර හොඳ දෙයක් නෙවෙයි. ඇත්තටම එයා හතර වසර පංතියේ ඉගෙන ගන්න වයස වැඩි ළමයෙක්. ඒ වගේම පස් වැනි වසර පංතියේ ඉගෙන ගන්න තරම් දැනුමක් තවමත් එයාට නෑ. කොහොම වුනත් එයා දක්ෂ විදිහට ඉගෙන ගනියි කියලා මම විශ්වාස කරනවා. හැබැයි එයාව මේ අමාරු විභාගයෙන් අයින් කර ගන්න එක ඔයාලගේ වගකීමක්. ඒ වගේ විභාගයක් කරන්න ෆෙලිසිටි ට තව ගොඩාක් කල් තියෙනවා.'

එහෙත් ෆෙලිසිටිගේ දෙමාපියන් ඒ අදහසට කැමැති වුයේ නැත. තමාගේ දියණිය එවැනි අමාරු විභාගයකට පෙනී සිටින එක

Scanned with CamScanner

sinhalaebooks.com



ඔවුන්ට ගෞරවයකි. ඒ නිසා ෆෙලිසිටිගේ පියා විදුහල්පතිනියට මෙසේ කීවා ය.

'මිස් තියෝබෝල්ඩ්. ඔයා කැමැති නම් ෆෙලිසිටි ව පස් වැනි වාරයට උසස් කරන්න. ඒ වුනත් එයාගේ සංගීතයට බාධා වෙන කිසිම දෙයක් නම් කරන්න එපා. එයා හරිම දක්ෂ ළමයෙක් කියලා අපි දන්නවා. ඉතින් දක්ෂ ළමයෙකුට හැම දෙනාම උපකාර කෙරුවොත් එයාගේ දක්ෂ කම් තවත් වැඩිකර ගන්න පුළුවන්.'

' ඒ කථාව ඇත්ත.'

විදුහල්පතිනිය හිස සලා ඒ අදහස අනුමත කළා ය. එහෙත් ඇගේ හිතේ කිසියම් දෙගිඩියාවක් ද තිබෙන්නාක් මෙනි.

' ඒ වුනාට අපි ළමයින්ව උනන්දු කරන්න ඕනෑ නිවැරදි දේවල් වලට විතරයි. කොහොම වුනත් මේ වගේ අමාරු විභාගයකට ෆෙලිසිටි ඉදිරිපත් වෙනවට මම නම් කැමැති නෑ. එයාට මේ විභාගය කරන්න තව ගොඩාක් කල් තියෙනවා.'

විදුහල්පතිනිය කෙසේ කීවත් ෆෙලිසිටි ගේ දෙමාපියන් ගේ අදහස වෙනස් වූයේ නැත. තමාගේ දියණිය ඉතාම දක්ෂ ළමයෙක් බවත් ඇය අති දක්ෂ ළමයෙක් විය යුතු බවත් ඔවුන් ගේ අදහසයි. කෙසේ වුවද පියාගේ ඉල්ලීම නිසා විදුහල්පතිනිය ෆෙලිසිටි ව පස් වැනි වසරට උසස් කරන ලදි. එහෙත් ඇගේ ඉගෙනීමේ හැකියාව තිබුනේ අනිතුක් ගැහැණු ළමයින් ගේ මට්ටමට වඩා බොහෝ පහතිනි.

ෆෙලිසිටි. ඈන් මාරි ට දැඩි කැමැත්තක් හෝ නොකැමැත්තක් පෙන්නුවේ නැත. එමෙන්ම තමාගේ සංගීතය නිසා ඈන් මාරි ට බරපතල ලෙස කරදර කරන්නට ඈ ඉන්පසු ව උත්සාහ නොකළා ය. තම කාමරයේ සිටින සහායිකාව ගැන ඇය දැන් වඩාත් සැළකිලිමත් වෙනවා මෙනි.

එහෙත් ඈන් මාරි එසේ නොවේ. ඇය ෆෙලිසිටිගේ

Scanned with CamScanner

sinhalaebooks.com



හැකියාව ගැන ඉරිසියා කළා ය. තමා අති දක්ෂ අයෙකු ය යන හීන මානය නිරන්තරයෙන්ම ඈන් මාරි ගේ හිතේ තිබුනේ ය. ඒ සිතිවිල්ල සාධාරණීකරණය කරන්නට ඇගේ දෙමපියන්ගෙන් ද මහගු පිටුවහලක් ඇයට ලැබුනා ය. ඔවුන් විසින් ඈන් මාරි විසින් ලියූ කවි රාමු කොට නිවසේ තබා තිබේ. නිවසට එන අමුත්තන්ට එම කවි පෙන්වන්නටත් කවදා හෝ දිනෙක ඒවා පොතක් වශයෙන් පළ කරන්නට තමන් සිතාගෙන සිටින බව ෆෙලිසිටි ගේ දෙමාපියන් නිවසට එන සෑම දෙනාටම නොවරදවාම කියති.

කවුරු කෙසේ කීවත් තම පංතියේ ඉගෙන ගන්නා කවියා ගැන ළමයින්ට තිබුනේ දෙගිඩියාවකි. ඇය ලියන කවිවල කිසිම ආකාරයක තේරුමක් ඔවුන් ට පෙනුනේ නැත. ඒවා නිකම්ම නිකන් වචන පෙළක් යැයි ගැහැණු ළමයින් කල්පනා කළ හ. මේ ඈන් මාරි විසින් රචනා කරන ලද එක් කවියකි.

*අනාගතයට යන දිගු පාර දිගේ*
*කඳුලෙන් බොඳවූ මගේ දෑස බලා සිටියි*

කවුරු අකැමැති වුවත් ඇන්ජෙලා සහ ඇලිසන් මේ කවියට මහත් සේ කැමැත්තක් දැක්වූහ. නොඑසේනම් හොඳ කවියකින් නරක කවියක් වෙන් කර හඳුනාගන්නට තරම් දැනුමක් ඔවුන් දෙදෙනාටම නොතිබෙන්නට ඇත. ඉතාම දිගු කවියක තිබෙන අවංකත්වය මෙන්ම ගැඹුරු යථාර්ථය වටහා ගැනීමේ දැනුමක් ඇන්ජෙලාට සහ ඇලිසන් ට නැත.

'මොකක් ද ඇත්තටම මේ කවියේ තේරුම ?. ඇත්තටම මම හරිම මෝඩ ළමයෙක් තමයි. ඒ වුනාට මට මේ කවිය තේරුම් ගන්න බැහැනේ. ඇයි ඔයාගේ ඇස් කඳුලෙන් බොඳ වෙලා තියෙන්නේ ඈන් මාරි ?. ඔයා අනාගතය ගැන බය ද?. මට නම් ඒ ගැන කිසිම සැකයක් නෑ. ඔයා ජීවත් වෙන්න තෝරාගෙන තියෙන මාර්ගය දිගේ ගියාම දුකෙන් තමයි ජීවත් වෙන්න වෙන්නේ. මොකද මේ මාර්ගයෙන් හොඳආදායමක් හොයාගන්න එක ලේසි නෑ.'

Scanned with CamScanner

sinhalaebooks.com



කාලෝටා එසේ කියද්දි බොබී ද එයට අදහසක් එකතු කරන්න අමතක කළේ නැත.

'මේ කවිය නම් කිසිම වැඩක් නෑ. එහෙම නෙවෙයි ඈන් මාරි. ඔයා හොඳ තේරුමක් තියෙන කවි ලියන්න පුරුදු වෙන්න. සමහර වෙලාවට ඔයාගේ මනසෙන් ඒ වගේ හොඳ නිර්මාණ උපදින්න පුළුවන්. උත්සාහ කරලා බලන්නකෝ. එතකොට ඔයාට මේ වගේ මනස් ගාත කවි ලියන්න සිද්ධ වෙන්නේ නෑ.'

තමාගේ හැකියාව ගැන කිසිම අයෙක් උනන්දුවෙන් කථා නොකිරීම ගැන ඈන් මාරි දැඩිසේ දුක් වූවා ය. ෆෙලිසිටි ඉතාම දක්ෂ ළමයෙක් බව සෑම දෙනාගෙම අදහස විය. එයද ඈන් මාරිගේ හිත දුකෙන් පුරවාලන් තවත් කරුණක් බවට පත්ව ඇත.

මේ අතර පාඩම් කාමර ලබාගත් ගැහැණු ළමෝ ඉතාම හොඳින් එයට අනුවර්තනය වන්නට පටන් ගත් හ. සත්තකින්ම දැන් ඔවුන් ඉතාම හොඳින් එයට හුරු වෙලා ය. නිවුන් සොයුරියෝ අපූරුවට තමන් ගේ පාඩම් කාමරය පවත්වා ගෙන යති. තමන් කැමැති අකමැති දේ. දක්ෂ අදක්ෂ දේ ආදි සෑම දෙයක් ගැනම දැන් ඔවුන්ට පාඩම් කාමරය තුළ සංවාදයේ යෙදිය හැකිය. දුක සැප දෙකම බෙදා හදාගත හැකිය. ජැනට් සහ බොබී ද ඉතාම අපූරුවට තමන්ගේ කාමරය පවත්වාගෙන යති. ඔවුන් ද අගේ ඇති යෙහෙළියන් දෙදෙනෙකි. මිරාබෙල් සහ ග්ලැඩිස් ද එසේමය.

පාඩම් කාමරවල වෙසෙන ගැහැණු ළමයින්ට අවශ්‍ය සුළු සුළු වැඩ කටයුතු කරවා ගැනීම සඳහා පළමු වසරේ ගැහැණු ළමයින්ව ගෙන්වා ගැනීමට අවසර දී තිබේ. බොහෝ කුඩා ළමුන් මේ ක්‍රියාවට එතරම් කැමැත්තක් නොදක්වති. එහෙත් එය ඉතාම හොඳ වැඩ පිළිවෙලක් බව සෑම දෙනාම පිළිගනිති. පාසලේ ඉහළ පංතිවල වෙසෙන ළමයින්ව හඳුනා ගැනීමටත්. යම් යම් දේවල් ඉගෙන ගැනීමටත් ඒ නිසා පහළ පංතිවල ළමයින්ට අවස්ථාව ලැබේ.

Scanned with CamScanner

sinhalaebooks.com



තමන් පාසලට ආ මුල්ම දිනවල සිදු වූ දේවල් නිවුන් සොයුරියන් ට අද මෙන්ම මතකය.

'ඔයාට මතකද ? අපි ගිණි උදුනු පත්තු කරපු හැටි ?. ඒ දවස්වල අපි කල්පනා කළේ ඒක අගෞරවයක් කියලා. කොහොම වුනත් ඒ වගේ වැඩ හින්දා අපිට ගොඩාක් දේවල් ඉගෙන ගන්න ලැබුනා කියලා දැන් තේරෙනවා.'

එක දවසක් පැට් ඉසබෙල් ට කීවා ය.

'ඇත්ත තමයි. ඒ නිසා අපිට පහළ පංතිවල ළමයින් ව අඳුනාගන්න ලැබෙනවා. අනික ඒ අය අපේ වැඩ කරන්න ආවම අපිව අඳුන ගන්නත් අපිත් එක්ක කථා කරන්නත් අවස්ථාවක් ඒ අයට ලැබෙනවා. ඔයා දන්නවද ? මේ සැරේ අපේ ඉස්කෝලෙට ඇවිත් ඉන්න ගොඩාක් පුංචි ළමයි හරිම දක්ෂ අය. සමහර අය ක්‍රීඩාවට ගොඩාක් දක්ෂයි කියලා මට තේරෙනවා.'

ඉසබෙල් කීවා ය.

'ඔයා දන්නවද ඉසබෙල් ?. ඇන්ජෙල යි ඇලිසනු යි පොඩි ළමයින්ගෙන් ගොඩාක් වැඩ ගන්නවා. තමන්ට තියෙන බලය ඒ අය වැරැදි විදිහටයි පාවිච්චි කරන්නේ.'

'හිලරි ඉදිරිපත් වෙලා ඒ වැඩේ නතර කෙරුවොත් නම් හොඳයි. දෙයියනේ. දැන් රෑ වෙලා. රෑ දහයට විනාඩි පහයි. එන්න. අපි දැන් නිදා ගනිමු. ඇත්තටම අපි මෙහෙම කාමරයක ඉන්න එක මොන තරම් අපූරු දෙයක්ද කියලා ඔයාට හිතෙන්නේ නැද්ද පැට් ?'

ඉසබෙල් ඈනුමක් අරින ගමන් ඇසුවා ය.

'ඇයි නැත්තේ ? හැබැයි රෑ දහය පහුවෙනකම් ඇහැරලා හිටියොත් නම් ඒ වගේ අපූරු හැඟීමක් දැනෙන්නේ නෑ. හ්ම්. ඉක්මන් කරමු දැන් රෑ දහයත් පහුවෙලා.'

Scanned with CamScanner

sinhalaebooks.com



පැට් එසේ කීවා ය. ඉන්පසුව නිදි කුමරිය ඔවුන් වෙතට එන්නට වැඩි වෙලාවක් ගත වූයේ නැත.

Scanned with CamScanner

sinhalaebooks.com



# අලුත් ඉංග්‍රීසි ගුරුතුමී

මේ වාරයේදි සෙන්ට් ක්ලෙයාර් පාසලේ පහල පංති සඳහා කුඩා ගැහැණු ළමයින් බොහෝ දෙනෙකු ඇතුලත් වී සිටිති. ඒ නිසා පංති භාර ගුරුවරියන්ගේ වැඩ කටයුතු වලට පහසුවක් වන්නට තවත් අමතර ගුරුවරියන් කිහිප දෙනෙකු යොදවන්නට ද විදුහල්පතිනිය අමතක නොකළා ය.

මිස් විල්කොක්ස් ගේ ආගමනය පාසලේ බොහෝ ගැහැණු ළමයින් ගේ අමන්දානන්දයට හේතු විය. පාසල ආරම්භ වී දෙවැනි දිනයේ පැවැති උදෑසන රැස්වීමේදි ළමයින්ට අළුත් ගුරුවරිය දැකගත හැකිවිය.

'එයාගේ නම මිස් විල්කොක්ස්. එයා හරිම දක්ෂ ගුරුවරියක්. අපිට ඉංග්‍රීසි උගන්වන්නයි එන්නේ. ඔයාලා දන්නවද ? එයා කවි පොතකුත් ලියලා පළ කරලා තියෙනවා.'

ගැහැණු ළමුන් අළුත් ගුරුවරිය ගැන නොයෙකුත් දේ සිහින්

Scanned with CamScanner

sinhalaebooks.com



හඬෙන් මුමුණන්නට වූහ. ඔවුන් මිස් විල්කොක්ස් දුටුවෙ අති දක්ෂ ගුරුවරියක් ලෙසිනි. යම් කිසිවෙකු පොතක් පළ කරන්නේ නම් එයා අති දක්ෂ එමෙන්ම පිළිගත් අයෙකු ලෙස සලකන්නට ඔවුන් හුරුවී සිටිති. මිස් විල්කොක්ස් ද ළමයින් දෙස විමසිලිමත්ව බලා සිටියා ය. ඇය සිතන්නේ කුමක් ගැන ද ?. සමහර විට ඒ තවත් පොතක් පළ කිරීම ගැන විය යුතු යැයි ගැහැණු ළමෝ විශ්වාස කළ හ.

ඇත්තෙන්ම අළුත් ගුරුවරිය ගැන දැන් සෑම දෙනාම උනන්දුවෙන් කථා කරති. ඇය පංතියේදි කෙසේ හැසිරෙනු ඇද්ද ?. ඉතා දැඩිව ?. අනුකම්පා සහිතව ?. ඇල්මැරුණු ආකාරයෙන් ද? එමෙන්ම ඇයට කිසියම් විහිළුවක් කළ හැකිවෙනු ඇද්ද ?.

' මට නම් හිතෙන්නේ එයා හරිම අපූරු ගුරුවරියක්. අනික එයාගේ මුහුනේ තියෙන ලස්සන වගේම හිතත් ලස්සන ඇති කියලා මට කිසිම සැකයක් නැතිව කියන්න පුළුවන්.'

මුලින්ම ඇලිසන් තම අදහස ඉදිරිපත් කළා ය.

' ඇත්තටම එයා මොනවද හිතනවා ඇත්තේ ?. මම හිතන විදිහට නම් අද දවල්ට කන්න තියෙන්නේ මොනවද කියලා එයා කල්පනා කරනවා ඇති.'

බොබී ගේ සමච්චල් සහගත කටහඬ ඇසුනේ ඒ අවස්ථාවේදී ය.

' අනේ ඇත්තටම අපේ පංතියේ ළමයි හිතන දේවල්. ඒ අය ගොඩාක් ඈත තියෙන දේවල් ගැන සිහින මවනවා. ඈන් මාරි තමයි ගොඩාක් සිහින මවන්නේ. අනික අද හවස තේ එකට කේක් කෑල්ලක් ලැබෙයිද කියලා එයා සිහින මවනවා ඇති. හැබැයි ඊට වඩා කිසි දෙයක් ගැන නම් එයා කල්පනා කරන්නේ නෑ.'

බොබී ට කිසියම් පිළිතුරක් දිය යුතු යැයි ඈන් මාරි කල්පනා

Scanned with CamScanner

sinhalaebooks.com



කළා ද අවසානයේ දි ඇය කිසිවක් නොකියාම නිහඬ වූවාය. කවියෝ කිසිවිටෙක කිසිම දෙයක් වරදවා තේරුම් ගන්නේ නැත. එසේ වූවහොත් ජනතාව ඔවුන්ට සිනාවෙනු ඇතැයි ඈන් මාරි කල්පනා කළා ය. කවියෝ සෑම දෙයම විඳ දරා ගත යුතුය. එසේ වූවහොත් අනාගතයේදි ලෝකයා ඔවුන් ගැන ආඩම්බරයෙන් කථා කරනු ඇත.

' සමහර විට මම හොද කවියෙක් කියලා මිස් විල්කොක්ස් තේරුම් ගනියි. ඇත්තටම එහෙම වුනොත් ඒක මොන තරම් වාසනාවක් ද ?. මම ලියන කවි මිස් විල්කොක්ස් කියවලා බැලුවොත් අනිත් අය මම ගැන ගොඩාක් වෙනස් විදිහට හිතන්න පටන් ගනියි. ඒ නිසා මම එයාගෙ පංතියේදි ගොඩාක් මහන්සි වෙලා වැඩ කරන්න ඕනෑ.'

ඈන් මාරි තනිවම එසේ කල්පනා කළා ය. ඇත්ත වශයෙන්ම විල්කොක්ස් ගුරුවරියගේ ඉංග්‍රීසි පාඩම අතිශයින්ම රසවත් එකකි. එය ප්‍රකට නාට්‍ය දෙබස් සහ කවි වලින් පිරි ඇත. ගැහැණු ළමෝ කිසිදු තර්කයකින් තොරවම ඒ පාඩමට ආසා කල හ. ඇත්තෙන්ම මිස් විල්කොක්ස් යනු ඉතාම නුවණැති ගුරුවරියකි. ඇය බොහෝ සේ පොත් පත් කියවා ඇති කෙනෙකි. ඉතා හොද මනසක් මෙන්ම ළමයින්ට උගන්වන දේ නිවැරැදිව එමෙන්ම මනසට කා වදින ආකාරයෙන් ඉතාම දක්ෂ ලෙස උගන්වන්නටද ඇයට හැකිය.

එහෙත් ජැනට් ගේ අදහසට අනුව නම් මිස් විල්කොක්ස් කිසිම පිළිවෙලක් නැති ගුරුවරියකි. ඇය තම ගෙල වටා ලේන්සුවක් බැඳගෙන සිටියි. දීප්තිමත් බඳ පටියක් ද, නොගැළපෙන අත් ලේන්සුවක් ද ඇය ළඟ නිතරම දැකගත හැකිය. එපමණක් ද නොවේ. මිස් විල්කොක්ස් හැඳ සිටින්නේ ඇයට නොගැළපෙන අන්දමේ විශාල ඇඳුම් පැළඳුම් ය.

මිස් විල්කොක්ස් ගේ කටහඬ ද ගොරෝසු ය. ඒ ගොරෝසු

Scanned with CamScanner

sinhalaebooks.com



කටහඬ නිසා ඇ කියන කවිවල රසවත් බව පවා මැකී යන බව ළමයින්ට වැටහෙයි. වරෙක ගැඹුරු බවක් ගන්නා ඇගේ කටහඬ තවත් වරෙක සිහින් හඬකින් පැතිරෙයි. එහි කිසිම ආකාරයක සමාන බවක් නොතිබුන ද ඇලිසන් නම් ඒ කටහඬට සවන් දෙන්නේ වශී වූවාක් මෙනි.

ඇය විල්කොක්ස් ගුරුවරියගේ හැසිරීමක් හෝ දෙකක් අනුකරණය කරන්නටද පටන්ගත්තා ය. දැන් ඇලිසන් කථා කරන්නේ මිස් විල්කොක්ස් කථා කරන ආකාරයටයි. ඒ අනුව ඇගේ අතක්ද එහාට මෙහාට චලනය වෙයි. මේ වෙනස මුලින්ම වටහා ගත්තේ පැට් සහ ඉසබෙල් විසිනි. ඊට පසුව බොබී සහ ජැනට් ද ඇලිසන් ගේ වෙනස හඳුනාගත් හ.

' ඒයි. අපේ පිහාටු ඔලුවක් තියෙන ඇලිසන් දැන් මොනවද කරන්නේ කියලා ඔයාලා දැක්කේ නැද්ද ?. එයා දැන් මිස් විල්කොක්ස් ව අනුකරණය කරනවා. අනේ ඇලිසන් ඔයාට තවමත් හිත එකඟ කරගන්න බැරි ද?.'

බොබී එසේ කියද්දි ඇලිසන් ගේ මුහුණ ලැජ්ජාවෙන් රතු වූයේය. තමාව සමච්චලයට පත්වෙන සෑම අවස්ථාවකදීම ඇය අපහසුවට පත්වන්නී ය. ඒ නිසා ඈ ගොත ගසන්නාක් වැනි කටහඬකින් මෙසේ ඇසුවා ය.

' ඔයා මොනව කියනවද කියලා මට තේරෙන්නේ නෑ. ඇත්තෙන්ම මම මිස් විල්කොක්ස් ට කැමැතියි. එයා උගන්වන හැටි ඒ වගේම එයාට තියෙන දැනුම ගැන මට හරිම පුදුමයි.'

' අනේ... අනේ... ඇලිසන්. ඔයා මිස් විල්කොක්ස් ව අදහන්න ලෑස්ති වෙනවා කියල නම් කියන්න එපා. ඔයා ඉස්සරත් ඒ වගේ මෝඩ වැඩ කරලා නැද්ද ?. ඇත්තමයි ඔයාට අදහන්න තරම් හොඳ කෙනෙක් තවම හම්බ වෙලා නෑ.'

බොබී සමච්චලයෙන් එමෙන්ම ගොරවන්නාක් වැනි

Scanned with CamScanner

sinhalaebooks.com



හඬකින් කියද්දී ඇලිසන් ගේ සිහින් කටහඬ යාන්තමට මෙන් සැමටම ඇසුනේ ය.

' ඇයි මිස් විල්කොක්ස් හොඳ කෙනෙක් නෙවෙයි ද ?. එයා හරිම ඥානවන්ත කෙනෙක්. අනික හරිම ලස්සන කවි ලියන්නත් පුළුවන්. ඒ විතරක් ද?. එයා පොතක් ලියලත් තියෙනවා. එයාට හරිම ප්‍රිය මනාප පෙනුමකුත් තියෙනවා කියලා මට හිතෙනවා.'

'එතකොට එයාගේ තියෙන අපිරිසිදු ඒ වගේම පිළිවෙලක් නැති කම ගැන ඔයා මොකද කියන්නේ ?. ඒකට කියන්නෙත් ප්‍රිය මනාප පෙනුම කියලද ?. අනේ ඇලිසන් ඔයා මොන තරම් මෝඩ කෙල්ලෙක් ද කියලා මට නම් හිතාගන්න බෑ. මට නම් මිස් විල්කොක්ස් ගැන හිතෙන්නේ වෙන දෙයක්. බලන්නකෝ එයා කොණ්ඩෙට ගහලා තියෙන රත්තරන් පාට මුදුනක් තියෙන කොණ්ඩ කටුව. ඒ කටුව දැක්කම මට හරිම අප්පිරියයි වගේ.'

බොබී ගේ කථාව ඉතා දැඩිය. ඇය තමාගේ හිතට එන සෑම දෙයක්ම නොසඟවා කියන ආකාරයේ ගැහැණු ළමයෙකි. විල්කොක්ස් ගුරුවරිය වැනි අය ගැන බොබී ට තිබෙන්නේ මහා විවේචනයකි.

' අනේ බොබී. මිස් විල්කොක්ස් ඔයා කියන තරම් නරක කෙනෙක් නම් නෙවෙයි.'

ඇලිසන් ගේ දෑස්වලින් කඳුළු ගලා යන්නට ආසන්නය. ඒ බව දුටු නිසාදෝ පැට් එවැනි දෙයක් කීවා ය.

' අනිත් කාරණාව තමයි ඇලිසන්. ඔයා කියන තරම් එයා අපූරු කෙනෙකුත් නෙමෙයි. ඒ මොනව වුනත් කමක් නෑ. මේ වාරෙදි නම් කිසිම කෙනෙක් ව අදහන්න නම් ලෑස්ති වෙන්න එපා. පහුගිය වාර දෙකේම ඔයා හරි පුදුම විදිහට තමයි ජීවත් වුනේ.'

ඇලිසන් නොමනාපයෙන් පැත්තට හැරුනා ය.

' මිස් ක්වින්ටින් ව මතකයි නේද ?. ඔන්න මේ පාර නම් ඒ

Scanned with CamScanner

sinhalaebooks.com



වගේ මෝඩ වැඩ කරන්න හිතන්නවත් එපා.'

බොබී අවවාදාත්මක හඬකින් නැවතත් කීවා ය. පහල පංතියක සිටිද්දි ඇලිසන් මිස් ක්විත්ටින් ව අනුකරණය කළා පමණක් නොව ඇයව අදහන්නට ද පුරුදුව සිටි බව ළමයින්ට මතකය. ඇලිසන්ගේ දුර්වල කමෙන් ප්‍රයෝජන ගත් මිස් ක්විත්ටින් අවසානයේදි ඇලිසන් ව සමච්චලයට ලක් කළා ය. එම සිදුවීමෙන් ඇලිසන් දැඩි පාඩමක් ඉගෙන ගත් අතර ඉන්පසුව කවරෙකු හෝ අනුකරණය කරද්දි පවා ඉතාමත් කල්පනාකාරි වූවා ය.

' අපි එයාව වලක්වන්න උත්සාහ කරන එක හොඳ වැඩක් නෙවෙයි. අනිත් එක තමයි බොබී ඔයා ඇලිසන් ගේ හිත පෑරුවා.. එයාට මේ වගේ කථා දරාගන්න අමාරුයි.'

තම ඥාති සහෝදරිය ඇලිසන් කාමරයෙන් පිටව යන ආකාරය දෙස බලා සිටි පැට් කීවා ය.

' මම කීවේ මට හිතෙන දේ. ඒක ඇලිසන්ට දුක් වෙන්න හේතුවක් නෙවෙයි. අනික එයා හැම වෙලාවෙම වැරදි අයවමයි තෝරාගන්නේ. අන්න ඒක වලක්වා ගන්නයි මට ඕනෑ වුනේ.'

' මිස් විල්කොක්ස් ඇලිසන් ගේ හිත වෙනස් කරලා. ඒ විතරක් නෙවෙයි. වැඩි දවසක් යන්න ඉස්සර වෙලා මිස් කෝන්වෙලිසුත් එහෙම දෙයක් කරයි කියලා මට හිතෙනවා. ඔයාලා දන්නවද ? අර කිසිම කමකට නැති ඈන් මාරිත් මිස් විල්කොක්ස් ව අනුකරණය කරනවා කියලා මට හිතෙනවා.'

'ඇත්ත තමයි. මටත් එහෙම හිතෙනවා. ඈන් මාරියි. ඇලිසනුයි දෙන්නා ගිහිං මිස් විල්කොක්ස් ගේ කකුල් දෙක ළඟ දණගහනවා නම් එයා ඒකටත් කැමැති වෙයි. හ්ම් අපිට ඒවා වැඩක් නෑ. එන්න අපි පොඩ්ඩක් ඇවිදිමු. ටෙනිස් සෙල්ලම් කරන්න තරම් පිට්ටනිය හොඳ ද කියලා ඉස්සර වෙලාම බලමු.'

Scanned with CamScanner

sinhalaebooks.com



බොබී කීවා ය. ඉන්පසුව ඔවුන් පිට්ටනිය දෙසට ඇවිද යන්නට වූවාය. අතර මගදී ඔවුන්ට අල්මා පුඩිං හමු වූයේ ය. ඇයගේ පෙනුම දුක්බරය. එමෙන්ම එහි කිසිම ප්‍රිය මනාප බවක් ද නැත. පැට් ට ඈ ගැන කිසියම් දුකක් දැනුනා ය.

' ඔයා එනවද අපිත් එකක් සෙල්ලම් කරන්න ?. ඇත්තටම අපිට එක්කෙනෙක් අඩු යි.'

පැට් එසේ අසද්දි අල්මා දුක්බර ලෙස මෙසේ කීවා ය.

' මම ගොඩාක් මහතයි නේ. ඒ නිසා මට දුවන්න අමාරුයි.'

' එන්න. එන්න. ටිකක් සෙල්ලම් කළා ම ඔය මහත ගතිය අඩුවෙයි.'

ඉසබෙල් ද කීවා ය. එසේ වුවද අල්මා ඒ කිසිම අදහසකට කැමැති වූයේ නැත. ඇය ක්ලෝඩින් මෙන්ම සෑම ක්‍රීඩාවක්ම ප්‍රතික්ෂේප කළා ය. ක්ලෝඩින් ද එසේ මය. වෙනකක් තබා ඇය ස්වභාවධර්ම චාරිකා පවා යන්නට ඉදිරිපත් වූයේ නැත. මුල් දවස්වල ඈ මේට්‍රන් වරිය සමඟ එක්ව ඇඳුම් මහන්නට යොදා ගත්ත ද පහුවෙනකොට මේට්‍රන් වරියට ක්ලෝඩින් ගේ උපාය ගැන ඉව වැටුනේ ය. ඉන්පසුව ඇයට වෙන උපායක් ගැන කල්පනා කරන්නට සිදුවූයේ ය.

කෙසේ වුවද ක්ලෝඩින් කිසිවකින් පසු බසින ආකාරයේ ගැහැණු ළමයෙක් නොවේ. සමහර දවස්වලට ඈ ක්‍රීඩාවට අදින ඇඳුම් පැළඳුම් ද හැඳ පිට්ටනියට ද යන්නීය. එහෙත් කිසියම් බොරු අසනීපයක් ගෙන හැකි ඉක්මනින් පිට්ටනියෙන් එන්නට ක්ලෝඩින්ට සෑමදාම අවස්ථාව ලැබේ.

ක්ලෝඩින් සහ කාලෝටා වෙසෙන්නේ එකම කාමරයේ ය. ඇත්තෙන්ම ඔවුන් දෙදෙනා කදිමට ගැළපෙන යෙහෙළියන් යුවලකි. කාලෝටා නොකැමැති දේවල් ද බොහෝ ඇත. ඇය ඒවායින් මග හරින්නට අනුගමනය කරන්නේ කෙලින් සහ එඩිතර ක්‍රියා

Scanned with CamScanner

sinhalaebooks.com



මාර්ගයන් ය. එහෙත් ක්ලෝඩින් හීන් නූලෙන් තමන්ගේ අදහ
මුදුන් පමුණුවා ගන්නී ය. කෙසේ වූවද මොවුන් දෙදෙනාම මිරාබෙ
සමඟ නම් එතරම් හොඳ හිතක් නැත. එයට හේතු ගොඩාක් ඇ

මිරාබෙල් සෙන්ට් ක්ලෙයාර් පාසලේ ක්‍රීඩා නායිකා
වශයෙන් පත්ව සිටින්නී ය. ග්ලැඩිස් ඇගේ උප නායිකාවයි. එ
ඔවුන් දෙදෙනාටම ගොඩාක් සතුටු වෙන්නට හැකි කාරණයකි
ග්ලැඩිස් ඉතාම කුඩා ගැහැණු ළමයෙක් වුවද අති දක්ෂ ක්‍රීඩිකාවකි
ටෙනිස් පිටියේදී හෝ ක්‍රීඩා පිටියේදී ඇයව පරාජය කරන්නට හැකි
කිසිම ළමයෙකු සෙන්ට් ක්ලෙයාර් පාසලේ නැත. එමෙන්ම ඇය
අති දක්ෂ පිහිණුම් ක්‍රීඩිකාවකි. මේ සැම කාරණකටම අමතරව
පහල පංතිවල ලැජ්ජාශීලි කුඩා ළමයින් හසුරුවා ගැනීමේ සහජ
දක්ෂතාවයක් ද ග්ලැඩිස් සතුව තිබේ.

සත්තකින්ම මිරාබෙල් ද අති දක්ෂ ක්‍රීඩා නායිකාවකි. උස්
කටහඬෙන් සැම විටම කථා කරන එමෙන්ම සමහර අවස්ථාවලදී
දරදඬු ලෙසින් ක්‍රියා කරන ඇය අනිත් ළමයින් ගේ හැඟීම් ගැන
එතරම් සැළකිල්ලක් දක්වන්නේ නැත. එහෙත් ඇය අති දක්ෂ
ලෙස තමන්ගේ වගකීම ඉටුකරන්නී ය. මිරාබෙල් සැම විටම උත්සාහ
කරන්නේ ඇලිසන්. ක්ලෝඩින්. ඇන්ජෙලා සහ කාලෝටා වැනි
ළමයින් ක්‍රීඩාවට උනන්දු කරවන්නටයි. ඔවුන් කෙසේවත් ක්‍රීඩා
පිටියට රැගෙන යන්න බැරිතරම් දරදඬු ගැහැණු ළමයින් ය. එහෙත්
මිරාබෙල් ද තම උත්සාහය කිසිදා අත් හරින්නට සූදානම් නැති
ළමයෙකි.

'මිරාබෙල් හරිම කරදරකාර ළමයෙක්. එයා හැම වෙලාවෙම
මාව පිට්ටනියට එක්ක යන්න හදනවා. එහෙම වුනාම දැඩිය දාලා
මාව අපිරිසිදු වෙනවා. මම ඒකට කැමැති නෑ. අනේ නැන්දේ මට
පපුවෙ අමාරුවක් තියෙනවා කියලා ඔයාට කියන්න බැරි ද?.'

එක් දිනක් ක්ලෝඩින් තම නැන්දනිය වූ මැඩමොසෙල්
හට කීවා ය. එහෙත් මැඩමොසෙල් ගෙන් ඇයට ලැබුනේ කිසියම්

Scanned with CamScanner

sinhalaebooks.com


අවවාදාත්මක පිළිතුරකි.

'ක්ලෝඩින්. ඇත්තටම ඔයාට පපුවෙ අමාරුවක් තියෙනව ද?. ඔයා ඒ ගැන මට කලින් කියලා නෑනේ. ඇත්තටම ඔයාගේ පපුව රිදෙනවා නම් දැන්මම ගිහිං මේට්‍රන් ව හම්බ වෙන්න.'

ඇත්තෙන්ම ක්ලෝඩින් ට අවශ්‍ය ව තිබූ අවසන් සැලසුමත් එයම විය. එසේ වුවත් ක්ලෝඩින් කියන සෑම දෙයක්ම විශ්වාස කරන්නට තරම් මේට්‍රන් වරිය බොළඳ නැත.

'ඇත්තටම නෑ නැත්දේ. මගේ පපුව රිදෙන්නේ නෑ. ඒ වුනාට මෙන්න මෙතැන ටිකක් විතර හිරි වැටිලා වගේ දැනෙනවා.'

මැඩමොසෙල් ක්ලෝඩින් දෙස බලා සිටියා ය. ඇය තම ලේලියට දැඩි කැමැත්තක් දක්වන්නී ය. එහෙත් ඇගේ සමහර ක්‍රියාකාරකම් ගැන මැඩමොසෙල් ගේ හිතේ ද එතරම් කැමැත්තක් නැත. දැන් ක්ලෝඩින් කරන්නේ ද එවැනි රඟපෑමකි. ක්ලෝඩින් තමන් ගේ හදවත යැයි අත තබා පෙන්වන තැන දෙස මැඩමොසෙල් බලා සිටියේ පුදුමයෙනි.

'ක්ලෝඩින්. ඔයා පෙන්වන තැන තියෙන්නේ හදවත නෙවෙයි. බඩ. ඒ මොනව වුනත් ඔයාට හොඳ බෙහෙත් වට්ටෝරුවක් නම් ගන්න වෙයි කියලා මට ත් හිතෙනවා.'

ක්ලෝඩින් එක්වරම කලබල වූවා ය. මේට්‍රන් ගෙන් හොඳ බෙහෙත් වට්ටෝරුවක් ගන්නට නම් ඈ කිසි ලෙසකින්වත් කැමැති වන්නේ නැත. ඇගේ බෙහෙත් ඒතරම් නීරස ය.

තවත් දවස් කිහිපයක් ගෙවී ගියේ ය. දැන් පස් වැනි වාරයේ ළමුන් ඔවුන්ගේ එදිනෙදා අධ්‍යාපන කටයුතුවලට හුරු වී සිටිති. ඔවුන් නවතම පාඩම් පොත් වලින් ඉගෙන ගනිති. සිනා හඬ කථා බහ සෑම තැනකින්ම ඇසේ. හිතේ හැටියට සෙල්ලම් කරන්නටත් පාඩම් කරන්නටත් දැන් ඔවුන්ට කිසිම බාධාවක් නැත. එමෙන්ම රාත්‍රී දහයට පසුව කැමැති වෙලාවක නිදාගන්නට යන්නට ද දැන්

Scanned with CamScanner

sinhalaebooks.com



ඔවුන්ට හැකිය. සැබැවින්ම දැන් සෙන්ට් ක්ලෙයාර් පාසල ඉතාම අපූරුය. එහෙත් තවත් ඔවුන්ට ඉතිරිව තිබෙන්නේ එක පාසල් වාරයක් පමණි. ඒ ගැන සිහිපත් වන විට නම් පස් වැනි වාරයේ සෑම ගැහැණු ළමයෙකුගේම සිත්වලට දැනෙන්නේ දරාගත නොහැකි ශෝකයකි.

මේ වාරය අවසානයේදී ඉතාම අමාරු විභාගයකට මුහුණ දෙන්නට ද ඔවුන්ට සිදුවෙනු ඇත. සෑම දෙනාගේම හිත්වල එම විභාගය පිළිබඳව ද දෙගිඩියාවක් ද තිබෙන්නාක් මෙනි. තමන්ට මෙම විභාගය සමත් විය නොහැකි බව ඩොරිස්. අල්මා සහ ෆෙලිසිටි සිතා ගත් හ. ඒ නිසා ඔවුන්ගේ හිත් වල කිසියම් අනියත බයක් ද නැගී එයි. එසේ වුවද මිස් කෝන්වෙලිස් කියූ දෙයක් නිසා ඔවුන් ගේ හිත්වල තිබූ බය මදකින් අඩු විය.

'බයවෙන්න දෙයක් නෑ. ඔයාලා මේ විභාගේ ෆේල් වුනත් ඒක ඔයාලගේ ඉගෙනීමට බාධාවක් කියලා මම හිතන්නේ නෑ. හැබැයි විභාගේ පාස් වුනොත් ඔයාලා ගොඩාක් දියුණු වෙලා. ඒ වගේම හොඳට ඉගෙන ගන්නවා කියලා. මට තීරණය කරන්න පුළුවන්. අනිත් එක තමයි විභාගෙන් පස්සේ ඔයාලා හැම දෙනාටම පොඩි විවේකයක් දෙනවා කියලත් මම පොරොන්දු වෙනවා. හැබැයි මේ වාරේ ඔයාලා ගොඩාක් මහන්සි වෙලා හොඳට ඉගෙන ගන්න ඕනෑ.'

ඉන්පසුව පාඩම් කාමර පුරා ගැහැණු ළමයින්ගේ ඉමහත් උත්සාහ වන්ත බව දැක ගත හැකිවිය. ඔවුන් සෑම දෙනාම ළඟ ළඟම එන අපහසු විභාගය සඳහා පාඩම් කරන්න වූහ. ගණිත පාඩම ගැන ක්ලෝඩීන් මැසිවිලි නැගුවා ය. ව්‍යාකරණය පාඩම නම් කාලෝටා ට පෙන්නන්න බැරි ය. ඉංග්‍රීසි සාහිත්‍ය ගැන වටහා ගන්නට ෆෙලිසිටි මහත් උත්සාහයක් දැක්වූවා ය. ඇය රචනා ලියුවද සැනෙකින්ම ඒ සෑම දෙයක්ම අමතක ව ගොස් සංගීත භාණ්ඩයක් වාදනය කරන්නට පටන් ගනියි. ඈන් මාරි ද ඉංග්‍රීසි පාඩම හැකි

Scanned with CamScanner

sinhalaebooks.com



පමණ හොඳින් කරන්නට උත්සාහ කළා ය. එමගින් හෝ මිස් විල්කොක්ස් ගේ අවධානය දිනාගන්නට ඇයට ඇවැසි ය.

ඩොරිස් සහ ඇන්ජෙලා ද උනන්දුවෙන් ඉගෙන ගන්නට උත්සාහ කළා ය. එහෙත් ඔවුන් ඒ දේවල් කරන්නන් වාලේ කරන්නට උත්සාහ කළා විනා කිසියම් සැළසුමක් ඇති ව කල දේවල් නොවේ.

දැන් මුළු පාසලම උනන්දුවෙන් ඉගෙන ගන්නා ගැහැණු ළමයින් ගේ තෝ තැන්නකි. ළමුන් මහන්සි වී පාඩම් කළ ද කිසියම් විනෝදමත් බවකින් සෙන්ට් ක්ලෙයාර් පාසල පිරී තිබෙන්නාක් මෙනි.

Scanned with CamScanner

sinhalaebooks.com



# ඇන්ජේලාට තරහ ගිහිං

පළමු වසරේ පුංචි ළමයින් පස් වැනි වසරේ ගැහැණු ළමයින්ගේ පොඩි පොඩි වැඩ කර දෙන්නට දැන් පාඩම් කාමරවලට ගොඩ වදිති. තේ පානය සඳහා ටෝස්ට් සාදා දෙන්නත් ලොකු ගැහැණු ළමයින් සමඟ යම් යම් දේ කථා කරන්නත් කුඩා ගැහැණු ළමයින් දක්වන්නේ ඉමහත් කැමැත්තකි.

ක්‍රීඩාවට දක්ෂතා දක්වන කුඩා ගැහැණු ළමයින් ට මිරාබෙල් බොහෝ සේ කරුණාවන්ත වූවා ය. ඒ නිසාම ඔවුන් ට ලක්‍රොස් ක්‍රීඩාව පුහුණු කරන්නටත්. දුවන්නත්. පනින්නත් උපදෙස් සහ මග පෙන්වීම මිරාබෙල් වෙතින් නොඅඩුවම ලැබුනේ ය. ක්‍රීඩා නායිකාව වෙතින් ලැබෙන මේ අගනා පුහුණුව නිසා පහළ පංතිවල කුඩා ගැහැණු ළමයින් වෙතින් ද ඉතා ඉහල දක්ෂතාවක් දැකගත හැකිවිය.

'ඔයා දන්නවද ?. පුංචි මොලි විලියම්ස් හරිම දක්ෂ ළමයෙක්'.

Scanned with CamScanner

sinhalaebooks.com



එක් දිනක් මිරාබෙල් ග්ලැඩිස් ට කීවා ය.

' ග්ලැඩිස්. ඔයා දන්නවද ?. එයා තුන් වැනි වාරයේ දි ලක්‍රොස් කණ්ඩායමට සෙල්ලම් කරයි. අනික ජේන් ටිල්. එයත් හරිම දක්ෂයි. හැබැයි එයාට තව ටිකක් මහන්සි වෙලා පුහුණු වෙන්න වෙනවා. එහෙම වුනා නම් එයත් හොඳ දක්ෂ ළමයෙක් වෙනවා. ඒ ගැන කිසිම සැකයක් නෑ.'

'පුංචි ඇන්ටනට් නම් හරිම නරකයි. ඇත්තටම එයා ක්ලෝඩින් වගේම නරක ළමයෙක්.'

ග්ලැඩිස් ද කීවා ය.

'එයාව මොන විදිහකින් වත් පුහුණුවට එක්ක යන්න බෑ. අනික එයා සෙල්ලම් කරන්න ත් උනන්දුවක් නෑ. ක්ලෝඩිනුත් එහෙමයි. අක්කා කරන දේ නිසා ඇන්ටනට් ටත් නිදහසට කාරණයක් කියන්න තියෙනවා.'

'ඇත්තමයි. ක්ලෝඩින් ගේ මෝඩ වැඩ නිසා මට නම් එයාව එපාවෙලා. එයා හරිම කපටි ළමයෙක්. එයා කරන වැඩ නිසා කවදාහරි ඉස්කෝලෙනුත් අයින් කරයි කියලා මට හිතෙනවා.'

එසේ කීවේ මිරාබෙල් ය.

' ආ.... නෑ එයා ඒ තරම්ම නරක ළමයෙක් නෙවෙයි. ඇත්තටම එයා අපිට වඩා වෙනස් ළමයෙක්. කොහොම වුනත් අපි හිතනවට වඩා එයා හොඳ ළමයෙක් කියලා මට හිතෙනවා.'

ග්ලැඩිස් කථාවට මිරාබෙල් ගෙන් ලැබුනේ මෙවැනි පිළිතුරකි.

' එයාට මේ වාරේ ඉවර වෙනකම් ඉන්න ලැබුනොත් නම් මට ඔයාගේ කථාව ගැන විශ්වාසයක් තියාගන්න පුළුවන්. ඒක නෙමෙයි ග්ලැඩිස්. ඔන්න මම මොලි විලියම්ස් ගේ නමත් ලැයිස්තුවට ඇතුළු කෙරුවා. දැන් එයා ගොඩාක් සතුටු වෙයි.'

Scanned with CamScanner

sinhalaebooks.com



'ඒක නෙවෙයි. ඇන්ජෙලයි ඇලිසනුයි පහළ පංතිවල ළමයින් ගෙන්න ගෙන ගොඩාක් වැඩ ගන්නවා කියලා හැමෝම කියනවා.'

ග්ලැඩිස් කථාව වෙනතකට යොමු කරන ගමන් කීවා ය.

'හැම වෙලාවෙම පොඩි ළමයෙක් නැතිනම් දෙන්නෙක් ඒ අයගේ පාඩම් කාමරේ ඇතුලේ ඉන්නවා. මේ දවස්වල ඇන්ජෙලා ජේන් ටිල් ට කියලා ඉරුණු ඇඳුම් මහනවා. පොඩි ළමයින් ට කියලා එහෙම දේවල් කරගන්න එක නීති විරොධී වැඩක්. හැබැයි ඇන්ජෙලාට ඒ ගැන කිසිම තැකීමක් නෑ.'

' මම මේ ගැන ජේන් එක්ක කථා කරන්නම්. ඇන්ජෙලා ගේ ඉරුණු ඇඳුම් මහන එක එයාට අයිති වැඩක් නෙවෙයි කියලා මම ජේන් ට පහදලා දෙනවා. ඒ වෙලාවට ලක්‍රොස් පුහුණු වෙන්න පිට්ටනියට එන්න කියලත් මම ජේන් ට කියනවා.'

මිරාබෙල් තමන්ට හුරු දැඩි ස්වරයෙන් ම කීවා ය. එහෙත් ග්ලැඩිස් ට තිබුනේ වෙනත් අදහසකි.

' එහෙම නෙවෙයි. ඔය කථාව ජේන් ට කියන්නේ නැතිව කෙලින්ම ඇන්ජෙලාට කීවොත් නරකද ?. මේ වැඩේ ට වගකියන්න ඕනෑ ඇන්ජෙලා. ඒ නිසා එයයි ජේන් ට කියන්න ඕනෑ කියලා මට හිතෙනවා.'

' නෑ.. මම මේක ජේන් එක්ක කථා කරන්නම්.'

මිරාබෙල් ගේ කටහඬ දැඩි ය. ඇය පාසලේ ක්‍රීඩා නායිකාව නිසා එවැනි දෙයක් ජේන් ට කියන්නට ද අයිතියක් තිබේ.

' ඒ වුනත්. ජේන් ඇන්ජෙලාට ගොඩාක් කැමැතියි. '

ග්ලැඩිස් එසේ කියද්දීම මිරාබෙල් කෝපයෙන් මුමුණමින් කාමරයෙන් පිටව ගියා ය.

Scanned with CamScanner

sinhalaebooks.com



'ග්ලැඩිස්. ඔයා දන්නවද ?. මම කියන දේ ජේන් ට කරන්නම වෙනවා. ඇන්ජෙලා කියන දේට වඩා මම කියන දේ අහන්න ජේන් ට සිද්ධ වෙනවා. ඒ ඇයි කියලා මම දැන්ම ඔයාට කියන්නේ නෑ. හරිද ග්ලැඩිස්.'

එසේ කියූ මිරාබෙල් ජේන් ව සොයාගෙන ගියා ය. පිට්ටනිය අසලදි ඇයට ජේන් ව හමුවූයේ ය.

' හායි ජේන්... විනාඩියකට මෙහාට එනව ද ?.'

ජේන් දාහතර හැවිරිදි ගැහැණු ළමයෙකි. කුඩා. එහෙත් ක්‍රියාශීලි සිරුරක් ඇති ඇය සිනාවෙන් මුව පුරවා ගෙන මිරාබෙල් අසලට දුව ගියා ය. මිරාබෙල් තමාට කථා කරන්නේ තමා තුන්වැනි වාරයේ ලක්‍රොස් කණ්ඩායමට තෝරාගත් සුබ ආරංචිය පවසන්නට යැයි ජේන් ගේ යටි හිත ඇයට කියයි. ඒ නිසාදෝ ඇගේ මුහුණ සිනාවෙන් විකසිතව ඇත. එහෙත් මිරාබෙල් කෙලින්. එමෙන්ම දැඩි හඬකින් ඇයට කියුවේ වෙනත් දෙයකි.

' ජේන්. ඊළඟ සති දෙක තුන තිස්සේම ඔයාට ටිකක් වැඩිපුර පුහුණු වෙන්න සිද්ධ වෙනවා. හොඳට පුහුණු වුනොත් ඔයාගේ දක්ෂකම් තවත් වැඩිවෙයි කියලා මට හිතෙනවා. ඒ හින්දා මේ සතියේ ඉඳලම අපි ඒ පුහුණුව පටන් ගනිමු. මට ඔයාට කියන්න තවත් කාරණාවක් තියෙනවා. ඔයා ඇන්ජෙලා ගේ ඉරුණු ඇඳුම් මහනවා කියලා මට ආරංචි වුනා. ඔයා ඒ වගේ වැඩ කරන්න ඕනෑ නෑ. ඒක නීති විරෝධී වැඩක්. ඔයා ඒ ගැන දන්නවද ?.'

' අනේ. මම ඒකට කැමැතියි. අනික මම ඇන්ජෙලාට වඩා හොඳට මහන්න දන්නවා. ඉතින් මම එයාට ඒ වගේ උපකාරයක් කරන එක වරදක් නෙවෙයි කියලා මට හිතෙනවා.'

ජේන් සිහින් හඬකින් තෙපලුවා ය. ඇගේ කටහඬෙහි කිසියම් තිගැස්මක් තිබෙන්නාක් මෙනි.

' ඒකට කමක් නෑ. හැබැයි ඔයා ක්‍රීඩාවට මුල් තැන දෙන්න

Scanned with CamScanner

sinhalaebooks.com



ඕනෑ. අනික මම තමයි මේ ඉස්කෝලේ ක්‍රීඩා නායිකාව. ඒ නිසා ක්‍රීඩිකාවන්ගේ දක්ෂකම් උපරිම විදිහට තියාගන්න ක්‍රියාකරන එක මගේ වගකීම කියන එකත් අමතක කරන්න එපා.'

මිරාබෙල් ස්ථිර ලෙස එසේ කියද්දි ජේන් ගේ හිතට නැගුනේ සතුටකි. පාසලේ ක්‍රීඩා නායිකාව විසින් තමාගේ දක්ෂතාවයන් අගය කිරීම ඇයට අදහා ගන්නට බැරි තරම් සතුටට හේතුවකි.

' හොදයි. මම පුළුවන් තරම් හොදට සෙල්ලම් කරන්නම් මිරාබෙල්. ඒ වුනත් මේ වාරය පුරාම ඇන්ජෙලා ගේ ඉරුණු ඇඳුම් මහලා දෙනවා කියලා මම එයාට පොරොන්දු වුනා. මම කොහොමද ඒ පොරොන්දුව කඩන්නේ ?.'

'කරන්න දෙයක් නෑ. ඔයාට ඒ වැඩේ කරන්න බෑ කියලා ඇන්ජෙලා ට කියන්න.'

මිරාබෙල් දැඩි හඬකින් කීවා ය. තමන් කියන දේට පිටින් වෙන කිසිම දෙයක් කථා කරනවාට ඇය කොහෙත්ම කැමැති නැත.

'ඒ වුනත් මම එහෙම දෙයක් කළොත් ඇන්ජෙලාට ගොඩාක් තරහ යයි. අනේ මම හිතන්නේ එයා හරිම ලස්සන ළමයෙක්. ඔයාට එහෙම හිතෙන්නේ නැද්ද මිරාබෙල් ?.'

ජේන් බයෙන් මෙන් ඇසුවා ය. ඇගේ හිත දෙගිඩියාවකට පත්ව ඇති සෙයකි.

'ඇන්ජෙලා ට මොනවා වුනත් එයා ඔයාට මොන දේ කීවත් මට කිසිම වැඩක් නෑ තේරුනාද ජේන් ?. මම යි ඔයාගේ ක්‍රීඩා නායිකාව. ඔයා අහන්න ඕනෑ මම කියන දේ. ඔයා ඒ දේවල් අහන්න කැමැති නැතිනම් ඔයාට හතර වැනි වසරේ ලැක්‍රොස් කණ්ඩායමට සෙල්ලම් කරන්න ලැබෙන්නේ නෑ කියන එකනම් සහතිකයි. මම කියන දේ ඔයාට තේරෙනවා නේද ජේන් ?.'

මිරාබෙල් ගේ කටහඬ තියුණු ය. තීරණාත්මක ය. එසේ

Scanned with CamScanner

sinhalaebooks.com



කියූ ඇය සැනෙකින් යන්නට ගියා ය. ජේන් පුදුමයෙන් මෙන් ඈ දෙස බලා සිටියා ය. ඇගේ දෑසින් කඳුළු වැල් කඩා හැලේ. මිරාබෙල් කියූ වචන ඇගේ දෙකන් පෙති සිදුරු කරන්නාක් මෙනි. ජේන් මිරාබෙල් ට දැඩි සේ ගරු කරන්නී ය. ඒ හා සමානවම ඇය ඇන්ජෙලා ට ද ආදරය කරන්නී ය. ඇන්ජෙලා ට තිබෙන්නේ මොන තරම් ලස්සන සිනාවක් ද?. ඇය කථා කරන්නේ මොන තරම් ලස්සන දේවල් ද?. ඇයගේ පාඩම් කාමරය බෙදා හදාගෙන සිටින අනිත් ගැහැණු ළමයා වන ඇලිසන් ද අපූරු ගැහැණු ළමයෙකි. මෙවැනි සිතුවිලි රැසක් ම සිත තුළ තෙරපෙද්දී ජේන් තම යෙහෙළිය වන සැලී ව සොයා ගොස් තමන්ගේ දුක් ගැනවිල්ල ඇයට ඉදිරිපත් කළා ය. ජේන් කියූ දේ සාවධානව අසා සිටි සැලි අන්තිමේදී මෙසේ කීවා ය.

ජ 'හොඳයි ජේන්. මට හිතෙන්නේ මොනව ද දන්නව ද?. ඔයා ඊළඟ අවුරුද්දේ ලක්‍රොස් කණ්ඩායමට සෙල්ලම් කරන්න හිතාගෙන ඉන්නව නම් මිරාබෙල් කියන දේවල් කරන්න වෙනවා. ඔයා ඇන්ජෙලාව හම්බ වෙන්න ගිහිං සිද්ධ වුන හැම දේම එයාට පැහැදිලි කරලා දෙන්නකෝ. එහෙම වුනාම මේ ප්‍රශ්නය විසඳ ගන්න පුළුවන් කියලා මට හිතෙනවා. අනික ඇන්ජෙලා හරිම අපූරු ළමයෙක් නේ. ඒ හින්දා ඔයා කියන දේවල් එයා පිළිගනියි. කොහොම වුනත් මේ තියෙන තත්ත්වයට අනුව නම් ඔයා ඇන්ජෙලා ගේ ඉරුණු ඇඳුම් මහන්න යන එක හොඳ වැඩක් නෙවෙයි.'

'ආ... සැලී ඇත්තටම ඔයාගේ අදහස නම් නියමයි. මම මේ කථාව කීවම ඇන්ජෙලාට තරහ යන්නේ නැතිවෙයි කියලා මට හිතෙනවා. සැලී ඔයා දන්නවද ?. ඇන්ජෙලා හරිම අපූරු ළමයෙක්. මම මේ කථාව කීවම ඇන්ජෙලා ට තරහ ගියොත් නම් මට ගොඩාක් දුක හිතෙයි.'

'අද ඔයා ඇන්ජෙලාට තේ හදන්න යනවනේ. එත්කොට මේ කථාව එයාට කියන්න.'

Scanned with CamScanner

sinhalaebooks.com



සැලි නැවතත් කීවා ය. එදා හවස් වරුවේ තේ සැදීම සඳහා ජේන් ඇන්ජෙලා ගේ කාමරයට ගියා ය. තමාට සිදුව ඇති දේ ගැන ඇය සිහින් කටහඬකින් ඇන්ජෙලා ට කියන්නට පටන්ගත්තා ය.

' ඇන්ජෙලා. මාත් එක්ක තරහා වෙන්න එපා. අදින් පස්සේ මට ඔයාගේ ඇඳුම් මහන්න වෙන්නේ නෑ. ඒ හින්දා මම ඒවා ඔයාට ආපහු දෙන්නම්. ඇත්තටම මම අද වෙනකොට ඔයාගේ ගොඩාක් ඇඳුම් මහලා ඉවරයි. '

'ඔයාට ස්තුතියි ජේන්.'

එසේ කියූ ඇන්ජෙලා ඉතාම සුන්දර සිනාවක් ජේන් දෙසට විසි කළා ය. ජේන් ගේ හිතට සතුටක් ඇතිවූයේ නිරායාසයෙනි. ඒ නිසා ඇය නැවතත් ඇන්ජෙලා ට මෙසේ කීවා ය.

' ඒ වුනත් ඇන්ජෙලා අදින් පස්සේ මට ඔයාගේ ඇඳුම් මහලා දෙන්න පුළුවන් වෙයි ද කියලා කියන්න අමාරුයි.'

ඇන්ජෙලා ගේ මුහුණ කෝපයෙන් කළු වූයේ නිරායාසයෙනි. ඈ කෝපයෙන් මෙන් ජේන් ගෙන් මෙසේ ඇසුවා ය.

'මොකද ඔයා එහෙම කියන්නේ ?. හැමදාම මගේ ඇඳුම් මහලා දෙනවා කියලා ඔයා මට පොරොන්දු වුනා. මතකද ජේන් ?.'

ඇත්ත තමයි ඇන්ජෙලා. ඒ වුනත් අද මට මිරාබෙල් කථා කළා. එයා මට කීවා. ඇත්තටම එයා මට කීවා....'

ජේන් ගේ කටහඬ ගොත ගැසෙන්නාක් මෙනි. ඇයගේ කථාවට පෙර ඇන්ජෙලා කෝපයෙන් බෙරිහන් දුන්නා ය.

'ආ... ඇත්තටම එයා කියන්න ඇත්තේ මොකක් ද කියලා මට හිතාගන්න පුළුවන්. ඔයා හරිම දක්ෂ ක්‍රීඩිකාවක්. ඔයා ගොඩාක් ප්‍රැක්ටිස් කරන්න ඕනෑ. ඒ හින්දා ඇන්ජෙලා ගේ කමකට නැති

Scanned with CamScanner

sinhalaebooks.com



වැඩ කරන්න යන්න එපා. මම කියන දේ ඔයා අහන්නේ නැතිනම් තරඟ වලට සෙල්ලම් කරන්න ලැබෙන්නේ නෑ. අන්න ඒ වගේ කථා ගොඩාක් මිරාබෙල් ඔයාට කියන්න ඇති. ඒ ගැන කිසිම සැකයක් නෑ.'

ඇන්ජෙලා ගේ කෝපාන්විත කටහඬ නිසා ජේන් වඩාත්ම අපහසුවට පත්වූවා ය. ඈ සැලෙන හඬකින් මෙසේ කියූවා ය.

'අනේ ඇන්ජෙලා ඔයා විදිහට කථා කරන්න එපා. එහෙම කථා කරන එක වැරැදියි. ඇත්තටම එයා ඔයාට විරුද්ධව එක වචනයක්වත් කීවේ නෑ. ඒ වුනත් මිරාබෙල් කියන්නේ අපේ ක්‍රීඩා නායිකාව නේ. එයා කියන දේවල් අහන එක වැරැද්දක් ද?'

'අනේ මන් දන්නේ නෑ. මිරාබෙල් හයියෙන් බෙරිහන් දීලා කියන දේවල් හැම දෙනාම අහන්නේ මොකද ?. මට නම් ඒ ගැන හිතාගන්නවත් බෑ. අනික එයා හැම වෙලාවෙම හිතන්නේ සෙල්ලම් ගැන විතරයි. සෙල්ලම්. සෙල්ලම්. එයාට පිස්සු හැදිලද කියලා මට වෙලාවකට හිතෙනවා.'

ඇන්ජෙලා කෝපයෙන් බෙරිහන් දෙද්දි ජේන් තවත් අසීරුවට පත් වූවා ය. ඈ සිහින් ලෙස කථා කරන්න. ට උත්සාහ කළා ය.

' ඒ වුනත් ඇන්ජෙලා සෙල්ලම් කරනවා කියන්නේ මොන තරම් හොද දෙයක් ද?. අපි සෙල්ලම් කරන කොට කණ්ඩායම් හැඟීම කියන එක හිතට දැනෙනවා. ඒ වගේම නිරෝගි ශරීරයක් හදා ගන්නත් ක්‍රීඩා කරන එක ගොඩාක් හොද දෙයක් කියලා මට හිතෙනවා. එතකොට...'

ජේන් ට තම කථාව අවසන් කරන්නට අවස්ථාවක් ලැබුනේ නැත. ඇන්ජෙලා ගේ කෝපාන්විත කටහඬ කාමරය පුරා පැතිර ගියේ ය.

' ජේන්. මට අවවාද කරන්න එන්න එපා. ඔයා කිසිම

Scanned with CamScanner

sinhalaebooks.com



වැදගැම්මකට නැති පළමු වසරේ ළමයෙක් තේරුනා ද ? අනික ඔයා කරන්නේ මොනවද කියන එක ගැන දැන ගන්න මට කිසිම ඕනෑ කමක් නෑ. ඒ හින්දා ඔයා කැමැති නම් රැයක් දවාලක් නැතිව පිට්ටනියට ගිහිං දුවන්න. පනින්න. මට ඒ ගැන කිසිම තැකීමක් නෑ ඒ හින්දා කරුණාකරලා ඔට ටෝස්ට් ටික ඔතනම තියලා දැන්මම කාමරයෙන් යන්න. ඒ යන ගමන් වයලට් හිල් ට එන්න කියන්න. අද ඉඳලා ඔයා කරපු දේවල් මම වයලට් ට කියලා කරගන්නම්. හ්ම්.. දැන්මම යන්න.'

ජේන් ගේ හිත කඩා වැටුනේ ය. මෙතරම් ලස්සන එමෙන්ම කරුණාවන්ත හදවතක් ඇතිව සිටිනවා යැයි තමා විශ්වාස කළ ඇන්ජෙලා දරුණු වූයේ කෙසේ දැයි ජේන් ට සිතාගත නොහැකි ය. තමාව එළවා ගත් ඇය දැන් මෝඩ වයලට් හිල් ට එන්නට කියා ඇත. කිසිම සැකයක් නැත. තමාගේ සෝබන සිනාවෙන් වයලට් ද රවටා ගන්නට ඇන්ජෙලා ට අපහසුවක් නැත.

ජේන් කඳුළු සලමින් කාමරයෙන් පිටවූවා ය. තවත් විනාඩි කිහිපයක් ගතවෙන්නට පෙර වයලට් හිල් ඇන්ජෙලා ගේ කාමරයට දුවගෙන ආවා ය. ඇන්ජෙලාගේ ආරාධනාව වයලට් ගේ හිතට දැඩි සතුටක් ගෙන දුන්නාක් මෙනි. ඒ සතුට ඇගේ මුහුණෙන් ම දැකගත හැකිය. ඇන්ජෙලා තමාගේ කම්මැලි කටහඬෙන් කියූ සෑම දෙයක්ම වයලට් පිළිගත්තේ හිස් මුදුණෙනි.

ඇලිසන් කාමරයට ආවේ තවත් බොහෝ වෙලාවකට පසුවයි. මෙතෙක් දිනක් තමන් ගේ වැඩ කළ ජේන් වෙනුවට දැන් සිටින්නේ වයලට් ය. ඈ පුදුමයෙන් මෙන් මෙසේ ඇසුවා ය.

'කෝ අපේ හරිම කීකරු ජේන් ?.'

සිදුවූ දේ ගැන ඇන්ජෙලා ඇලිසන් ට කෙටියෙන් පැවසුවා ය. ඔවුන්ගේ කථාවට වයලට් ද උනන්දුවෙන් සවන් දුන්නා ය. ජේන් ට සිදුවූ දේ ගැන වයලට් ගේ හිතට ලොකු සතුටක් දැනේ.

Scanned with CamScanner

sinhalaebooks.com



මේ ලැබී තිබෙන්නේ අපූරු අවස්ථාවකි. තමා කොතරම් හොඳ ළමයෙක් දැයි ඇන්ජෙලාට වටහා දිය යුතු යැයි වයලට් කල්පනා කළේ ඒ නිසා ය.

තමන් ගේ රාජකාරිය නිමා කළ වයලට් කාමරයෙන් පිටව ගියා ය. මෙතෙක් වෙලාවක් නිහඬව සිටි ඇලිසන් කථා කරන්නට වුයේ ඉන් පසුවයි.

'ඔයා මේ දේවල් වයලට් ඉස්සරහා කියපු එක නම් හොඳ වැඩක් නෙවෙයි. ඇත්තටම ජේන් ඔයාට මොන තරම් කීකරුව හිටිය ද කියලා දන්නව නේද ?''

'කවුරුත් මට කීකරුව වැඩ කරනවා. ඒ ගැන මට කිසිම සැකයක් නෑ.'

ඇන්ජෙලා නැවත වතාවක් උජාරුවෙන් කීවා ය. තවත් ටික වෙලාවක් නිහඬවම ගෙවී ගියේ ය. ඇලිසන් කථා කළේ ඉන් පසුවයි.

' ඇන්ජෙලා. ඔයා මේ පුංචි ළමයි. හරිම මෝඩ ළමයි බවට පත් කරනවා. හැබැයි ඔයා ඒ අයට ගොඩාක් හොඳට සළකනවා කියලා නම් මට කියන්න බෑ. ඔයා හරිම අපූරු ගැහැණු ළමයෙක් කියලා පුංචි පන්තිවල ළමයින් කල්පනා කරනවා. ඔයා හැසිරෙන විදිහෙන් නම් ඒ වගේ දෙයක් ගැන ළමයින්ට හිතන්නවත් බෑ. ඔයා බැනපු හැටි මතක් වෙනකොට ජේන් හොඳටම අඬන්න ඇති. ඔයා දන්නවද ? ඒ වගේ දේවල් මේ ඉස්කෝලේ සිද්ධ වෙනවට මිස් තියෝබෝල්ඩ් ටිකක් වත් කැමැති නෑ.'

ඇන්ජෙලා ගේ මුහුණ අමනාපයෙන් සහ කෝපයෙන් කළු විය. කිසිවෙක් තමාගේ වරදක් දකිනවාට ඇන්ජෙලා කොහෙත්ම කැමැති නැත. ඈ ඇලිසන් දෙස බලා සිටියේ ද ඒ නොකැමැත්තෙනි. එහෙත් අවසානයේදි ඇන්ජෙලා කිසියම් දෙයක් තේරුම් ගත්තාක්

Scanned with CamScanner

sinhalaebooks.com



මෙනි. ඇ තමා සතුව ඇති සිහින් එමෙන්ම කපටි ම කටහඬෙන් ඇලිසන් ට මෙසේ කීවා ය.

'ඇත්තමද ඇලිසන් ?. ඔයා කියන්නේ ඇත්තම ද? සමහර අය ගොඩාක් අපූරුයි කියලා ඔයා කල්පනා කරන්නේ කොහොම ද?. අනිත් එක තමයි ඔයා මිස් විල්කොක්ස් ව අදහනවා කියලත් මම දන්නවා. ඒක නෙවෙයි ඇයි ඔයා මිස් විල්කොක්ස් ගේ ගැඹුරු කටහඬ අනුකරණය කරන්න උත්සාහ කරන්නේ නැත්තේ ?. ඔයා එහෙම කළොත් මට ඇති තරම් හිනාවෙන්න පුළුවන්.'

ඇන්ජෙලා ගේ සමච්චල් සහගත කථාව නිසා ඇලිසන් ගේ හිත දැඩිසේ රිදුණේ ය. තමා දැඩිසේ ඇලුම් කරන කවරෙකු හෝ තමාගේ හිත රිදවන්නේ නම් එය ඇලිසන් ගේ හිතට දරාගත නොහැකි දුකකි.

'ඇන්ජෙලා ඔයා දන්නව ද?. මිස් විල්කොක්ස් කියන්නේ හරිම අවංක ගුරුවරියක්. අන්න ඒ නිසයි මම එයාට කැමැති. අනික ඔයා ඉංග්‍රීසි සාහිත්‍යයට කැමැති නෑ. ඒ විතරක් නෙවෙයි ඔයා තමන් ගේ රූපය ගැන ඇරෙන්න වෙන කිසිම දෙයක් ගැන උනන්දු වෙන්නේ නෑ. අන්න ඒ නිසා මම මිස් විල්කොක්ස් ට කැමැති ඇයි කියන එක ගැන ඔයාට කිසිම වැටහීමක් නෑ.'

' පො හ් .... '

ඇන්ජෙලා උතුරා යන කෝපයෙන් යුතුව තමන්ගේ මුවෙන් අමුතු හඬක් පිට කළා ය. ඉන්පසුව සවස් යාමය ගතවෙන තෙක් ඇන්ජෙලා සහ ඇලිසන් කිසිවක් කථා කළේ නැත. ඒ නිහඬතාවය මැද ඇලිසන් මිස් විල්කොක්ස් වෙනුවෙන් ඉතාම දිගු ඉංග්‍රීසි රචනාවක් ලියුවා ය. කෙසේ වුවද එය ඉතාම හොඳ එමෙන්ම ප්‍රීතිමත් සන්ධ්‍යාවක් වූයේ නම් නැත.

මේ සිදුවීමෙන් පසුව ඇන්ජෙලා තමන් ගේ තර්ජනය මිරාබෙල් ඉදිරියේ දිග හරින්නට අමතක කළේ නැත. එසේ වුවත්

Scanned with CamScanner

sinhalaebooks.com



ඇය කෙලින්ම ගොස් මිරාබෙල් ව හමුවන්නට නම් බය වූවාය මිරාබෙල් ගේ නපුරු කම ගැන ඇන්ජෙලා ට අමුතුවෙන් හඳුන්වා දිය යුතු නැත.

හවස් වරුව පුරාම කිසිම කථා බහක් නොමැතිව සිටි ඇන්ජෙලා සහ ඇලිසන් අවසානයේදි නැවතත් තම හිත්වල තිබු නොහොඳ නෝක්කාඩුව සෝදා දමා ගත් හ. ඇලිසන් ට මෙන්ම ඇන්ජෙලාට ද එකිනෙකාගෙන් තොරව ජිවත් විය නොහැකි ය. ඒ බව ඔවුන් දෙදෙනාද ඉතාම හොඳින් දනිති. මේ හේතු නිසා ඔවුන් දෙදෙනාම තරහා වූ සැනින් ම සියල්ල අමතක කොට නැවතත් හිතවත් වෙති.

Scanned with CamScanner

sinhalaebooks.com

# වැඩ වැඩියි විනෝදය අඩුයි

පස් වැනි වාරයේදී ඉතාම මහන්සියෙන් ඉගෙන ගන්නට සෑම දෙනාටම සිදුවෙයි. මිස් කෝන්වෙලිස් ද කිසිම බුරුලක් නොපෙන්වා ම ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු මෙහෙය වන්නීය. අභ්‍යාස සහ පාඩම් මාලා ඉහටත් උඩින් ගොඩ ගැසී ඇති බව පැටි ට වැටහෙයි. මිස් විල්කොක්ස් ද ඔවුන් ගේ පාඩම් වලින් වැඩි කොටසක් හිස මුදුනේ තබාගෙන සිටින්නාක් මෙනි. වෙනකක් තබා පාසලේ විදුහල්පතිනිය වන මිස් තියෝබෝල්ඩ් ද පාඩමක් දෙකක් කියා දෙන්න ට ඉදිරිපත් වූවා ය මේ සෑම දෙයකින්ම සිද්ධ වූයේ පංතිය පුරාම ඉතා කාර්ය බහුල පරිසරයක් නිර්මාණය වීම සහ ගැහැණු ළමුන් ගජරාමෙට වැඩ කිරීම පමණි.

මැඩමොසෙල් ද කිසිම බුරුලක් නොපෙන්වූවා ය. ඇගේ පංතිය ආරම්භ වෙද්දි ගැහැණු ළමයින්ගේ හිත් වලට මහා බරක් දැනෙන්නාක් මෙනි. අනිත් සෑම දෙයකටම වඩා මැඩමොසෙල්

Scanned with CamScanner

sinhalaebooks.com



ගේ ප්‍රංශ කවි පාඩම් කිරීම නම් පංතියේ කිසිවෙකුටවත් ප්‍රිය මනාප එන්දෑකීමක් වූයේ නැත.

' මේක නම් හරිම අමාරු වැඩක්. ගණන් හදන්න. සිතියම් අඳින්න. ප්‍රංශ කවි කට පාඩම් කරන්න. රචනා ලියන්න. මේ හැම දේම කරන්න ගියොත් වැඩි දවසක් යන්න ඉස්සර වෙලා අපි හැමෝම ලෙඩ වෙයි.'

එක දවසක් බොබී නොමනාපයෙන් මෙන් කෙඳිරි ගෑවා ය. එයට පැම් ගෙන් ලැබුනේ මෙවැනි පිළිතුරකි.

' එහෙම කියන්න එපා. ඔයා නිලියක් වෙන්න හිතාගෙන ඉන්නවා කියලා හිතමුකෝ. එහෙමනම් ඔයාට නාට්‍ය වල දෙබස් කට පාඩම් කරන්න වෙනවනේ.'

'ඔයාලා දන්නවද වැඩක් ?. මම මොකක් හරි කොටසක් නාට්‍යයක වගේ හයියෙන් රඟ පාලා කීවොත්. මට එකපාරටම මතක හිටිනවා. ඊට පස්සේ මට කවදාවත් ඒ වචන අමතක වෙන්නේ නෑ. එහෙම නැතිව පොත මුල ඉඳලා අගට කීවත් එක වචනයක් වත් පාඩම් හිටින්නේ නම් නෑ.'

එසේ කීවේ ඩොරිස් ය. පැම් තමාගේ මලානික දෑසින් ඈ දෙස බලා මෙසේ කීවා ය.

' අන්න ඒක හොඳ අදහසක් ඩොරිස්. ඔයා වචන ටික රඟපානවා වගේ හයියෙන් කියන්න. හරි මෙන්න මේ ප්‍රංශ කවිය ගන්නකෝ. ඒක හරිම ලස්සන ගම්බද ප්‍රදේශයක් ගැන කියවෙන එකක්. අපිට මැඩමොසෙල් කියලා දුන්නා මතක ද?. මේ කවිය හයියෙන් කියවන්න. එළදෙන්නු. ඒ වගේම බැටළුවෝ කෑ ගහන හැටි රඟපාලා පෙන්වන්න. එතකොට බැටළු පැටවු සෙල්ලම් කරන හැටිත් ලස්සනට රඟපාන්න ඔයාට පුළුවන් නේ. තාරාවෝ පිහිනන හැටි ලස්සනට පෙන්නන්නත් ඔයාට පුළුවන්. තේරුනාද ඩොරිස් ?. ඔයා මේ විදිහට කළොත් කිසිම අමාරුවක් නැතිව කවිය පාඩම්

Scanned with CamScanner

sinhalaebooks.com



කරගන්න පුළුවන් වෙයි කියලා මට හිතෙනවා.'

පැම් ගේ උපදෙස ඩොරිස් අපූරුවට පිළිපැද්දා ය. ඒ අතර පැට් සහ ඉසබෙල් පැම්ගෙන් පොතක් ඉල්ලාගෙන යන්නට ඇගේ කාමරය අසලට ආවෝ ය. ඔවුන්ගේ සිත් පුදුමයෙන් පිම්බෙන්නට එතරම් වෙලාවක් ගියේ නැත. ඩොරිස් ඉතාම අපූරුවට රඟපාමින් ප්‍රංශ කවියක් පාඩම් කරයි. ඇය මොන තරම් අපූරුවට ඒ දෙය කරන්නේ ද ?. පැට් සහ ඉසබෙල් මොහොතක් නතර වී ඒ දෙස බලා සිටියෝ ය.

ඩොරිස් කවිය හඬ නගා ගායනා කරයි. ඒ අතරම කවියේ තිබෙන සමහර අවස්ථාවන් රඟපාන්නටද ඇය අමතක කළේ නැත. බැටළුවන් ඇවිදින ආකාරය. එළදෙනුන් වමාරා කන ආකාරය. තාරාවෝ පිහිනා යන ආකාරය ඇය ඉදිරිපත් කළේ මොන තරම් අපූරුවට ද ? සත්තකින්ම ඩොරිස් අති දක්ෂ රංගන ශිල්පිනියක් මෙන් තම රංගනය ඉදිරිපත් කළා ය.

පැට් සහ ඉසබෙල් ඇති තරම් සිනාසුන හ. නීරස එමෙන්ම බැරෑරුම් ප්‍රංශ කවියක් ඩොරිස් විසින් සැහැල්ලු එමෙන්ම සිත්ගන්නා සුළු රංගනයක් බවට පත්කොට ඇති ආකාරය මොන තරම් අපූරු ද ?. ඩොරිස් තම රංගනය නිමාකොට පුටුව මත වාඩි වූවා ය. ඒ සමඟ පැම් ඇගෙන් මෙසේ ඇසුවා ය.

' ඩොරිස්. දැන් ඔයාට ඒ කවිය මතක ද ?.'

ඩොරිස් මුහුණ මදක් ඉහළට හරවා කල්පනා කළා ය.

'ම්....ම්....ඒ කවිය මෙන්න මෙහෙමයි පටන්ගත්තේ.'

මොන පුදුමයක් ද ? ඩොරිස්ට කවිය සම්පූර්ණයෙන්ම කටපාඩම් ය. මෙයට පෙර නිකම් පොත දෙස බලා කියවන විට පාඩම් නොවූ කවිය නාට්‍යයක් මෙන් රඟපාද්දී ඇයට පාඩම් වූ ආකාරය නම් සැබෑම පුදුමයකි.

Scanned with CamScanner

sinhalaebooks.com



'නියමයි. දැන් ඔයාට කවිය පාඩම්. ආයේ ඔයාට ඒක අමතක වෙන්නේ නෑ. හෙට උදේ ඔයා කවිය කියනකොට මැඩමොසෙල්ටත් ගොඩාක් පුදුම හිතෙයි.'

පැමී උතුරා යන සතුටෙන් යුතුව කීවා ය. කවිය පාඩම් වූවද පසුදින වනවිට ප්‍රංශ අභ්‍යාස නිවැරදිව කරගෙන යන්නට නම් ඩොරිස් අසමත් වූවා ය. ඇගේ සටහන් පොත පුරා තිබූ වැරදි උත්තර හරහා මැඩමොසෙල්ගේ තද තිල් පැහැති පැන්සලෙන් ලොකු වැරදි ලකුණු රැසක්ම සටහන් විය. එය සත්තකින්ම මැඩමොසෙල් ගේ මෙන්ම ඩොරිස් ගේ ද හිත රිදෙන කාරණාවකි.

' අනේ... අනේ... ඩොරිස්. මම මොන තරම් මහන්සි වුනත් ඔයාගෙන් නම් කිසිම වැඩක් නෑ කියලා මට හිතෙනවා. මෙහෙම ගියොත් නම් මම ඔයාව ගොඩාක් දරුණු විදිහට පාලනය කරනවා තේරුනා ද?'.

මැඩමොසෙල් ගේ කටහඬ කෝපයෙන් මෙන්ම අමනාපයෙන් බරවෙලා ය. 'මමත් එයාව දරුණු විදිහට පාලනය කරනවා' යනුවෙන් බොබී සිහින් හඬෙන් කියද්දි මැඩමොසෙල් බොබී දෙස ද අමනාපයෙන් බලා මෙසේ කීවා ය.

' අනික මේ වාරෙදි ගොඩාක් මහන්සිවෙලා වැඩ කරන්න ඕනෑ කියලා මම හැමදෙනාටම මුලින්ම කීවා. ඒ වුනාට ඔයාගේ කිසිම උනන්දුවක් නෑ. ඇත්තටම ඩොරිස් ඇයි ඔයා මොන්ටිසෝරි පංතියට යන්නේ නැත්තේ ?. ඔයාට තවම ප්‍රංශ අකුරු උච්චාරණය කරන්න බෑ. අනිත් අයට පුළුවන් නම් ඇයි ඔයාට බැරි ?. ඔයානම් හරිම නරක ඒ වගේම මෝඩ ළමයෙක් ඩොරිස්.'

' සහතිකයි මැඩමොසෙල්.'

ඩොරිස් සමච්චලයට මෙන් කියද්දි මැඩමොසෙල්ගේ මුහුණ කෝපයෙන් පිම්බුනේ ය. සමහර අවස්ථාවලදි ඩොරිස් ගේ විහිළුවලට මැඩමොසෙල් කැමැති වුවද මේ වෙලාවෙදි නම් ඇගේ කෝපය

Scanned with CamScanner

sinhalaebooks.com



දෙගුණ තෙගුණ කරන්නට තරම් ඒ විහිළුව සමත් වූවාක් මෙනි.

'ආ.. ඔයා මට විහිළු කරන්නත් එනව ද? ඔයා එහෙම කියන්නේ මට සමච්චලේට. මොකද ඩොරිස් ඔයාගේ උගුරේ බටර් තලියක් වත් හිර වෙලා ද?.'

මැඩමොසෙල් ගේ කෝපාන්විත කටහඬ පංතියේ ගැහැණු ළමයින් ගේ මුව මත ඉඟි බිඟි සිනා නංවන්නට සමත් විය. ඒ අතර බොබී මැඩමොසෙල් කියූ දේ නිවැරැදි කරන්නට උත්සාහ කළා ය.

' මැඩමොසෙල්. ඔයා කියපු දේ වැරදියි. බටර් තලියක් උගුරේ හිරවුනාට කිසිම දෙයක් වෙන්නේ නෑ. ඒක අපූරුවට දිය වෙලා යයි.'

මැඩමොසෙල් ගේ කෝපය ඉහ වහා ගියේ ය. ඈ බොබී දෙසට හැරී මෙසේ කිවා ය.

' බොබී. මම කියන දේවල් වලට කට දාන්න එන්න එපා. ඔයා හැම වෙලාවෙම මට බාධාකරනවා. හ්ම් ඩොරිස් නැගිටින්න.'

ඩොරිස් තමන්ගේ ආසනයෙන් නැගිට්ටාය. ඇගේ දෙතොල වෙවුලයි. පංතිය නිම වූවාට පසුව මේ සිදුවීම රඟපා පෙන්වුවහොත් ගැහැණු ළමයින් මොන තරම් හයියෙන් සිනාසෙනු ඇති දැයි ඇයට සිතා ගත නොහැකිය. ඒ අතර මැඩමොසෙල් අමනාපයෙන් මෙන් මෙසේ කීවා ය.

'ඩොරිස්. ඔයා ලියන දේවල් හරිම නරකයි. ඒ හින්දා දැන් ඔයා කියන දේවල් කොහොමද කියලා බලන්නයි මම සූදානම් වෙන්නේ. ඔයා මම කියලා දුන්නු ප්‍රංශ කවිය පාඩම් කළා ද?. හරි එහෙම නම් මම ඒ කවිය අහන්න ලෑස්තියි. පටන් ගන්න.'

ඩොරිස් සුළු මොහොතක් කල්පනා කළා ය. වටපිට බැලුවා ය. කවියේ සෑම සිදුවීමක් ම සිතුවම් පටක් මෙන් ඇයට සිහිපත් වෙයි. එහෙත් කවිය කියන්නේ කෙසේ ද ?. ඩොරිස් ගේ හිත

Scanned with CamScanner

sinhalaebooks.com



දෙගිඩියාවට පත්වෙද්දි ඇ අසල සිටි පැම් මෙසේ කීවා ය.

' මැඩමොසෙල්. ඩොරිස් කවිය පාඩම් කළා. එයා පොත බලන්නෙවත් නැතිව කවිය කියනවා මම අහගෙන හිටියා.'

'එහෙනම් දැන් ම පටන් ගන්න. මමත් ඒක අහන්න කැමැතියි. පටන්ගන්න ඩොරිස්.'

මැඩමොසෙල් කීවා ය. පැම් වාඩිවී සිටින්නේ ඩොරිස් අසලමය. ඒ නිසා ඇ කවියේ පළමු වචන කිහිපය ඩොරිස්ට මුමුණා කීවා ය. ඩොරිස් කවිය ආරම්භ කරන්නට උත්සාහ කලා ය. එහෙත් රඟපාන අවස්ථාවේදි පමණක් ඇයට කවිය මතකය. එසේ නොමැතිව කවියේ එක වචනයක් හෝ කියන්නට තරම් මතකයක් ඩොරිස් ට නැත. ඇගේ සිත දෙගිඩියාවකට පත්වූයේ නිරායාසයෙනි. මැඩමොසෙල් ඉදිරියේ කවියට රංගනයක් ඉදිරිපත් කරන්නේ කෙසේ ද?. තමා ප්‍රංශ කවිය සමච්චලයට ලක්කරන්නට උත්සාහ කරනවා යැයි මැඩමොසෙල් කල්පනා කළහොත් සිදුවන්නේ මහා විනාශයකි. මෙවැනි සිතිවිලි සමුදායක්ම ඩොරිස් ගේ හිත තුළ තෙරපෙන්නට විය.

' ඉක්මන් කරන්න ඩොරිස්. මම බලාගෙන ඉන්නවා. ඔයාට මේ කවිය කියන්න පුළුවන් ද බැරිද කියලා විතරක් මට කියන්නකෝ.'

මැඩමොසෙල් නැවතත් නොඉවසිල්ලෙන් බෙරිහන් දුන්නා ය. ඩොරිස් සිහින් ලෙස මෙසේ කීවා ය.

' මට පුළුවන් මැඩමොසෙල්. ඒ වුනාට රඟපාලා කීවොත් විතරයි මට ඒ කවිය කියන්න පුළුවන්.'

' හරි ඉතින් රඟපාලා කියන්න. හැබැයි එකක් මතක තියාගන්න ඩොරිස්. ඔයා බොරුවක් කළොත් මම මේ ගැන ප්‍රින්සිපල්ට කියනවා. කවිය රඟපාලා කියන්න. හැබැයි එක වචනයක් වත් වරද්දන්න නම් එපා.'

Scanned with CamScanner

sinhalaebooks.com



ඉන්පසුව සිදුවූයේ අපූරු දෙයකි. ඩොරිස් හරිම ලස්සනට කවිය රඟපාමින් ගායනා කරන්නට වූවා ය. ගවයින් වමාර කන අන්දම. බැටළුවන් දුව පනින ආකාරය. තාරාවන් පිහිනා යන ආකාරය, ඇය ඉදිරිපත් කළේ මොන තරම් සිත්ගන්නා ආකාරයෙන් ද? ඒ අතර කවියේ එක වචනයක් හෝ අමතක නොකොට ගායනා කරන්නටද ඩොරිස්ට හැකිවිය.

ඩොරිස් ගේ අපූරු හැකියාව දෙස ගැහැණු ළමෝ පුදුමයෙන් මෙන්ම සතුටෙන් බලා සිටිති. එහෙත් මැඩමොසෙල් කෝපවෙතු ඇතිද යන දෙගිඩියාවද ඔවුන්ගේ සිත් වල නොතිබුනා නොවේ. ඒ අතර ක්ලෝඩින් සතුටෙන් බෙරිහන් කැගසා අත්පොඩි ගැසුවා ය. තමා පංතියේ සිටින බවක් වත් ක්ලෝඩින් ට මතක නැතුවා සේය. එයින් නොනැවතුණු ඇය හයියෙන් සිනාසෙන්නටද වූවා ය.

'අනේ නැන්දේ හරිම ලස්සනයි. ඩොරිස් හරිම ලස්සනට ඒ කවිය කීවා. අපිත් ඒ විදිහට කවි කියන්න පුරුදු වෙන්වා නම් ටිකක්වත් අමතක වෙන්නේ නෑ. ඇත්තමයි ඩොරිස් කියපු කවිය මට දැන් හොදට මතකයි.'

ක්ලෝඩින් එසේ බෙරිහන් දෙද්දි මැඩමොසෙල් තමාගේ උපැස් යුවල නාසය දිගේ ඉහළට තල්ලු කළා ය. එමෙන්ම ඇගේ මුහුණද වෙනස් විය. තවත් ටික වෙලාවකින් මැඩමොසෙල් ගේ දැවැන්ත සිනා හඬ පංතිය පුරාම පැතිර ගියේ ය. ඒ සිනා හඬත් සමඟ පංතියේ ළමුන් ටද කිසියම් සැනසිල්ලක් දැනෙන්නට විය. බොහෝ කාලයකට පසුව මැඩමොසෙල් සතුටෙන් හඬ නගා සිනාසෙන ආකාරය ඔවුන්ට පෙනේ.

ඇති තරම් සිනාසුන මැඩමොසෙල් උපැස් යුවල ගලවා ඉවත් කළා ය. ඉන්පසුව ඇය තම දෑස පිස දමා ගත්තාය. සිනාව නිසා මැඩමොසෙල්ගේ දෑසට කඳුළු ද නැගී ඇති සෙයකි.

'ඒක නම් හරිම අපූරු වැඩක් ඩොරිස්. ඇත්තමයි හරිම

Scanned with CamScanner

sinhalaebooks.com



අපූරු වැඩක්. ගොඩාක් අමාරු කවි මතක තියාගන්න පුළුවන් ලේසිම ක්‍රමය තමයි ඒ. කොහොම වුනත් ඔයා ඒ රඟපෑම හරිම ලස්සනට ඉදිරිපත් කෙරුවා. ඒ හින්දා ඔයාගේ වැරදි වැඩ වලට මම මේ පාර විතරක් සමාව දෙනවා. ඔයා කවිය පාඩම් කළා කියන එක ඇත්තක් කියන එක මම දැන් පිළිගන්නවා. ඒක ඇත්තටම අපිට හිතාවෙන්න තරම් විහිළුවක් නෙවෙයි නේද ක්ලෝඩින් ?.'

මැඩමොසෙල් ගේ අදහස ක්ලෝඩින් ද හිස සලා අනුමත කළා ය.

' ඉතින් ඇත්තටම අපිටත් ඒ විදිහට කවි පාඩම් කරන්න පුළුවන් නේ.'

ක්ලෝඩින් ගේ දෑස ප්‍රීතියෙන් බබලයි. එහෙත් ඇගේ අදහස නම් මැඩමොසෙල් අනුමත කළේ නැත.

'නෑ. අපි හැම දෙනාටම එහෙම කරන්න බෑ. ඩොරිස් ට නම් අපූරු හැකියාවක් තියෙනවා. එක ගැහැණු ළමයෙකුට එහෙම හැකියාවක් තිබුනට පංතියේ ඉන්න හැම දෙනාටම එහෙම කරන්න පුළුවන් කියලා හිතන එක මෝඩ කමක්. දැන් අපි කථා කළා හොඳටම ඇති. ළමයි බලන්නකෝ දැන් වෙලාව කීය ද කියලා. ඇත්තටම මේ ගොඩාන් නරක ඒ වගේම දක්ෂ ඩොරිස් හින්දා අපේ පාඩමේ භාගයක්ම නාස්ති කරලා. ඉක්මන් කරලා ඔයාලාගේ පොත් ටික අතට ගන්න.'

ඩොරිස් එක් වැදගත් දෙයක් වටහා ගත්තා ය. එනම් කිසියම් පාඩමක් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කළොත් පමණක් තමාට එය පාඩම් හිටින බවකි. නාට්‍යානුසාරයෙන් කියන සෑම දෙයක්ම ඉතා හොඳින් මතක හිටියි. සමහරු එය මෝඩ වැඩක් යැයි කීවද මිස් විල්කොක්ස් නම් ඒ අදහසට කැමැති ය. ඇය සෑම විටම ඩොරිස් ගේ ක්‍රියාවට අනුබල දුන්නා ය.

එසේ වුවත් මිස් කෝන්වෙලිස් ගේ පංතියේ දි හෝ මිස්

Scanned with CamScanner

sinhalaebooks.com



තියෝබෝල්ඩ ගේ පංතියේදී නම් මෙවැනි රඟපෑමක් කළ හැකි යැයි කිසිවෙකුත් විශ්වාස නොකළහ. කෙසේ වුවත් අවස්ථාවක් ලැබෙන සෑම අවස්ථාවකදීම පාඩම් පොත නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරන ලෙස ගැහැණු ළමෝ ඩොරිස් ආයාචනා කළ හ.

' මම එහෙම දෙයක් කළේ ඔයාලව හිනස්වන්න හිතාගෙන නෙවෙයි. ඇත්තටම මම පාඩම් ඉගෙන ගන්න දක්ෂයෙක් නෙවෙයි ඉතින් පැම් තමයි මට එහෙම දෙයක් කරන්න කියලා උපදෙස් දුන්නේ.'

ඩොරිස් කීවා ය. ඇයට පිළිතුරු ලැබුනේ ඉසබෙල් ගෙනි

'ඒ මොනව වුනත් ඔයා කරන වැඩ හින්දා ඕනෑම කෙනෙකුට හිතේ හැටියට හිනාවෙන්න පුළුවන්. ඇත්තටම මටත් ඒ වගේ දෙයක් කරන්න ආසා හිතෙනවා. ඒ වුනාට මම ඔයා තරම් දක්ෂ නෑ.

' මම ත් කවද හරි පොතක් ලියනවා. එහෙම නැතිනම් ලස්සන රූපයක් අඳින්න හිතාගෙන ඉන්නවා.'

ඇලිසන් ද කීවා ය. ඒ සමඟ ඈන් මාරි ද කථාව අතරට පැන්නා ය.

' ඇයි මම ත් එහෙම කරනවා. අපි හැමෝටම මොකක් හරි දක්ෂතාවයක් තියෙනවා තමයි. හැබැයි ඔයාලා හැම දෙනාටම වඩා හොඳ දක්ෂතාවයක් මට තියෙනවා.'

' ඩෙයඩ්‍රිගේ යාළුවෝ.'

ක්ලෝඩින් සමච්චල් සහගත ලෙස කීවා ය. ඒ අතර ඇලිසන් තවත් අපූරු දෙයක් සොයාගත්තා ය. එනම් මිස් විල්කොක්ස් ගේ මුල් නම ඩී අකුරෙන් පටන් ගන්නා එකක් බව යි. එක දවසක් ඇය තමා වැඩියෙන්ම ආදරය කරන විල්කොක්ස් ගුරුවරියගෙන් ඩී කියන නමේ තේරුම කුමක්දැයි ඇසුවා ය.

Scanned with CamScanner

sinhalaebooks.com



'ඩෙයඩ්‍රි.' මිස් විල්කොක්ස් කීවා ය. එය මොන තරම අපූරු නමක් දැයි ඇලිසන් කල්පනා කළා ය. තමා කැමැතිම ගුරුවරියට කින්ගන්නා පෙනුමක් පමණක් නොව අපූරු නමක් ද තිබෙන බව ඇලිසන් සතුටෙන් කල්පනා කළා ය. ඩෙයඩ්‍රි විල්කොක්ස්. එය කවියෙකුටම ගැළපෙන අපූරු නමක් නොවේද ?.

ඇලිසන් මේ රහස හෙලි කළේ ඇන්ජෙලාට පමණි. එහෙත් ඇන්ජෙලා පංතියේ සෑම දෙනාටම එම රහස කියන්නට අමතක නොකළා ය. ඒ රහස හෙලිවීම නිසා ඈන් මාරි සහ ඇලිසන් මිස් විල්කොක්ස් ව අදහන්නට සූදානම් ය යන රහස පුළු පාසල පුරාම පැතිර ගියේ ය. ඒ නිසා පාසලේ සෑම දෙනාම ඔවුන්ට කථා කළේ 'ඩෙයඩ්‍රිගේ යාළුවෝ' යන සමච්චල් සහගත ආමන්ත්‍රනයෙනි. තමා සොයාගත් රහස ඇන්ජෙලාට පැවසීම ගැන ඇලිසන් ඇත්තටම දුක්වන්නට වූයේ රහස හෙලි වූවාට පසුවයි.

කෙසේ වුවද මිස් විල්කොක්ස් ගේ අවධානය දිනා ගැනීම සඳහා ඇලිසන් සහ ඈන් මාරි අතර වූයේ නිමා නොවෙන තරඟයකි ඈන් මාරි කවි ලියන්නී ය මිස් විල්කොක්ස් ද කවි ලියයි ඒ නිසා ඇය ඈන් මාරි ගැන වැඩි අවධානයක් යොමු කරනු ඇතැයි ඇලිසන් ඉරිසියාවෙන් යුතුව කල්පනා කළා ය. ඒ අතර මිස් විල්කොක්ස් තමාට වඩා ඇලිසන්ට කැමැති වෙනු ඇතැයි ඈන් මාරි බය වූවා ය. මෙවැනි සිතුම් පැතුම් සමඟ ඔවුන් දෙදෙනා අතර ඇතිවූ තරඟය පංතියේ අනිත් ළමයින් ට නම් සිනාවට කාරණයක්ම විය.

'ඔයාලා දෙන්නම හරිම මෝඩ ළමයි. ඔයාලා වගේ මෝඩ ළමයි දෙන්නෙක් ව උනන්දු කරවන්න කාටවත් ඕනෑ කමක් නෑ කියලා හිතාගන්න බැරි ද?'

බොබී ඇසුවා ය. එහෙත් ඇය කියන දේවල් තේරුම් ගන්නට තරම් හැකියාවක් ඈන් මාරි ට හෝ ඇන්ජෙලා ට තිබුනේ නැත. එමෙන්ම ඔවුන්ට ඒ දේවල් අසන්නට ද ඕනෑ වූයේ නැත. ඔවුන්ට ඇවැසි වූයේ සැමදාම 'ඩෙයඩ්‍රිගේ හිතවතියන්' ලෙස සිටින්නටයි

Scanned with CamScanner

sinhalaebooks.com

# ඇන්ජේලා සහ පුංචි ළමයි

ඒ අතර ජේන් ටිල් නැවතත් ලක්‍රොස් සෙල්ලම් කරන්නට තම කාලය යොදවන්නට වූවා ය. එය මිරාබෙල් ගේ හිතට ගෙන දුන්නේ සතුටකි. එක් දිනක් ඇය ග්ලැඩිස් ට මෙසේ කීවා ය.

'ඔයා දැක්ක ද?. මගේ පුංචි උපායක් හින්දා ජේන් ආයෙමත් සෙල්ලම් කරන්න ආවා. ඇත්තටම එයා හරිම දක්ෂ ළමයෙක්. වැඩි දවසක් යන්න ඉස්සර වෙලා එයා හරිම අපූරු ක්‍රීඩිකාවක් වෙයි කියන එක ගැන නම් මට කිසිම සැකයක් නෑ.'

ජේන් නැවතත් සෙල්ලම් කරන ආකාරය ග්ලැඩිස් ට දැකගත හැකිවිය. එමෙන්ම ඇගේ මුහුණේ කිසියම් දුක්බර බවක්ද තැවරී තිබෙන බව ග්ලැඩිස්ට හොඳින්ම වටහා ගත හැකිය.

Scanned with CamScanner

sinhalaebooks.com



'මට පෙනෙන විදිහට එයා ඉන්නේ සතුටෙන් නෙවෙයි අනිත් එක තමයි ජේන් පුහුණු වෙන්නෙත් එච්චර උනන්දුවකින් නෙමෙයි. සමහර විට ඇන්ජෙලා එයාට ගොඩාක් නපුරු විදිහට බනින්න ඇති. ඇයි ජේන් එයාගේ ඇඳුම් මහන්න බෑ කිවම ඇන්ජෙලට නේ ගොඩාක් පාඩු'

'කොහොම වුනත් ජේන් ඇන්ජෙලාගේ හිත රිදවන්න මොනව හරි දෙයක් කළා නම් මම ඇත්තටම ඒ ගැන සතුටු වෙනවා. මොකද ඇන්ජෙලාගේ වැඩ කරන්න ජේන් ට කිසිම අයිතියක් නෑ. මේ පොඩි ළමයි එක එක්කෙනාගේ වහල් වැඩ කරනවට මම කොහොමටවත් කැමැති නෑ.'

මිරාබෙල් එසේ කීවද ග්ලැඩිස් ගේ හිතේ තිබුනේ වෙනත් අදහසකි. ඈය තම හිතවතියට මෙවැනි අදහසක් ඉදිරිපත් කළේ ඒ නිසා ය.

'ඒ වුනාට ඔයා කරන දේවල් හරි යි කියලා ගොඩාක් දෙනෙක් කල්පනා කරන්නේ නෑ. සමහර අය ඔයාට කැමැති නෑ. ඔයා ඒ ගැන දන්නවද මිරාබෙල් ?'

ග්ලැඩිස් ගේ ඒ පැනයට මිරාබෙල් මෙසේ කීවා ය.

'ඒක වෙන හේතුවක්. මම මේ ඉස්කෝලේ ක්‍රීඩා නායිකාව. ඒ හින්දා මම ගොඩාක් අයට මහන්සිවෙලා පුහුණු වෙන්න කියලා බල කරනවා. අනිත් කාරණය තමයි මම හැම වෙලාවෙම අයුක්තිය දැක්කම කථාකරනවා. එහෙම අයට විරුද්ධව කෙලින්ම චෝදනා කරනවා. අන්න ඒ හේතු නිසා සමහර අය මාත් එක්ක තරහයි කියලා මම-දන්නවා.'

'අනිත් කාරණය තමයි. ජේන් ගොඩාක් දුකෙන් ඉන්නවා කියලා මට හිතෙනවා. ඒ මොනව වුනත් කමක් නෑ. ඔයා මේ විදිහට මට බනින එකට මම ත් කැමැති නෑ මිරාබෙල් මොකද දන්නවද ? ඔයාගේ උප ක්‍රීඩා නායිකාව තමයි මම. ඔයාට ඒක

Scanned with CamScanner

sinhalaebooks.com



අමතක වුනා ද?

ඒ සමගම මිරාබෙල් පුදුමයෙන් මෙන් ග්ලැඩිස් දෙසට හැරුනා ය. ඉතාම නිහඬ එමෙන්ම කුඩා ග්ලැඩිස් ට තමා අනුකම්පා කරනවා නේද යන කාරණය ගැන මිරාබෙල් ට සිහිපත් වූයේ ඒ සමගයි. එහෙත් ක්‍රීඩා නායිකාව තමන් යැයි සිතන නිසා මිරාබෙල් ගේ හිත තුළ කිසියම් උද්දච්ච කමක්ද තැවරී ඇත. ඒ නිසා වෙන අයෙක් කියන දෙයක් කරන්නට තරම් ඇගේ හිත ලාමක වන්නේ නැත.

' ග්ලැඩිස්. මම ඔයාගෙන් ප්‍රශ්නයක් අහන්නම්. ඇත්තටම ඔයා මට කැමැති ඇයි ? ඒ මොනව වුනත් ඔයා කියන හැමදේම පිළිගන්න මම බැඳිලා ඉන්නවා කියල නම් හිතන්න එපා. මම මෙහෙම කීවට මාත් එක්ක තරහ වෙන්නත් එපා. ඇත්තටම මම හැම දෙනාටම ඇහුම්කන් දෙන්නම්. ඒ වුනාට මේ හැමදේම තීරණය කරන්නේ නම් මම කැමැති විදිහට තමයි.'

'මිරාබෙල් ගේ පිළිතුර දැඩිය. එමෙන්ම කටුකය. එයින් සිත රිදුන නිසාදෝ ග්ලැඩිස් කිසිවක් කියන්නට උත්සාහ කළේ නැත. ඇත්තෙන්ම තම යෙහෙළිය තේරුම් ගැනීමට අමාරු එමෙන්ම ආශ්‍රය කිරීමට ද අපහසු අයෙකු බව ග්ලැඩිස් දැනගෙන බොහෝ කල් ය. තමාටත් ක්ලෝඩින් මෙන් කිසිම දෙයක් බැරෑරුම් ව නොසිතන කෙනෙක් වෙන්නට ඇත්නම් මොන තරම් හොඳ දැයි ඇයට කල්පනා වෙයි. එමෙන්ම බොබී මෙන් දැඩි සිතක් ඇති ළමයෙකු වූවා නම් මේ සෑම දෙයක්ම කිසිම කරදරයක් නොමැතිව දරාගත හැකි බව ද ග්ලැඩිස්ට කල්පනා විය. නැතිනම් තමාටත් හිලරිට මෙන් දැඩි ආත්ම ශක්තියක් තිබුනා නම් මොන තරම් අපූරුදැයි ඇයට නොසිතුනාම නොවේ.

ඒ අතර ජේන් ට රිදවන්නට ඇන්ජෙලා විසින් වයලට් හිල්ව ඉත්තෙක් බවට පත්කර ගෙන සිටියා ය. එහි එක් පියවරක් වශයෙන් ඇය තමාගේ පරණ කොණ්ඩ කටුවක් සහ පොතක්

Scanned with CamScanner

sinhalaebooks.com



... ට හිල් ට නැගි දුන්නා ය. වයලට් මොනතරම් සතුටට පත්වූවාද ... ඇය වහාම ජේන් සොයාගෙන ගොස් තමාට ලැබුන අපූරු ...ගය ඇයට පෙන්නුවා ය. ඇගේ මුහුණ උජාරුවෙන් පිම්බෙන ආකාරය ජේන් ට හොඳින් පෙනේ.

'මේ බලන්න ජේන්. ඇන්ජෙලා මොන තරම් අපූරු ළමයෙක් ද කියලා ඔයාට හිතාගන්න පුළුවන් ද?. ඒ වගේ හොඳ ළමයෙක් එක්ක රණ්ඩු වුන ඔයා නම් හරිම මෝඩ ළමයෙක්. අනිත් එක තමයි මිරාබෙල් ට වඩා ඇන්ජෙලා දහස් ගුණයක් හොඳයි කියලා මට හිතෙනවා.'

ජේන් වයලට් අතේ තිබූ පොත සහ කොණ්ඩ කටුව දෙස දුකෙන් මෙන් බලා සිටියා ය. මෙයට පෙර ඇන්ජෙලා තමාට කිසිම ආකාරයක තෑග්ගක් නොදුන් බව සිහිපත් වෙන විට ජේන් ගේ හිත දුකෙන් පිරී යයි. ඒ නිසා ඇන්ජෙලා පිළිබඳව කිසියම් තරහක් තම සිතට ඇති කරගන්නට ජේන් උත්සාහ කළා ය. එහෙත් ඇයට එය කළ නොහැකි දෙයකි. රත්තරන් පාට හිසකෙස් ඇති. එමෙන්ම ඕවලාකාර මුහුණක් සහ දිලිසෙන දෑසක් ඇති ඇන්ජෙලා දකින සෑම අවස්ථාවකදීම ඇය මොන තරම් අපූරු ගැහැණු ළමයෙක් දැයි ජේන් කල්පනා කරන්නීය.

ජේන් ට සිද්ධ වූ දේ පිළිබඳව අවංකවම කනගාටු වූයේ ඇගේ හොඳම යෙහෙළිය වන සැලී පමණි. ඇය ජේන් ට මෙසේ කීවා ය.

'දුක්වෙන්න එපා ජේන්. මම හිතන විදිහට ඇන්ජෙලා ඔය තරම් දුක්වෙන්න වත් වටින කෙනෙක් නෙවෙයි. අනික එයා වයලට් ව යොදා ගන්නේ ඔයාව රිදවන්න විතරයි. ඒ ගැන නම් කිසිම සැකයක් නෑ. ඇත්තටම ඇන්ජෙලා කියන්නේ හරිම නපුරු කෙල්ලක්.'

එසේ වුවද ඇන්ජෙලා ට විරුද්ධව වචනයක් හෝ

Scanned with CamScanner

sinhalaebooks.com



අසන්නටවත් ජේන් කැමැති නැත. එවැනි දෙයක් ඇසෙද්දි පවා ජේන් ගේ හිත ශෝකයෙන් පිරි යයි. කෙසේ වුවද සැලී කියූ දෙයින් වඩාත්ම කෝපයට පත්වූයේ වයලට් ය. ඈ සැලී වෙතට කෝපයෙන් පිපිරෙමින් කඩා පැන්නේ ඒ නිසා ය.

'ඇන්ජෙලා මට තෑග්ගක් දුන්නේ ජේන් ගේ හිත රිදවන්න කියලද ඔයා කියන්නේ ?. ඒ හින්දා නෙවෙයි. මම එයාගේ නිල්පාට කලිසම ගොඩාක් හොඳට මහලා දුන්නා. මට ඒ වැඩේට පැයක්වත් ගියේ නෑ. අන්න ඒ නිසයි ඇන්ජෙලා මට මේ තෑග්ග දුන්නේ.'

' ඒ කියන්නේ ඔයා ද දැන් ඇන්ජෙලා ගේ රෙදි මහලා දෙන්නේ ?.'

ජේන් දුකෙන් ඇසුවා ය. ඇගේ හිත ඉරිසියාවෙන් පුපුරන්නට ආසන්න වූවා මෙනි.

' ඇත්තටම ඔව් අනිත් එක තමයි මිරාබෙල් කියන කිසිම දෙයක් මම අහන්නේ නෑ. ඇන්ජෙලා මට කියන හැම දෙයක්ම මම කරලා දෙනවා. ඒ ගැන කිසිම සැකයක් නෑ.'

ඊළඟ දිනයේ ඇන්ජෙලා හමුවූ විගසම ජේන් සමඟ ඇතිවූ කථා බහ ගැන වයලට් ඇන්ජෙලා ට දැන්නුවා ය. ජේන් දුක්වෙන බව දැනගත් ඇන්ජෙලාගේ හිත සතුටෙන් පිරෙන්නට විය. ජේන් ගේ හිත රිදවන්නට ඕනෑම දෙයක් කරන්නට වුවත් ඇන්ජෙලා පසුබට වන්නේ නැත. ඒ නිසා ඇය වයලට් හට වැඩි වැඩියෙන් ළංවන්නට වූවාය. ඇයට ඉතාම හොඳින් සළකන්නට ද අමතක නොකළා ය. මේ සෑම දෙයකින්ම ජේන් ගේ හිත රිදෙන බව ඇන්ජෙලා හොඳින්ම දනියි.

ක්ලෝඩින් ගේ කුඩා සහෝදරිය වන ඇන්ටනට් ද ඉගෙන ගන්නේ පළමු වසරේ ය. ඒ නිසා පස් වැනි සහ හය වැනි වසරවල ළමයින්ගේ පොඩි පොඩි වැඩ කටයුතු කරදෙන්නට ඇයටද සිදුවූවා ය. එහෙත් ඇන්ටනට් ඇන්ජෙලාට නම් ටිකක්වත් කැමැති නැත.

Scanned with CamScanner

sinhalaebooks.com



ඇන්ජෙලාගෙන් පණිවුඩයක් ලැබෙන සෑම අවස්ථාවකදීම ඇගේ කාමරයට නොයන්නට නිදහසට කාරණයක් සොයාගන්නට ද ඇන්ටනට් අමතක කරන්නේ නැත.

'ක්ලෝඩින්. ඔයාගේ නංගි නම් කිසිම කමකට නැති ළමයෙක්. එයාගේ හැසිරීම වෙනස් කරන්න ඔයාටවත් බැරිද ?. ඔයා දන්නවද ? ඊයේ මම එයාට එන්න කියලා පණිවුඩයක් ඇරියා. සංගීත පුහුණුවක් තියෙනවා කියලා එයා ආවේ නෑ. ඒ වුනාට එයා සංගීතය ගැන කිසිම දෙයක් දන්නේ නෑ. ඒක තමයි පුදුම වැඩේ.

එක් දිනක් ඇන්ජෙලා ක්ලෝඩින්ට චෝදනාත්මකව කීවා ය. ක්ලෝඩින් අවංක හඬකින් ඇන්ජෙලාට මෙවැනි පිළිතුරක් දුන්නා ය.

'සමහර විට එයාට වෙන මොනව හරි පුහුණුවක් තියෙන්න ඇති ඇන්ජෙලා. මම කියන්නේ ලක්‍රොස් හරි මොකක් හරි.'

එහෙත් ඇන්ජෙලා ඒ අදහස පිළිගන්නට සූදානම් වූයේ නැත. ඈ කෝපයෙන් මෙසේ කීවා ය.

'මෝඩ කථා කියන්න එපා ක්ලෝඩින්. ඇන්ටනට් ඔයා වගේමයි. කිසිම සෙල්ලමක් කරන්නේ නෑ. එහෙම තියෙද්දි එයා ක්‍රීඩා පුහුණු වෙනවා කියන එක මොනතරම් මෝඩ කථාවක් ද?. ඔයත් ඇන්ටනට් ගේ හිතුවක්කාර වැඩ වලට උපකාර කරනවා කියලා මට හිතෙනවා.'

ක්ලෝඩින් ගේ හිතට කිසියම් තිගැස්මක් ඇතිවූවාක් මෙනි. එහෙත් ඈ කිසිම වෙනසක් නොපෙන්වා ම ඇන්ජෙලාට මෙසේ කීවා ය.

' එහෙම නෙවෙයි ඇන්ජෙලා. මොනව වුනත් ඇන්ටනට් මේ ඉස්කෝලේ දේවල් කරන්න කැමැතියි කියලා මම දන්නවා.'

' අනේ... අනේ... මාව බොරුවට රවට්ටන්න හදන්න එපා

Scanned with CamScanner

sinhalaebooks.com



ක්ලෝඩින්. ඔයා මේ ඉස්කෝලේ ඉගෙන ගත්තු හැම දවසක්ම මට හොඳට මතකයි. මොන දේ කෙරුවත් ඔයා ප්‍රංශ ළමයෙක් විදිහට තමයි හැමදේම කරන්නේ.'

මෙම කථාව අසන්නට කැමැති නොවුවත් ක්ලෝඩින් කෝප නොවෙන්නට වග බලා ගත්තා ය. ඒ නිසා ඈ අපහසුවෙන් මෙන් හිත හදාගෙන මෙසේ කීවා ය.

'ඇත්තටම ප්‍රංශ ළමයෙක් වෙන එක මට සතුටක්. ඒත් මම එංගලන්තේ ඉන්නකම් ඉංග්‍රීසි විදිහටයි හැදෙන්නේ. ඒත් ඉංග්‍රීසි ඇන්ජෙලාට වඩා ප්‍රංශ ක්ලෝඩින් සිය දහස් ගුණයක් හොඳයි කියලා මම දන්නවා.'

ක්ලෝඩින් කියූ දරුණු කථාවට ප්‍රති උත්තරයක් දෙන්නට ඇන්ජෙලා ඉදිරිපත් වූයේ නැත. යම් හෙයකින් ඇගේ හිත රිදුනොත් ඈ නිසැකවම ගොස් මැඩමොසෙල්ට කේලම කියනු ඇත. එසේ වුවහොත් සිදුවන්නේ ඉතා හොඳ දෙයක් නම් නොවේ. තමාගේ ආදරණීය ලේලියන් දෙදෙනාගේ ආරක්ෂාව සඳහා සෑම අවස්ථාවකදීම මැඩමොසෙල් ඉදිරිපත් වෙන බව ඇන්ජෙලා දනියි. ඒ නිසා ක්ලෝඩින්ට ප්‍රති උත්තර දීමේදි දෙවරක් සිතිය යුතුය.

' හරි කමක් නෑ. මම එයාගේ මෝඩ නංගිට එන්න කියලා හොඳ වැඩක් කරන්නම්කෝ. මම එයාට කියලා ඇතිවෙනකම් වැඩ කරවා ගන්නම්කෝ.'

ඇන්ජෙලා කුරිරු ලෙස කල්පනා කළා ය.

' මම ඉස්සර වෙලාම මේ ගැන හිලරි එක්ක කථා කරනවා. ඕනෑ. ඊට පස්සේ එයා ඇන්ටනට් එක්ක කථා කරයි. ඊට පස්සේ මම හරි ඇලිසන් හරි එන්න කියපු ගමන් ඇන්ටනට් ට අපේ කාමරේට එන්න වෙයි.'

ඉහළ පංතිවල ගැහැණු ළමයින් පණිවුඩ එවන අවස්ථාවලදී ඇන්ටනට් වඩාත් නරක අන්දමට මග හරින බව හිලරිට ද රහසක්

Scanned with CamScanner

sinhalaebooks.com



වූයේ නැත. එමෙන්ම ඇන්ජෙලා ද කුඩා ගැහැණු ළමයින්ගෙන් පමණට වඩා වැඩ කරවා ගන්නා බවද හිලරි හොඳින්ම දැනගෙන සිටියා ය. තමාගේ ලස්සන පෙනුමත්. කපටි කථා බහ ත් මගින් කුඩා ගැහැණු ළමයින් රවටා ගන්නා ඇන්ජෙලා ඔවුන්ගෙන් වහලුන් ගෙන් මෙන් වැඩ කරවා ගනියි. ඒ නිසා ඇන්ජෙලා. ක්ලෝඩින් ගැන කියූ දේවල් ගැන වඩාත් බරපතල ලෙස සිතන්නට ඇන්ජෙලාට ඇවැසි වූයේ නැත.

' හොඳයි. පහ සහ හය පංතිවල ළමයින්ට කීකරු වෙන්න කියලා මම ඇන්ටනට් ට කියන්නම්. හැබැයි ඇන්ජෙලා ඒ ළමයින්ගෙන් වැඩිපුර වැඩ ගන්න නම් එපා. ඔයා පොඩි ළමයින්ට කියලා බරපතල විදිහට වැඩ ගන්නවා කියලා අපි හැම දෙනාම දන්නවා.'

හිලරි එසේ කියද්දි ඇන්ජෙලා නොසන්සුන් ලෙස මෙසේ ඇසුවා ය.

' එතකොට මිරාබෙල් ගැන ඔයාලා මොකද කියන්නේ.? එයා තමන්ගේ බලතල අනිසි විදිහට පාවිච්චි කරන්නේ නැද්ද ?. එයා ක්‍රීඩා නායිකාව හින්දා මුළු පංතියම පාලනය කරන්න හදනවා. හැබැයි කවුරුවත් ඒ ගැන කථා කරන්නේ නෑ.'

'අපි මිරාබෙල් ගැන කථා කරන එක හරි නෑ කියලයි මට හිතෙන්නේ. හැබැයි අපි මේ පංතියේදි කරන්නේ මොනවද කියන එක ගැන නම් ගොඩාක් කල්පනා කරන්න වෙනවා. තව එක වාරයකින් පස්සේ අපි හය වැනි පංතියට යනවා. අන්න ඒ හින්දා මේ පංතියේදි අපිට ගොඩාක් වගකීමක් ඇතිව වැඩ කරන්න වෙනවා. අපි කවුරුත් ළඟ අභිමානයක් තියෙනවා. හැබැයි ඒ අභිමානය වෙන කවුරුවත් පාලනය කරන්න යොදා ගන්න එක හොඳ නෑ. ඇන්ජෙලා. ඔයාට මම කියන දේ තේරෙනවා නේද ? අපි අපේ ශක්තිය යොදා ගන්න ඕනෑ හැම දෙනාගෙම යහපතට කියන එක අමතක කරන්න හොඳ නෑ.'

Scanned with CamScanner

sinhalaebooks.com



හිලරී එසේ කියද්දි ඇන්ජෙලා අමනාපයෙන් අහක බලා ගත්තා ය.

'මට දේශනා කරන්න එන්න එපා. ඒ මොනව වුනත් දැන් අපිට සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලේ වැඩිපුර විනෝද වෙන්න අවස්ථාවක් ලැබෙන්නේ නෑ. එහෙම නේද ?. මේ දවස්වල හැම දෙනාම ගොඩාක් බැරෑරුම් විදිහට කල්පනා කරනවා. සමහරු නිදි මරාගෙන පාඩම් කරනවා. බොබී යි ජැනටුයි නිකමටවත් විහිළුවක් කරන්නේ නෑ. අනික අපිට මැදයම් රැයේ සාදයක් වත් ලැබෙන පාටක් වත් නෑ. එතකොට....'

'අපි හැම දෙනාම ගොඩාක් මහන්සි වෙලා පාඩම් කරනවා කියන එක අමතක කරන්න එපා. ඇන්ජෙලා. මොකද අපිට ළඟදීම අමාරු විභාගයක් තියෙනවා. ඒ විභාගේ ඉවර වෙනකම් මෝඩ වැඩ මොනවත් කරන්න ලැබෙන්නේ නෑ. විභාගෙන් පස්සේ නම් අපිට ටිකක් විතර සන්තෝෂ වෙන්න ලැබෙයි කියලා මට හිතෙනවා.'

එසේ කියූ හිලරි එතැනින් යන්නට ගියා ය. ගමන යන අතරේදීම ඇයට ඇන්ටනට් ද හමු වූයේ ය. හිලරි කියූ සෑම දෙයක්ම ඇන්ටනට් අවධානයෙන් අසා සිටියා ය. කුඩා කළු පැහැති ඇස් ඇති ප්‍රංශ ගැහැණු ළමයාගේ මුහුණ පුරා කිසියම් අවංක බවක් දැකගත හැකිය.

'හොඳයි හිලරි. ඇන්ජෙලා මට එන්න කීවොත් මම ගිහිං එයා කියන දේවල් කරලා දෙන්නම්. ඒ වුනත් මට ගොඩාක් වැඩ තියෙන වෙලාවට තමයි එයා මට එන්න කියන්නේ.'

'ඇන්ටනට්. ඔය නිදහසට කාරණා මට කියන්න එපා. ඔයා ඒවා ඇන්ජෙලාටම කියන්න.'

හිලරි දැඩි හඬකින් එසේ කියද්දි ඇන්ටනට් ඈ දෙස බලා සිටියා ය. තමා නිදහසට කියූ කාරණාව හිලරි විශ්වාස කළේ නැති

Scanned with CamScanner

sinhalaebooks.com



බව ඇන්ටනට් හට වැටහෙයි. තමා මොන තරම් ආචාරශීලි ව සහ අවංක ලෙස කීවත් ඇන්ටනට්ගේ බොරුව හිලරි විශ්වාස කළේ නැත. ඒ අතර හිලරි ඇන්ටනට් සමඟ කථාකරන ආකාරය ඇන්ජෙලා ද දුටුවා ය. ඇයගේ හිතට දැනුනේ ප්‍රීතියකි. දැන් ඉතින් සිතන්නට දෙයක් නැත. ඇන්ටනට් ට එන්නට කියා ඇගෙන් හොඳ හැටි වැඩ ගත හැකි යැයි ඇන්ජෙලා සිතුවා ය. ඒ නිසාම ඇ වයලට් හට මෙසේ කීවා ය.

' වයලට්. තව දවස් කීපෙකට ඔයාව මට ඕනෑ වෙන්නේ නෑ. ඔයා ගිහිං ඇන්ටනට් ට එන්න කියන්න.'.

ඇන්ජෙලා ගේ වචන ඇසූ වයලට් ගේ සිත ශෝකයෙන් බරවූයේ ය. ඇ දුක්බර හඬකින් මෙසේ ඇසුවේ ඒ නිසා ය.

' ඇයි ඇන්ජෙලා. මම ඔයාගේ වැඩ කරලා දෙනවා හොඳ නැද්ද ?. ඇන්ටනට් කිසිම කමකට නැති ළමයෙක්. අනික එයාට කිසිම දෙයක් හරියට කරන්න බෑ. ඇත්තමයි. අනේ ඒ හින්දා මම හැමදාම ඔයාගේ වැඩ කරලා දෙන්නම්.'

'ඒ වුනාට ඇන්ටනට් ගොඩාක් ලස්සනට මහනවා. එම්බ්‍රොයිඩර් කරන්න දක්ෂයි. ගිය සතියේ ඔයා මගේ ටෙනිස් මේස් දෙක මහලා තිබුනා කිසිම කමකට නෑ.'

ඇන්ජෙලා ගේ කථාව වයලට් ට වටහා ගත නොහැකිය. මෙයට පෙර සතියේ හරිම අපූරුවට සිටි ඇන්ජෙලාගේ වෙනස මොනතරම් දැයි වයලට් මොහොතකට කල්පනා කළා ය. දෑස කඳුලෙන් බරවෙද්දි ඇ ඇන්ජෙලාගේ කාමරයෙන් පිටව ගියා ය. මේ සිදුවීම දෙස විමසිලිමත් ලෙස බලා සිටි ඇලිසන් මෙසේ කීවා ය.

'ඇන්ජෙලා. ඔය වැඩේ නතර කළොත් හොඳයි කියලා මට හිතෙනවා. ඔයා මේ පොඩි ළමයින්ට ගොඩාක් නපුරු විදිහට සළකනවා කියලා මට හිතෙනවා. අනික ඔයා ඇන්ටනට් ගෙනෙන

Scanned with CamScanner

sinhalaebooks.com



එක නම් හොඳ වැඩක් නෙවෙයි. එයා ඔයා කියන දේවල් අහන්නේ නෑ. ඒ හින්දා මොනවා කරයිද කියලා කියන්න බෑ.'

' ඔයා දන්නවද ඇලිසන් ?. මට ඕනෑ වුනොත් එයා මට කීකරු වෙන්න ඕනෑ.'

ඇන්ජෙලා ආඩම්බරයෙන් කීවා ය. තමාගේ සුන්දර පෙනුම සහ ප්‍රිය මනාප සිනාව මගින් ඕනෑම කෙනෙක් මෙල්ල කරගත හැකි බවට ඇන්ජෙලා කල්පනා කරන්නී ය. පයිප්පයකින් ජලය ගලා එන්නාක් මෙන් ඇන්ජෙලාගේ මුවෙන් නික්මෙන සෝබන වචන වලින් ඇන්ටනට්ව රවටා ගත හැකි යැයි ඇන්ජෙලා සිතනවා විය යුතුය.

'ඔයා මොනව කීවත් ඇන්ටනට් ඔයාට කීකරු වෙන්නේ නෑ. එයත් හරියට ක්ලෝඩින් වගේමයි. ඒ හින්දා එයා මොනව කරයිද කියලා හිතාගන්න බෑ.'

ඇලිසන් එසේ කීවද ඇන්ජෙලාගේ උද්දච්ච හිත වෙනස් වූයේ නැත.

' මොනවද ඔට්ටු ඇලිසන්. මම ඇන්ටනට් ව මෙල්ල කරනවා. එයා මම කැමැති විදිහට වැඩ කරන මෝඩ පුංචි ළමයෙක් කරලයි මම පස්ස බලන්නේ. ඔයා හොඳට බලාගෙන ඉන්නකෝ. මම මොන තරම් දක්ෂ ද කියලා දැනගත්තම ඔයාට ගොඩාක් පුදුම හිතෙයි.'

' හොඳයි ඇන්ජෙලා මම ඔයා කරන දේ දිහා බලාගෙන ඉන්නම්කෝ. හැබැයි මම පුදුම වෙන්නේ නම් නෑ. මොකද පුංචි ඇන්ටනට් කවුද කියලා ඔයාට වැඩිය හොඳට මම දන්නවා.'

ඇලිසන් සමච්චල් සහගත ලෙස එසේ කීවා ය.

Scanned with CamScanner

sinhalaebooks.com



# ඇන්ජෙලා ට එරෙහිව ඇන්ටනට්

ඊළඟ සැරේ ඇන්ජෙලාගෙන් පණිවුඩයක් ලැබුන වහාම ඇන්ටනට් ඇන්ජෙලාගේ පාඩම් කාමරයට ගියා ය. ඇගේ මුහුණේ ප්‍රියමනාප සිනා රැල්ලකි. ක්ලෝඩින් ගේ මුහුණේ තිබෙන සිත් ඇදගන්නා ප්‍රියමනාප සිනා රැල්ල ඇන්ටනට් ගේ මුහුණේ ද නොඅඩුවම රැඳී ඇත. දෙවැනි වාරයේ පංති භාර ගුරුවරිය වන මිස් ජෙන්ක් ද ඇන්ටනට්ගේ මේ ප්‍රියමනාප සිනා රැල්ල ගැන හොඳින්ම දැනගෙන සිටින්නී ය. එහෙත් මේ සිනා රැල්ල කිසිදා විශ්වාස කළ නොහැකි රැවටිල්ලක් බව කිසිවෙකුත් වටහා ගෙන නැත. ඇන්ටනට්ගේ මුහුණේ තිබෙන ප්‍රිය මනාප සිනාරැල්ල වඩාත් පැතිරී ඇත්නම් ඇය අවිශ්වාස කළ හැකි සීමාවද ඉහළ යයි.

'ඇන්ජෙලා. ඔයා මට එන්න කීව ද?'

ඇන්ටනට් ඇසුවා ය.

Scanned with CamScanner

'මම ඔයාට එන්න කීවා ඇන්ටනට්. අර අතන තියෙන දුඹුරු පාට සපත්තු දෙක පොලිෂ් කරලා දෙන්න පුළුවන් ද ?. ඔයාට ඒ වැඩේ ගොඩාක් ලස්සනට කරන්න පුළුවන් කියලා මට කිසිම සැකයක් නෑ.'

ඇන්ජෙලා තමාගේ මුහුණේ තිබෙන ආකර්ශනීයම සිනාවෙන් ඇන්ටනට් ට සංග්‍රහ කළා ය. ඇන්ටනට් ද ඒ හා සමානම සිනාවකින් ඇන්ජෙලා ට සංග්‍රහ කරන ගමන් ඈ දෙස දෑස් දල්වා බලා සිටියා ය. මේ පුංචි කෙල්ල තමාගේ සිනාවට වශී වූ බව දැන් ඇන්ජෙලාට සහතිකය.

'කොහෙද පොලිෂ් තියෙන්නේ ?.'

ටික වෙලාවකට පසුව ඇන්ටනට් ආචාරශීලිව ඇසුවා ය.

'අර කබඩ් එක උඩ බලන්නකෝ. එතැන පොලිෂ් ටින් එක ඇති. ඇත්තටම ඇන්ටනට් ඔයා හරිම ලස්සන ළමයෙක් නේ. ඔයා ක්ලෝඩින් වගේම ලස්සනයි.'

ඇන්ජෙලා එසේ කීවද ඇන්ටනට් ගෙන් ලැබුනේ අපූරු උත්තරයකි.

'ආ...ක්ලෝඩින් කියන්නේ ඒ තරම් ලස්සන ළමයෙක් නෙවෙයි. ඔයා දන්නවද ඇන්ජෙලා. මට සහෝදරියන් පස් දෙනෙක් ඉන්නවා. මම ඒ හැම දෙනාටම කැමැතියි. ඒ වුනාට ක්ලෝඩින් නෙවෙයි මම කැමැතිම සහෝදරිය. ආ.. ක්ලෝඩින් මොන තරම් අපූරුද කියලා මම ඔයාට පැහැදිලි කරලා දෙන්නම්කෝ. ඒ වගේම මගේ අනිත් සහෝදරියෝ ගැන දැනගන්නත් ඔයා කැමැති වෙයි. ඒ අය...'

ඇන්ටනට් දිගු කථාවකට මුල පිරුවත් ඇගේ සහෝදරියන් ගැන දැනගන්නට ඇන්ජෙලාගේ කැමැත්තක් තිබුනේ නැත. ඕනෑම ගැහැණු ළමයෙක් රවටා ගත හැකි සුන්දර කථා බහක් ඇන්ජෙලා සතුව ඇත. එහෙත් ඒ ළමයාගේ සහෝදරියන් ගැන දැනගන්නට

sinhalaebooks.com



නමුත් ඇන්ජෙලා කිසි ලෙසකින්වත් කැමැති වන්නේ නැත.

' ආ.... ඇන්ටනට් සපත්තු පොලිෂ් එක අර කබඩ් එක උඩ තියෙනවා.'

කථාව වෙනතකට හරවන්නට මෙන් ඇන්ජෙලා කීවා ය. ඒ අතරම තම සුන්දර සිනාව නොඅඩුවම ඇන්ටනට් හට තිළිණ කරන්නට ද ඇය අමතක කළේ නැත.

' ආ.. පොලිෂ් - හරි හරි..'

කබඩය අසලට පියවර කිහිපයක් තබන අතරේම ඇන්ටනට් කීවා ය. ඒ අතරම ඇය තම කථාව නැවතත් ආරම්භ කරන්නට සූදානම් වූවා ය.

'ඔයා දන්නවද ඇන්ජෙලා ?. මගේ සහෝදරියෝ අතරින් මම වැඩියෙන් ම කැමැති සහෝදරිය තමයි ලුවිස්. ආ. එයා මොන වගේද කියලා දැන ගන්න ඔයා කැමැති ඇති. ලුවිස් හරිම ලස්සනට එම්බ්‍රොයිඩර් කරනවා. ඔයා දන්නවද ?. එයාට අවුරුදු නමයේදි එම්බ්‍රොයිඩර් වලට ලොකු සම්මානෙකුත් ලැබුනා...'

' ඇන්ටනට්. දැන් ඉතින් මගේ සපත්තු දෙක පොලිෂ් කරන්න පටන් ගත්තොත් හොඳයි කියලා මට හිතෙනවා.'

ඇන්ජෙලා කීවා ය. දැන් දැන් ඇගේ ඉවසීමේ සීමාව ද ඉක්මවා යන්නට ආසන්න ය. ඒ සමඟම ඇන්ටනට් ගේ දෑසින් දුක්බර බැල්මක් පෙරී ආවේය. ඒ නිසාම ඇන්ජෙලා නැවතත් තමන්ගේ සුන්දර සිනාවකින් ඇන්ටනට් ගේ සිත සුවපත් කළා ය.

ඇන්ටනට් තම සොයුරියන් ගැන ලොකු කථාබහක් ආරම්භ කරන්නට නැවතත් මුව විවර කළා ය. එහෙත් මේ තේරුමක් නැති කථාබහට සවන් දෙන්නට ඇන්ජෙලා කොහොමටවත් කැමැති නැති ආකාරයකි. ඒ නිසා ඇය නොඉවසිලිමත් ලෙස ඇලිසන්ට මෙසේ කීවා ය.

Scanned with CamScanner

sinhalaebooks.com



' ඇන්ටනට් තව එක වචනයක් වත් කථා කරන්න එපා. මට දැන් පාඩම් වැඩ ගොඩාක් කරන්න තියෙනවා.'

ඇන්ටනට් නිහඬවම කබඩය අසලට ගියා ය. පුටුවක් ඒ අසල තබා ඇය කබඩයට ගොඩ වී වටපිට විපරම් කළා ය. පොලිෂ් බඳුන ඇගේ අතට හසුවෙයි. ඇන්ටනට් එහි සුවඳ ගැන විපරම් කරද්දි ඉන් නැගුනේ පොලිෂ් සුවඳ නම් නොවේ. ඊටත් වඩා අපූරු සිත්ගන්නා සුවඳකි. සමහර අවස්ථාවලදි මෙවැනි අපූරු සුවඳක් ක්ලෝඩින් ළඟින්ද හමන බව ඇන්ටනට් හට මතකය.

ඇන්ටනට් වහාම බුරුසුවක් සොයාගෙන තමන්ගේ වැඩය පටන්ගත්තා ය. සුවඳ හමන ක්‍රීම් එකෙන් ටිකක් ඇන්ජෙලාගේ සපත්තුවට ආලේප කළ ඇය බුරුසුවෙන් හොඳින් පිරි මැද්දා ය. සෑහෙන උත්සාහයකින් පසුව ඇන්ජෙලාගේ සපත්තු දෙක අපූරුවට පොලිෂ් කරන්නට ඇන්ටනට් හට හැකි විය. ඇය සපත්තු දෙක පැත්තකින් තැබුවේ ඉමහත් ආඩම්බරයෙනි.

' ඉවර ද ?.'

ඇන්ජෙලා තමන් කියවමින් සිටින පොතෙන් දෑස් නොඋස්සාම ඇන්ටනට් ගෙන් ඇසුවා ය. ඇය තැවතත් කථාකරනු ඇතැයි ඇන්ජෙලා බය වූවාක් මෙනි.

' ඇත්තටම මම වැඩේ කරලා ඉවරයි. ඇන්ජෙලා මම ඔයාගේ තවත් සපත්තු දෙක තුනක් පොලිෂ් කරන්න ද?. ඔයා වෙනුවෙන් වැඩ කරන එක මට හරිම සතුටක්.'

ඇන්ටනට් මවාගත් සතුටකින් යුතුව කීවා ය. ඇන්ජෙලාගේ හිතට සතුටක් ඇති විය. සිතුවටත් වඩා ලෙහෙසියෙන් ඇන්ටනට් ව රවට්ටා ගැනීමට හැකිවීම මොන තරම් සතුටු හිතෙන කාරණයක් ද?. හිතේ උපන් සතුටෙන් යුතුවම ඇන්ජෙලා මෙසේ කීවා ය.

' කමක් නෑ ඇන්ටනට්. ඔයා කැමැති තරමක් සපත්තු අරගෙන පොලිෂ් කරන්නකෝ. ෂා ඔයා මේ සපත්තු දෙකත් හරිම

Scanned with CamScanner

sinhalaebooks.com



ලස්සනට පොලිෂ් කරලනේ.'

' මම හොඳට පොලිෂ් කරලා නේද ?.'

ඇන්ටනට් උනන්දුවකින් ඇසුවා ය.

'ඇත්තටම ඔයාගේ මේ සපත්තු දෙකත් හරිම ලස්සනයි. අනික මේ ඉස්කෝලේ කාටවත් ඔයාට තරම් ලස්සන ඇඳුම් නෑ. මම කියන්නේ ඇත්ත ඇන්ජෙලා. ඔයාගේ හැම ඇඳුමක්ම හරිම ලස්සනයි. ඒ වගේම ගොඩාක් පිළිවෙලට මහල තියෙනවා. ඔයා එංගලන්තේ ළමයෙක් කියලා කියන්නත් අමාරුයි. ඔයා හැසිරෙන්නේ ප්‍රංශ ළමයෙක් වගේ.'

ඇන්ටනට් එසේ කියද්දි ඇන්ජෙලාගේ හිත සතුටෙන් පිරි ඉතිරී ගියේය.

'ඔයා දන්නවද ඇන්ටනට් ?. මම සැරයක් දෙසැරයක් ප්‍රංශෙට ගිහිං තියෙනවා. ඇඳුම් ගන්න.'

' ආ ඇඳුම් ගන්න. ඇඳුම් ගැන කියද්දි මට මතක් වෙන්නේ අපේ ජෙනි අක්කා. එයා ළඟ තියෙන්නේ හරිම වටිනා. ඒ වගේම ලස්සන ඇඳුම්. ඒවා ප්‍රංශයේ හොඳම ඇඳුම් සාප්පු වලින් ගත්තු ඒවා වගේම ලස්සනයි. හැබැයි ඔයා දන්නවද ඒ ඇඳුම් හැම එකක්ම මහගෙන තියෙන්නේ අපේ අක්කමයි. එයාට හරිම ලස්සනට මහන්න පුළුවන්. එයාගේ අත්වල තියෙන ලස්සන ඇඟිලි වලින් ඕනෑම ලස්සන ඇඳුමක් මහන්න එයාට වැඩි වෙලාවක් යන්නේ නෑ. අනික එයා....'

ඇන්ටනට්ගේ තෝරතෝංචියක් නැති කථාබහ ඇන්ජෙලාගේ හිතට ඇති කළේ නොසන්සුන් කමකි. ඒ නොසන්සුන් කමත් සමඟම ඈ මෙසේ කීවා ය.

'ආ...ඔයාට නුවණක්කාර අක්කලා ගොඩාක්ම ඉන්නවා නේද?.'

Scanned with CamScanner

sinhalaebooks.com



' ඇත්ත. ඒ වුනත් මම ඔයාට මගේ අනිත් අක්කා මාරි ගැන කිව්වේ නැහැනේ. ඇත්තටම දැන් මාරි...'

එහෙත් එවර නම් ඇන්ටනට් හට තම කථාව කරගෙන යන්නට ඇන්ජෙලාගෙන් ඉඩක් ලැබුනේ නැත. ඇන්ටනට් තම සහෝදරියන් ගැන කියන මේ නීරස කථාව අසන්නට ඇය නිකමටවත් කැමැති නැත.

''ඇන්ටනට්. කරුණාකරලා මට මේ වැඩේ කරන්න ඉඩ දීලා ඔයා සපත්තු පොලිෂ් කරනවද?. ඔයා හරිම හොඳ ගැහැණු ළමයනේ.'

ඇන්ජෙලාගේ සැහැල්ලු වචන වලට ඇන්ටනට් එක්වරම වශී වූවාක් මෙන් අවනත විය.

'හොඳයි ඇන්ජෙලා. මම වැඩේ කරන්නම්. මම තේරුමක් නැති කථා කියන කථා පෙට්ටියක් කියලා ඔයාට හිතෙනවා ඇති එහෙම නේද ?.

' ඔයා කථා පෙට්ටියක් නෙමෙයි. කථා ලොරියක්. කමක් නෑ. දැන් ඉතින් ඔයාගේ කථාව නතර කරලා සපත්තු පොලිෂ් කරන්න පටන් ගන්නකෝ. ඇත්තටම මම ඔයාගේ රසවත් කථා අහන්න කැමැතියි. ඒ වුනාට මට දැන් වැඩ ගොඩාක් තියෙනවා. '

ඇන්ටනට් කිසිවක් කථා කළේ නැත. ඈ නිහඬවම සපත්තු ජෝඩු තුනක්ම ඔප දැමුවා ය. ඔප දැමු සපත්තු කුට්ටම් සියල්ලම ජේලියට තැබු ඇන්ටනට් හිස් ක්‍රීම් බඳුන කුණු කූඩයට විසිකලා ය. ඉන්පසුව ඈ ඇන්ජෙලා ට මෙසේ කීවා ය.

'ඇන්ජෙලා. දැන් ඉතින් මගේ වැඩ ඉවරයි. මම යන්නම්. හෙටත් ඕනැ නම් කියන්න. මම නොවරදීම එනවා.'

'හොඳයි. ඔයා හෙටත් මේ වෙලාවටම එන්න. ආ... ඔයා මගේ සපත්තු හරිම ලස්සනට පොලිෂ් කරලා'

Scanned with CamScanner

sinhalaebooks[redacted]



ඇන්ජෙලා කීවා ය. ඇගේ මුවගින් ගලන සුන්දර සිනා රැළි අනෝරක් නැතිව ඇන්ටනට් වෙතට යොමුවෙයි. ඇන්ජෙලා සිනාසෙද්දි ඇගේ හිස දෙපසට වැනේ. එවිට ඇගේ දිලිසෙන කෙස් කළඹ ද එහාට මෙහාට සෙලවෙයි.

වැඩ කටයුතු අවසන් කළ ඇන්ටනට් නිහඬවම කාමරයෙන් පිටවූවා ය. කොරිඩෝරය දිගේ ඇවිද එද්දි ඇයට තම සොයුරිය වන ක්ලෝඩින් ද හමු විය. ඇන්ටනට් දුටු විගස ක්ලෝඩින් ගේ දෙබැම උඩ ගියේ ය.

' ඇන්ටනට්. ඔයා කොහෙද ගියේ ?. ඔයාට පණිවුඩයක් ලැබෙන්නේ නැතිව පස් වැනි පංතියේ ළමයින්ගේ පාඩම් කාමරවලට යන එක තහනම් වැඩක් කියලා ඔයා දන්නේ නැද්ද ?.

ක්ලෝඩින් නොඉවසිල්ලෙන් මෙන් අසද්දි ඇන්ටනට් සමච්චල් සහගත හඬකින් මෙසේ කීවා ය.

'මම ඇන්ජෙලා ගේ සපත්තු පොලිෂ් කෙරුවා.'

එසේ කියූ ඇන්ටනට් කොරිඩෝරයේ දෙපැත්තම ඉතා හොඳින් විපරම් කළා ය. කිසිවෙකුත් පෙනෙන්නට නැත. ඉන්පසුව ඇය ක්ලෝඩින්ගේ කනට කර කිසියම් රහසක් ප්‍රංශ භාෂාවෙන් කීවා ය. ක්ලෝඩින්ගේ මුහුණට සුන්දර සිනාවක් නැගී එද්දි ඇය ඇන්ටනට්ගේ කනෙන් අල්ලා සෙලවූවා ය.

'ඔයා නම් පුදුම ළමයෙක් තමයි. ඇන්ජෙලා මොනවද කීවේ?.'

ඇන්ටනට් කිසිවක් නොකියා දෙවුර සැලුවාය. ඉන්පසුව ඇය හනි හනික යන්නට ගියා ය. ක්ලෝඩින් ද පැසේජය දිගේ ඉදිරියට ගමන් කොට ඇන්ජෙලා ගේ පාඩම් කාමරය අසලට ආවා ය කාමරය තුළින් ඇලිසන් ගේ කටහඬ ද ඇසේ. ටික වෙලාවකට පසුව ක්ලෝඩින් කාමරයේ දොර විවෘත කළා ය.

Scanned with CamScanner

sinhalaebooks.com



'හලෝ, මම දෙනවා කියපු පොත් අරන් යන්නද ආවේ ?'

'විකක් ඉන්න ක්ලෝඩින්. මම ඒක කොහේ හරි තැනක අරන් තිබ්බා'

ඒ අතර ක්ලෝඩින් කාමරය පුරාම විමසුම් බැල්මක් හෙලන්නට වූවා ය. ඇන්ටනට් විසින් පොලිෂ් කළ සපත්තු ජෝඩු කිහිපය දිලිසෙමින් පසෙක තිබෙන ආකාරය ඇයට දැක ගත හැකිය.

' ආ.. අද නම් වයලට් ලස්සනට සපත්තු පොලිෂ් කරලා තියෙනවා. හැබැයි අද නම් එයා ගාලා තියෙන්නේ වෙන පොලිෂ් වර්ගයක් වගේ.'

ක්ලෝඩින් එසේ කියද්දි ඇන්ජෙලා හිස ඔසවා ඈ දෙස බැලුවා ය. ඉන්පසුව ඈ සිනා සී මෙසේ කීවා ය.

' නෑ අද වයලට් තමයි මගේ සපත්තු පොලිෂ් කළේ. ඒ විතරක් නෙවෙයි. එයා ඔයාගේ හැම සහෝදරියක් ගැනම ලොකු විස්තරයක් මට දුන්නා.'

' ආ ඇත්ත තමයි. මට ඉන්නවා සහෝදරියෝ ගොඩාක්. එක්කෙනෙක් ලුවිස්. අනිත් එක්කෙනා මාරි. අනිත් සහෝදරිය...'

ක්ලෝඩින් එසේ කියන්නට උත්සාහ කරද්දි ඇන්ජෙලා ගේ නොසතුටු කටහඬ පැතිර ගියේ ය.

' දෙයියන්ගේ නාමෙට ඔය කථාව ආයේමත් කියන්න එපා. මට දැන් ඔය කථාව අහලා ඇතිවෙලා. ඒක නෙවෙයි ඇලිසන් ඇයි ඔයා මොනවද බලන්නේ ?. මොකද වෙලා තියෙන්නේ ?.'

'ඇත්තටම ඇන්ජෙලා ඔයා මොන තරම් නාස්තිකාර ළමයෙක් ද?. මුහුණේ ගාන අළුත්ම ක්‍රීම් එක ඔයා සම්පූර්ණයෙන්ම ඉවර කරලා. ඊයේ තිබුන ක්‍රීම් එක අද වෙනකොට සම්පූර්ණයෙන්ම ඉවරයි. ඇත්තටම ඔයා මොනවද ක්‍රීම් එකට කෙරුවේ.'

ඇලිසන් පුදුමයෙන් අසද්දි ඇන්ජෙලා ද මෙන් මෙසේ කීවා ය.

Scanned with CamScanner

sinhalaebooks.com



මං කිසිම දෙයක් කළේ නෑ. මම ඒ ක්‍රීම් එක ගාන්නේ හිරුගේ අවස්ථාවලට විතරයි. ඒක ගොඩාක් ගණන්. ඒ වගේම හොයාගන්නත් අමාරුයි. දෙයියනේ මේ මොකද වෙලා තියෙන්නේ? ක්‍රීම් භාජනේ සම්පූර්ණයෙන්ම හිස්.'

ගැහැණු ළමුන් දෙදෙනා එකිනෙකා දෙස පුදුමයෙන් බලා සිටිති. මේසයේ එයා පැත්තේ වාඩිවී සිටි ක්ලෝඩින් සිද්ධවන්නේ කුමක්දැයි බලා සිටියා ය. ඒ අතර මේසයෙන් නැගිට ගත් ඇන්ජෙලා කෝපයෙන් බෙරිහන් දෙන්නට වූවා ය.

'දෙයියනේ මෝඩ ඇන්ටනට් තමයි මේ විනාසේ කරලා තියෙන්නේ. එයා මගේ හොඳම ක්‍රීම් එක ගාලා සපත්තු පොලිෂ් කරලා. අනේ දෙයියනේ මගේ වටිනාම ක්‍රීම් එක සම්පූර්ණයෙන්ම ඉවරයි. ඒවා දැන් තියෙන්නේ මගේ සපත්තුවල විතරයි.'

'හැබැයි ඇන්ජෙලා. දැන් ඔයාගේ සපත්තු නම් ගොඩාක් ලස්සනට දිලිසෙනවා. සමහර විට ඇන්ටනට් ට වරදින්න ඇති. එහෙමත් නැතිනම් ඔයාගේ හොඳ සපත්තු වලට සාමාන්‍ය පොලිෂ් ගාන්න හොඳ නැතිවෙයි කියලා එයා හිතන්න ඇති. ඒ හින්දා මුහුණේ ගාන වටිනා ක්‍රීම් එක ගාලා සපත්තු පොලිෂ් කරන්න ඇති.'

මෙතෙක් වෙලාවක් නිහඬව සිටි ක්ලෝඩින් එසේ කියද්දී ඇන්ජෙලාගේ හිතේ තිබූ කෝපය තව තවත් වැඩි විය. ඒ නිසා ඈ කෝපයෙන් බෙරිහන් දුන්නා ය.

'එයා නම් හරිම මෝඩ කෙල්ලෙක්. ඇත්තමයි ආයේ නම් මම එයාට කියලා කිසිම වැඩක් කරගන්නේ නෑ.'

ඉන්පසුව කථා කළේ ඇලිසන් ය

'එයා එහෙම දෙයක් කරන්න ඇත්තේ ඇයි කියලා මට හිතාගන්න පුළුවන්. ඇන්ටනට්ත් හරියටම අපේ ක්ලෝඩින් වගේමයි. ඒ නිසා එයා මේ වගේ මෝඩ වැඩක් කරන්න ඇති. එහෙම නේද

Scanned with CamScanner

sinhalaebooks.com



ක්ලෝඩින් ?.'

'හොඳයි මම මේ ගැන ඇන්ටනට් ට කියන්නම්. ඒ වගේම ඇන්ජෙලා ආයේ එයාට කියලා වැඩ කරවා ගන්න කැමැති නෑ කියලත් මම කියනවා. අහිංසක ළමයා. මම එහෙම කීවම එයාට ගොඩාක් දුක හිතෙයි.'

ක්ලෝඩින් එසේ කියද්දි ඇන්ජෙලා කල්පනා කරන්නට වූවා ය. සමහර විට ඇන්ටනට් හට වැරදීමක් සිදුවන්නට ඇතැයි ඇයට සිතිනි. එහෙම නැතිව ඇන්ටනට් හිතාමතාම වැරදි කරන ළමයෙක් නොවේ. එපමණක් ද ඇන්ටනට් සිනාසෙද්දි මොන තරම් ලස්සන ද? මෙවැනි අහිංසක ළමයෙකුට සාමාන්‍යයෙන් සිදුවන වැරදි වලට සමාවක් දිය යුතු ය. තම සිතත් සමඟ බොහෝ තර්ක විතර්ක වල යෙදුන ඇන්ජෙලා ඇන්ටනට් හට තවත් අවස්ථාවක් ලබාදෙන්නට තීරණය කළා ය.

'හොඳයි මම ඇන්ටනට් ට සමාව දෙන්නම්. ඒ වගේම මම එයාට තවත් අවස්ථාවක් දෙන්නත් කල්පනා කළා. අපි කා අතිනුත් වැරදි සිද්ධ වෙනවනේ.'

ඇන්ජෙලා එසේ කියද්දි ක්ලෝඩින් නැවත වතාවක් තම සහෝදරියන් ගැන කියන්නට උත්සාහ කළා ය.

'ඒකනම් ඇත්ත තමයි. ඔයා දන්නවද ඇන්ජෙලා. මගේ සහෝදරිය මාරි. එයා අතිනුත් ගොඩාක් වෙලාවට වැරදි වෙනවා. ඒ වුනාට එක දවසක්......'

'අනේ ඇති... ඇති... ඔයා දැන්මම මෙතැනින් යන්න. ඔයාටයි ඇන්ටනට් ටයි කියන්න වෙන කිසිම කාරණයක් නැද්ද ?. ඔයාලා දෙන්නටම පම්පෝරි ගහන්න තියෙන්නේ මහ ලොකු සහෝදරියෝ ගැන විතරයි.'

ඇන්ජෙලා කෝපයෙන් බෙරිහත් දෙද්දි ක්ලෝඩින්

Scanned with CamScanner

sinhalaebooks.com



නිහඬවම කාමරයෙන් පිටවූවා ය. ඉන්පසුව ඇ කෙලින්ම ගියේ ඇන්ටනට් සොයාගෙනයි. ඇගේ උපක්‍රමය සාර්ථක වූ බව කියන තෙක් ක්ලෝඩින්ට ඉවසිල්ලක් නැත.

' හරිම ෂෝක්. ඊළඟ සැරේ මම ගොඩාක් මෝඩ ළමයෙක් වෙනවා. ඇත්තමයි කාටවත් හිතාගන්න බැරි තරම් මෝඩ ළමයෙක් වෙනවා.'

ඇන්ටනට් සතුටෙන් උතුරා යන කටහඬකින් කියද්දි ක්ලෝඩින් ද තම සහෝදරියගේ සිතාවට එක් වූවා ය.

ඊළඟ දිනයේදි නැවතත් ඇන්ජෙලාගෙන් ඇන්ටනට් හට පණිවුඩයක් ලැබුනේ ය. ඇන්ටනට් මවාගත් අහිංසක කමකින් යුතුව ඇන්ජෙලාගේ කාමරයට ඇතුළුවූවා ය. ඇගේ දෙනෙත් පොළවට යොමු වෙලා ය.

'අනේ ඇන්ජෙලා. මට ඊයේ ලොකු වැරැද්දක් සිද්ධ වුනා කියලා මගේ අක්කා ක්ලෝඩින් කීවා. දෙයියනේ මම කරලා තියෙන්නේ මොන තරම් මෝඩ වැඩක් ද ? ඇත්තමයි මම නම් හරිම මෝඩ ළමයෙක්.'

ඇන්ටනට් ගේ කටහඬ සිහින් ය. එහි කිසියම් කපටි බවක් මෙන්ම අහිංසක කමක් ද තැවරී තිබේ.

' ඒකට කමක් නෑ. අනික් ගොඩාක් දුක හිතෙන විදිහට මම දිහා බලන්නත් එපා ඇන්ටනට්. අපි දැන් ඒ පහුගිය දේවල් අමතක කරමු. කොහොම වුනත් මම ඔයාට ටෝනි කියලා කථා කරන්නම්. ඇන්ටනට් කියලා කථා කරනවට වඩා ටෝනි කියලා කථා කරන එක ගොඩාක් හිතවත් කියල මට හිතෙනවා.'

ඇන්ජෙලා එසේ කියද්දි ඇන්ටනට් සුන්දර සිනාවක් පෑවා ය. තමා කළ ක්‍රියාව මෙතරම් ඉක්මනින් අමතක කරන්නට ඇන්ජෙලා සූදානම් වුන එක ගැන ඇගේ හිතේ තිබෙන්නේ සතුටකි. එමෙන්ම මේ මෝඩ ප්‍රංශ කෙල්ල පහසුවෙන් රවට්ටා ගන්නට ලැබුනා යැයි

Scanned with CamScanner

ඇන්ජෙලා ද යටි සිතින් සතුටු වූවා ය. වැඩි දවසක් නොගොසින් ම ඇන්ටනට් හට අමතක නොවන පාඩමක් ඉගැන්විය යුතු යැයි ද ඇන්ජෙලා කල්පනා කළා ය.

' ඇන්ජෙලා. අද මොනවද මම ඔයාට කරලා දෙන්නේ ?. පොලිෂ් කරන්න සපත්තු තියෙනව ද?'

' නෑ ටෝනි. අද නම් සපත්තු නෑ. හැබැයි අපිට හවස තේ වලට ගන්න ඇන්කෝවි ටෝස්ට් ටිකක් හදන්න ඔයාට පුළුවන් නේද ?.'

' අනේ කරුණාකරලා මට ඒ ගැන කියලා දෙනව ද?'

ඇන්ටනට් කිසිවක් නො තේරෙන්නාක් මෙන් අහිංසක ලෙස ඇසුවා ය.

' අනේ... අනේ... ඔයා ඇන්කෝවි ටෝස්ට් හදන හැටි වත් දන්නේ නැද්ද ?.'

ඇන්ජෙලා ගේ හඬ පුදුමයෙන් බරවෙලා ය.

'ඉස්සර වෙලාම සාමාන්‍ය බටර් ටෝස්ට් ටිකක් හදන්න. ඊට පස්සේ ටෝස්ට් වලට උඩින් ඇන්කෝවි සෝස් ගාන්න. එච්චරයි. අර කබඩ් එක උඩ බලන්නකෝ. ඇන්කෝවි සෝස් එක එතැන ඇති. අපි තුන් දෙනෙකුට ඇති වෙන්න ටෝස්ට් හදන්න හොඳද ?. මොකද අද හවස ඈන් මාරිත් එනවා. එයාගේ අළුත්ම කවිය ගැන අපිත් එක්ක කථා කරන්න.'

''ආ.. ඈන් මාරි. එයා හරිම අපූරු ළමයෙක්. ඔයා දන්නවද ඇන්ජෙලා. මගේ අක්කා කෙනෙක් ඉන්නවා ලුවිස්. එයාටත් හරිම ලස්සනට කවි ලියන්න පුළුවන්. එයා ලියන කවි.....'

පාන් ගෙඩිය පෙති කපන අතරේ ඇන්ටනට් දිගු විස්තරයක් කරන්නට උත්සාහ කළත් ඇන්ජෙලා එය වලක්වා මෙසේ කීවා ය.

Scanned with CamScanner

sinhalaebooks.com



'අනේ ටෝනි මට දැන් කෙනෙක් හම්බ වෙන්න යන්න තියෙනවා ඔයා ගොඩාක් පරිස්සමට ටෝස්ට් ටික හදන්නකෝ. හැබැයි ඊයේ වගේ මෝඩ වැඩ නම් කරන්න එපා. හොඳද ?.'

'ඇන්ජෙලා. අනේ මාව විශ්වාස කරන්නකෝ. ඔයාගේ පුංචි ටෝනි මේ සැරේ නම් වරද්දන්නේ නෑ. ඔයා මෙයට ඉස්සර කවදාවත් කාලා නැති තරම් රසවත් ටෝස්ට් ටිකක් මම හදලා තියන්නම් කෝ.'

ඇන්ටනට් අවංක හඬකින් කියා පාන් පෙත් ගිණි උඳුන මත තැබුවා ය. ඒ සමඟම ඇන්ජෙලා කාමරයෙන් පිටව ගියා ය. ඇත්තෙන්ම ඇය කාමරයෙන් පිටවූනේ ඇන්ටනට්ගේ කරදරකාරී කථා බහෙන් බේරෙන්නටයි. තමා ආපසු එන විට ඇන්ටනට් අපූරුවට ටෝස්ට් සාදා තබනු ඇතැයි විශ්වාසයක් ද ඇන්ජෙලාගේ හිතේ තිබේ.

ඇන්ජෙලා කාමරයෙන් නික්ම යනවාත් සමඟ ඇන්ටනට් හනි හනික තමන්ගේ රාජකාරිය පටන්ගත්තා ය. ඇය මුලින්ම පාන් පෙති කපා ටෝස්ට් හයක් සෑදුවා ය. ඉන්පසුව කබඩය උඩ තිබූ කිසියම් බඳුනක් පිටතට ගත්තා ය. හැබැයි එහි තිබුනේ ඇන්කෝව් සෝස් නම් නොවේ. දුඹුරු පැහැති සපත්තු පොලිෂ් ය. ඇත්තෙන්ම සපත්තු පොලිෂ් සහ ඇන්කෝව් සෝස් පෙනුමෙන් එක සමානය. තවත් ටික වෙලාවකට පසුව ඇන්ටනට් හොර පූසෙකු මෙන් ටෝස්ට් මත සපත්තු පොලිෂ් ආලේප කළා ය. ඉන් පසුව සපත්තු පොලිෂ් දමා සෑදූ ටෝස්ට් තොගය පිඟානක් මත තැබූ ඇන්ටනට් කිසිවක් සිදු නොවූවාක් මෙන් කාමරයෙන් පිටව ගියා ය.

තවත් ටික වෙලාවක් යන්නට පෙර ඇලිසන් කාමරයට ඇතුළු වී ගිනි උඳුන අසල වාඩි වූවා ය. ඊළඟට ඇන්ජෙලා කාමරයට එබුනා ය. මේ වනවිටත් ඇන්ටනට් කාමරයෙන් පිටව ගොසිනි.

'කෝ අර කථා පෙට්ටිය ගිහින්ද ?. එයාගේ අක්කලා ගැන

Scanned with CamScanner

කියන පම්පෝරි අහන්න බැරි හින්දා මම කාමරයෙන් එළියට යන්න ගියා. ආ.. මොනව වුනත් එයා හරිම අපූරු ටෝස්ට් ටිකක් නම් හදලා තියෙනවා. හලෝ. ආ මෙන්න ඈන් මාරිත් එනවා.'

ඇන්ජෙලා දිගින් දිගටම කියාගෙන යද්දි ඈන් මාරිත් කාමරයට ඇතුළු වූවා ය. ඇගේ මලානික මුහුණේ තිබෙන දෑස පුරාම ඇත්තේ කිසියම් විඩාබර බවකි.

'ඈන් මාරි. ඔයාට ගොඩාක් මහන්සි වගෙයි. මොකද ඊයේ රෑ ගොඩාක් නිදි වැරුව ද ?. අනේ ඔයා වගේ මටත් කවි ලියන්න පුළුවන් නම් මොන තරම් හොඳ ද?.'

ඇන්ජෙලා එසේ කියද්දි ඈන් මාරි තමාගේ සෝබර කටහඬෙන් මෙසේ කීවා ය.

'මම ඊයේ රෑ දොළහ විතර වෙනකම් මේ කවිය ලියුවා. අපේ කාමරේ ලයිට් පත්තු වෙලා තියෙනවා කවුරුවත් දැක්කු නැති එක මගේ වාසනාවක්. ආ... දැනටමත් තේ ලෑස්තියි වගේ. නියමයි. අපි එහෙනම් තේ එකක් බොන ගමන් ම කවිය ගැන කතා කරමු.'

sinhalaebooks.com

# ගැහැණු ළමයින්ට අකරතැබ්බයක්

ඇන්ජෙලා මේසය මත තිබූ ටෝස්ට් පිඟාන අතට ගත්තා ය. ඉන්පසුව ඈ ආඩම්බරයෙන් මෙසේ කීවා ය.

' අපිට ඇන්කෝවි ටෝස්ට් ටිකක් හදලා දෙන්න කියලා මම ඇන්ටනට් ට කීවා. එයා හරි අපූරුවට ටෝස්ට් හදලා නේද ?. ඈන් මාරි. ගන්න ටෝස්ට් එකක්.'

ඈන් මාරි පිඟානේ උඩින්ම තිබූ ටෝස්ට් එක අතට ගත්තා ය. පුදුමයකි. ටෝස්ට් එකෙන් නැගෙන්නේ අමුතු සුවඳකි. ඈන් මාරි ඇන්ජෙලා දෙස බලා සිටියේ විශ්මයෙනි.

' බයවෙන්න දෙයක් නෑ ඈන් මාරි. ඇන්කෝවි සෝස් වල සාමාන්‍යයෙන් අමුතු සුවඳක් තියෙනවා.'

එසේ කියූ ඇලිසන් ද ටෝස්ට් එකක් අතට ගත්තා ය. ඉන්පසුව ඇලිසන් සහ ඈන් මාරි එක්වරම තමන් අතේ තිබූ ටෝස්ට් පෙති කටට දමා ගත්හ. ඇන්ජෙලා ද සපත්තු පොලිෂ් සහිත ටෝස්ට්

Scanned with CamScanner

sinhalaebooks.com



පෙත්තක රස බැලුවා ය. අමුතු ගඳක් සමඟින් හැපෙන පාන් පෙති වල කටුක රස නිසා ගැහැණු ළමුන් තිදෙනා වහ වහා තමන්ගේ කටේ තිබූ ටෝස්ට් කැබැලි පැත්තකට විසිකර දැමූ හ. සපත්තු පොලිෂ් ටෝස්ට් වැඩියෙන්ම කෑවී තිබුනේ ඈන් මාරි හටයි. ඒ නිසා ඇය තම ලේන්සුව ගෙන කට පිස දමාගන්නට ද අමතක නොකළා ය. ඒ අතරම ඈ හයියෙන් කෑ ගසන්නට ද වූවා ය.

'දෙයියනේ මොනවද මේ ජරාව.? මට වස කැවුන ද ?.'

ඈන් මාරි ළඟම ඇති නාන කාමරය සොයාගෙන දුවයද්දි අනිත් ගැහැණු ළමයින් දෙදෙනා ද ඈ පසුපස දුව ගිය හ. ඈන් මාරි නාන කාමරය අසලට ළංවෙද්දි වමනය යන්නට ඉතාම ආසන්න ය. ඇගේ දෑසින් කඳුළු කඩා හැලේ. හති හතික කට සෝදාගත් ඈ ඈන්ජෙලා ගෙන් මෙසේ ඇසුවා ය.

'ඈන්ජෙලා. මොනවද ඒ ජරාව ?. ඔය කොහෙන්ද ඒ සෝස් එක හොයාගත්තේ ?.

'අනේ හරිම අප්පිරියයි.'

ඇලිසන් ද තම මුඛය දෙතුන් පාරක් සෝදා හරින ගමන් කීවා ය.

'අනේ ටෝස්ට් ඔක්කොම විසි කරන්න සිද්ධ වුනා. ඒක හරිම අපරාදයක්. දෙයියනේ ඈන්ජෙලා ඔයා කොහෙන්ද මේ තරම් ජරා සෝස් එකක් හොයාගත්තේ ?. මේ තරම් ජරා රසක් තියෙන ඈන්කෝවි සෝස් එකක් මම නම් මෙයට ඉස්සර කාලා නෑ. ආයේමත් කන්නේ නෑ කියන එකත් ස්ථිරයි.'

ඈන්ජෙලා ගේ හිත දුකෙන් සහ කෝපයෙන් පිරී ඉතිරී ගියේ ය. මෝඩ ඈන්ටනට් මෙවර කරන්නට ඇත්තේ කුමක් ද ?. ඒ ඒ ගැන සිතන ගමන්ම ඔවුන් නැවතත් පාඩම් කාමරයට ආවෝ ය. ඈන්ජෙලා හති හතික කුඩා කබඩය අසලට ගොස් විපරම් කළා ය. ඈන්කෝවි සෝස් බඳුන එලෙසම තිබේ. එයින් ටිකක් වත් ඉවර වී

Scanned with CamScanner

sinhalaebooks.com



නැත එසේනම් ඇන්ටනට් පාන් වල තවරන්නට ඇත්තේ කුමක් ද?

ඒ අතර ඇලිසන් කබඩයේ තිබූ දුඹුරු පැහැති සපත්තු පොලිෂ් භාජනය අතට ගෙන විවෘත කළා ය. එහි තිබූ සපත්තු පොලිෂ් සියල්ලම ඉවර වෙලා ය. සිදුව ඇති දේ ඇයට වටහා ගත හැකිය. ඇලිසන් කෝපයෙන් බෙරිහන් දුන්නේ ඒ නිසා ය.

'මේ බලන්නකෝ. ඒ නපුරු කෙල්ල ටෝස්ට් වල ගාලා තියෙන්නේ සපත්තු පොලිෂ්. දෙයියනේ අපි හැම දෙනාම සපත්තු පොලිෂ් කෑවා.'

ඇන්ජෙලා ගේ මුහුණ කෝපයෙන් සුදුමැලි වූයේ සැනෙකිනි. වහා වහා කාමරයෙන් පිටතට ආ ඇය වටපිට බැලුවා ය. පළමු වාරයේ කුඩා ගැහැණු ළමයෙක් කාමරය අසලින් ඇවිද යන ආකාරය ඇන්ජෙලා දුටුවා ය.

' හේයි මොලි. ඉක්මනට ගිහිං ඇන්ටනට් ව හම්බ වෙන්න. ඊට පස්සේ එයාට පුළුවන් තරම් ඉක්මනට මගේ කාමරේට එන්න කියලා කියන්න.'

' හොඳයි ඇන්ජෙලා.'

එසේ කියූ මොලි ඉක්මනින් ම පිටව ගියා ය. වැඩි වෙලාවක් යන්නට පෙර ඇන්ටනට් ඔවුන්ගේ කාමරය අසල පෙනී සිටියා ය. ඇගේ කළු පැහැති දෑස බයෙන් මුසපත් වෙලා ය. දෙතොල වෙවුලයි.

'ඇන්ටනට්. ඔයා කොහොමද අපේ ටෝස්ට් වලට සපත්තු පොලිෂ් දැම්මේ.?

' ඔයා හැදුවේ අපි තුන් දෙනාටම වස දෙන්න ද?. ඇන්කෝවි සෝසු යි සපත්තු පොලිෂු යි අඳුන ගන්න බැරි නම් ඔයා හරිම මෝඩ ළමයෙක්. ඔයා නිසා අපි තුන් දෙනාටම අසනීපයි. බැරිවෙලාවත් මේ ගැන මේට්‍රන් දැනගත්තොත් කිසිම සැකයක් නෑ එයා මිස් ජේන්ක් ට මේ ගැන කියයි. එහෙම වුනොත් ඔයාට සමාවක් නම්

Scanned with CamScanner

sinhalaebooks.com



ලැබෙන එකක් නෑ. තේරුනාද ඇන්ටනට් ?.'

ඇන්ජෙලා බෙරිහන් දෙද්දී ඇන්ටනට් අහිංසක ලෙස මෙසේ කීවා ය.

'අනේ.. අනේ ඔයාගේ පුංචි ටෝනි ට ඔය විදිහට බනින්න එපා ඇන්ජෙලා. ඔයා මට ගොඩාක් අනුකම්පා කෙරුවා. ඒ නිසාම නේ ඔයා මට ටෝනි කියලා කථා කරන්නත් පටන් ගත්තේ. අනේ මට බනින්න එපා. මම මගේ තේ වෙලාව පැත්තකට දමලා ඔයාලට ආයෙමත් ටෝස්ට් හදලා දෙන්නම්. මට මේ සැරේ නම් වරදින්නෙ නෑ. ඇත්තමයි මම මේ සැරේ නම් ඇන්කෝවි සෝස් ම පාන්වලට දමන්නම්.'

' ඔයා දෙපාරක්ම වැරදි කළා. ඒ හින්දා මේ පාරත් මම ඔයාව විශ්වාස කරයි කියලා හිතනව ද ?. '

ඇන්ජෙලා කෝපයෙන් බෙරිහන් දුන්නා ය. සපත්තු පොලිෂ් වල අප්‍රසන්න රස තවමත් ඇගේ මුව තුළ තිබෙන්නාක් මෙනි.

'ප්‍රංශ කෙල්ලෝ මේ වගේ මෝඩ වැඩ කරනවා කියලා මම දැනගෙන හිටියා. ඒත් ඔයා එහෙම කරයි කියල නම් මම හිතුවෙ නෑ. බලන්න. ඔයා කරපු වැඩේ හින්දා අපි තුන් දෙනාටම හොඳටම අසනීපයි. ඇන් මාරි ට ගොඩාක්ම අසනීපයි.'

' අනේ සිද්ධ වුන දේ ගැන මට හරිම කනගාටුයි. අනේ ඇන්ජෙලා. මම හෙට ත් එන්න ද?. ඇත්තමයි. මම හෙට කිසිම වැරැද්දක් කරන්නේ නෑ. අනේ ඇන්ජෙලා. ඔයා මට හෙටත් කථා කරන්න. ඔයාගේ පුංචි ටෝනි ඔයා කියන හැමදේම කරලා දෙනවා.'

ඇන්ටනට් එසේ කීවද ඇන්ජෙලා වෙනත් තීරණයක් ගෙන තිබුනා ය.

'හෙට මම වයලට් හිල් ට එන්න කියනවා. දැන් ඉතින් කරුණාකරලා මෙතැනින් යන්න. ඔයා නම් හරිම මෝඩ ළමයෙක්

Scanned with CamScanner

sinhalaebooks.com



ඇන්ටනට්.'

ඇන්ටනට් හති හතික එතැනින් නික්ම ගියා ය. ඇගේ හිත පුරා තිබෙන්නේ ප්‍රීතියකි. කුඩා ගැහැණු ළමයා එතැනින් ගියාට පසුව ඇන්ජෙලා නැවතත් කථා කරන්නට වූවා ය.

'එයා මෙට ඉදන් කිසිම වැරැද්දක් නැතිව වැඩ කරනවලු කවුද ඔය කථා විශ්වාස කරන්නේ ?. මම එයාව හොඳට රවට්ටගෙනයි හිටියේ. මම කියන හැම දෙයක්ම එයා කලා. ඒ මොනව වුනත් එයාට තවත් අවස්ථාවක් දෙන්න තරම් මම මෝඩයෙක් නෙවෙයි. එයාට තව අවස්ථාවක් දෙන්න සූදානම් නෑ කියලා කීවම ඇන්ටනට් ට ගොඩාක් දුක හිතෙන්න ඇති.'

'මට නම් තේ බොන්න හිතෙන්නෙත් නෑ. ඈන් මාරි ඔයා මොකද කියන්නේ ?.'

මේසය මත ඉතිරිව ඇති ටෝස්ට් පිඟාන දෙස අප්‍රසන්න ලෙස බලන ගමන් ඇලිසන් ඇසුවා ය.

' මටත් එපා.'

ඈන් මාරි ද අප්පිරියාවෙන් කීවා ය.

'මට නම් දැන් ගොඩාක් අසනීපයි වගේ. කවිය කියවන්නත් හිතෙන්නේ නෑ. මේ ජරා සපත්තු පොලිෂ් හින්දා හැම දෙයක්ම අවුල් වුනා.'

' අනේ ඒ වුනාට කොහොම හරි ඔයාගේ කවිය කියවන්න. ඒක මොකක් ගැන ලියපු කවියක් ද ?'

ඇන්ජෙලා ආයාචනාත්මකව කීවා ය. කවි අසන්නට ඇගේ හිතේ තිබෙන්නේ දැඩි කැමැත්තකි.

' මම මේ පාර ලීවේ ශීත ඍතුවෙ තියෙන දුක්බර ගතිය ගැන. ඇත්තටම ඒක හරිම දුක හිතෙන කවියක්.'

Scanned with CamScanner

sinhalaebooks.com



ඈන් මාරි කවිය අතට ගත්තා ගමන් කීවා ය. ඒ සමගම ඇලිසන් ද කථා කරන්නට වූවා ය.

'ඔයාගේ හැම කවියක්ම හරිම දුක්බරයි ඈන් මාරි. ඇයි ඔයා දුක හිතෙන කවිම ලියන්නේ ?. ඇත්තටම ගොඩාක් සතුටු හිතෙන කවි අහන්න නම් මම හරිම ආසයි.'

'ඇත්තම කියනව නම් මම එච්චර සතුටෙන් ඉන්න කෙනෙක් නෙමෙයි. ඇත්තටම කවියෝ ගොඩාක් සතුටෙන් ඉන්න අය නෙමෙයි.'

ඈන් මාරි එසේ කීව ද ඇලිසන්ට කියන්නට තවත් බොහෝ දේ තිබුනාක් මෙනි.

'මොන බොරු ද ?. ගොඩාක් ප්‍රීතිමත් ජීවිත ගත කරන කවියොත් ඉන්නවා කියලා මම දන්නවා.'

' දැන් ඉතින් කට වහ ගන්න ඇලිසන්. හොඳයි ඈන් මාරි. ඔයා දැන් කවිය කියන්න පටන්ගන්නකෝ.'

ඇන්ජෙලා නොඉවසිලිමත්ව කියද්දි ඇලිසන් කට වසා ගත්තා ය.

ඈන් මාරි තමාගේ කවිය කියන්නට පටන්ගත්තා ය. සත්තකින්ම එය ඉතාම නීරස කවියකි. වචනවල කිසිම ආකාරයක ගැලපීමක් නැත. අදහස සිත්ගන්නේ ද නැත. ඇන්ජෙලා හෝ ඇලිසන් එම කවියට එතරම් කැමැත්තක් නොදැක්වුව ද ඒ ගැන ඈන් මාරි ට කියන්නට තරම් ඔවුන් කුරිරු වූයේ නැත. කෙසේ වුවද ඈන් මාරි අතින් ලියැවෙන්නේ මෙවැනි කවි නම් ඇයට කිසිදා දක්ෂ කවියෙක් වන්නට බැරි යැයි ඔවුන් විශ්වාස කළ හ.

'ඇත්තටම ෆෙලිසිටි එක්ක එකම කාමරේ ඉන්න ලැබුන එක ගැන ඔයාට ගොඩාක් සතුටු ඇති. එයා සංගීතයට ගොඩාක්

Scanned with CamScanner

sinhalaebooks.com



දක්ෂ කෙනෙක්නේ. අනික ඔයා ලියපු ලස්සන කවියකට සංගීතය දමන්න කියලා ෆෙලිසිටි ට කීවොත් ඒක හොඳ අදහසක් කියලා ඔයාට හිතෙන්නේ නැද්ද ?.'

ඇලිසන් අසද්දි ඈන් මාරි කිසිම උනන්දුවක් නැති කටහඬකින් මෙසේ කීවා ය.

' මම එයාගෙන් ඇහුවා. හැබැයි එයා ඒකට කැමැති නෑ.'

ඈන් මාරි එසේ කීවද සත්‍ය වශයෙන්ම සිදුවූයේ වෙනත් දෙයකි. සංගීතයක් යොදන්නට තරම් අපූරු කවි ඈන් මාරි අතින් ලියවෙන්නේ නැත. ඒවා කිසිම වැදගැම්මකට නැති කවි යැයි ෆෙලිසිටි කල්පනා කරන නිසා ඇය ඈන් මාරිගේ අදහසට කැමැත්තක් දක්වන්නේ නැත.

'ඈන් මාරි. ඔයා මොකක් හරි හොඳ කවියක් ලියන්නකෝ. එතකොට මට පුළුවන් ඒකට සංගීතය දමන්න. එහෙම නැතිව දෙවැනි පංතියේ වචන ටිකකට මගේ වටිනා සංගීතය නාස්ති කරන්න නම් මම කැමැති නෑ.'

එක් දිනක් ෆෙලිසිටි එසේ කීයද්දි ඈන් මාරි ගේ හිතට දැනුන දුක තිමක් නැත.

ඊළඟ මොහොතේදි ඔවුන්ගේ කාමරයේ දොර සැනෙකින් විවෘත විය. එයින් ඇතුළු වූයේ මේට්‍රන් ය. ඈ කලබලයෙන් මෙන් ඔවුන්ගෙන් මෙසේ ඇසුවා ය.

'ළමයි. ඔයාලා සපත්තු පොලිෂ් දමපු ටෝස්ට් කෑවා කියලා මට ආරංචියක් ආවා. හැබැයි ගොඩාක් බරපතල දෙයක් සිද්ධ වුනේ නෑ කියලා මට හිතෙනවා.'

ඈන්ටනට් හට කිසියම් දඬුවමක් ලබා දෙන්නට මෙය කදිම අවස්ථාවක් බව ඇන්ජෙලා ට සිහිපත් වූයේ ඒ අවස්ථාවේදි ය. ඇය රූක්ෂ කටහඬකින් මෙසේ කීවාය.

Scanned with CamScanner

sinhalaebooks.com



'අනේ මේට්‍රන්. බලන්නකෝ අපිට සිද්ධ වුන දේ. සපත්තු පොලිෂ් දමලා හදපු ටෝස්ට් අපි ට ගොඩාක් කැවුනා. ඈන් මාරි ට වමනෙත් ගියා. එයාට අසනීපයි. අපිටත් ගොඩාක් අසනීප වෙයි කියලා මට හිතෙනවා. එහෙම වුනොත් ඊ. වෙනකොට අපිට සෑහෙන්න අමාරු වෙයි.'

'මටත් එහෙම හිතෙනවා. මට ගොඩාක් වමනේ ගියා. ඒ හින්දා අපි හැම දෙනාම අසනීප වෙයි කියලා මට බයයි.'

ඈන් මාරි ගේ කටහඬ ගොත ගැසේ.

'එහෙම නම් ඔයාලා හැම දෙනාටම ඇවිත් මගෙන් බෙහෙත් වට්ටෝරුවක් ගන්න වෙනවා.'

මේට්‍රන් වරියගේ කටහඬ බැරෑරුම් ය.

' මොකද සපත්තු පොලිෂ් වල ශරීරයට විෂ වෙන දේවල් තියෙනවා. ඒවා සති ගාණක් විතර ඔයාලගේ ඇඟ ඇතුලේ තියෙන්න පුළුවන්. ඒ හින්දා විෂ නැති වෙන බෙහෙත් වට්ටෝරුවක් ඉක්මනට ගන්න වෙනවා. එන්න. හැම දෙනාම දැන් මගේ කාමරයට යමු.'

මේට්‍රන් වරියගේ කටහඬ ඇසුනු සැනින් ගැහැණු ළමුන් තිදෙනා එක්නෙකා ගේ මුහුණු බලාගත් හ. මේට්‍රන්වරියගේ බෙහෙත් වට්ටෝරු යනු සැනසිල්ලේ සිතන්නට පුළුවන් දෙයක් නොවේ. ඒවා කටේ තබන්නටවත් බැරි තරම් කටුක රසකින් යුතු බෙහෙත් ය. තමන් කළේ මොන තරම් මෝඩ වැඩක් ද යන්න ඇන්ජෙලා ට වැටහුනේ ඒ අවස්ථාවේදී ය. තමන් කියූ දෙය වෙනතකට හරවන්නට ඇය උත්සාහ කළේ ඒ නිසා ය.

'අනේ මේට්‍රන්. ඔයා හිතන තරම් නරක දෙයක් සිද්ධ වෙලා නෑ කියලා අපිට විශ්වාසයි. අනික සපත්තු පොලිෂ් කටට ආපු ගමන්ම අපි ඒවා එළියට දැම්මා. අපි හොඳට කටත් හේදුවා. ඒ හින්දා අපිට කිසිම අමාරුවක් නෑ. මට සහතිකයි.'

Scanned with CamScanner

sinhalaebooks.com



ඇන්ජෙලා සිහින් සිනාවක් මුවගට නගාගෙන කීවද මේට්‍රන් වරිය එය පිළිගන්නට සූදානම් නැතුවා සේ ය.

'ආ... කමක් නෑ. මොනව වුනත් මම් ඔයාලගේ ආරක්ෂාව ගැන හිතන්න ඕනෑ. ඒ හින්දා ඔයාලට මේ විදිහට නම් ඉන්න දෙන්න බෑ. ඉක්මනට එන්න. මම ඔයාලට පොඩි බේත් වට්ටෝරුවක් දෙන්නම්. එතකොට ඔය තියෙන හැම අවධානමක් ම නැතිවෙලා යයි.'

'ඒ වුනත් මේට්‍රන්.'

ඇලිසන් කථා කරන්නට සූදානම් වුවත් එයින් කිසිම ප්‍රයෝජනයක් වූනේ නැත. මක්නිසාදයත් තමන් තීරණය කළ කිසිම දෙයක් වෙනස් කරන්නට මේට්‍රන් වරිය සූදානම් නැත. ඒ නිසා ඇගේ බෙහෙත් වට්ටෝරුව ලබාගැනීම අනිවාර්යයෙන්ම කරන්නට ගැහැණු ළමුන් තිදෙනාට සිදුවෙයි.

ගැහැණු ළමුන් තිදෙනා මේට්‍රන් වරිය පසු පස සෙමෙන් සෙමෙන් ඇවිද යති. ඔවුන්ගේ මුහුණු මලානික ය. කිසිම ප්‍රීතිමත් බවක් පෙනෙන්නට වත් නැත. පස් වැනි සහ හය වැනි වසරවල ගැහැණු ළමුන් ගේ දුක සැප පිළිබඳව වඩාත් විමසිලිමත් වීම මේට්‍රන්වරියගේ වගකීමකි. ඔවුන් ට කිසියම් අසනීපයක් ඇති වුවහොත් ඉක්මනින් ම බෙහෙත් වට්ටෝරුවක් නියම කිරීම ද ඇගේ සිරිතයි. කෙසේ වුවත් එම බෙහෙත් වට්ටෝරුවට නම් පාසලේ කිසිම කෙනෙක් කැමැති නැත. එය ඉතාම කටුකය. අප්‍රසන්න ය.

තමන්ගේ කාමරයට කැඳවා ගෙන ගිය ගැහැණු ළමයින්ට බෙහෙත් මේස හැන්දක් බැගින් මේට්‍රන් වරියගෙන් ලැබුනා ය. එහි රස සපත්තු පොලිෂ් වලටත් වඩා අප්‍රසන්න යැයි ගැහැණු ළමයින් ට වැටහුන හ.

'ඊයා..... මේට්‍රන්. මෙයිට වඩා හොඳ රසයක් තියෙන බෙහෙත් ටිකක් ඔයාට ගෙනෙන්න බැරි ද ?. ආයේ නම් ඔයාගේ ජරා බෙහෙත්

Scanned with CamScanner

මම නම් බොන්නේ නෑ.'

ඇලිසන් බෙහෙත් වට්ටෝරුව මුවට දමාගන්නා ගමන් කීවා ය. ඇගේ මුහුණ අප්‍රසන්න බවෙන් හැකිළී ඇත.

'මම ළඟ මෙයටත් වඩා සැර බෙහෙත් වට්ටෝරුවක් තියෙනවා. ඒකෙනුත් ටිකක් බොන්න ඔයා කැමැති ද?'

මේට්‍රන් වරිය එසේ අසද්දි ඇලිසන් විගසින් ම කථා කළා ය.

'ආපෝ නෑ.. ඒක නෙවෙයි මේට්‍රන්. අපිට සපත්තු පොලිෂ් කැවුනා කියලා ඔයා කොහොමද දන්නේ ?. අපි ඔයාට ඒ ගැන වචනයක්වත් කීවේ නෑ. ඇත්තටම කවුද ඔයාට ඒ ගැන කීවේ ?.'

'අර අහිංසක ඇන්ටනට් තමයි මට ඒ ආරංචිය කීවේ.'

මේට්‍රන් වරිය බෙහෙත් බෝතලය සොලවන ගමන් කීවා ය.

' අහිංසක ළමයා. එයා ගොඩාක් බයවෙලා මම ළඟට දුවගෙන ආවා. එයා කරපු වැරැද්දක් නිසා ඔයාලා තුන් දෙනාට සපත්තු පොලිෂ් කැවුනා කියලා මට කීවා. ඔයාලා තුන් දෙනා අද රෑ වෙනකොට මැරෙයි කියලා එයා හොඳටම බයවෙලයි ඉන්නේ. ඉතින් ඔයාලට බේරාගන්න මට කරන්න පුළුවන් දෙයක් කරන්න කියලත් ඇන්ටනට් මට කීවා.'

ගැහැණු ළමුන් තිදෙනා මේ කථාව අසා සිටියේ පුදුමයෙනි. ඇන්ටනට් මොන තරම් කපටි. එමෙන්ම නපුරු ගැහැණු ළමයෙක් ද?. ඇය ඔවුන්ට සපත්තු පොලිෂ් තැවරූ ටෝස්ට් කන්නට දුන්නා පමණක් නොව. මේට්‍රන් වරියගේ අප්‍රසන්න බෙහෙත් වට්ටෝරුවක් ලබාදෙන්නට ද සැළසුම් කර ඇත.

' ඇන්ටනට් මොන තරම් බයවෙලා ද කියලා ඔයාලට හිතාගන්න බෑ. අහිංසක කෙල්ල. මට නම් එයා ගැන හරිම දුකයි.

sinhalaebooks.com

එංගලන්ත ගැහැණු ළමයි නම් වරදක් වුනාම මේ තරම් බය වෙන්නේ නෑ. ඒ වුනාට ඇන්ටනට් නම් ගොඩාක් බයවෙලා. මම එයාට චොකලට් එකකුත් දීලා හිත සැනසුවා. පළමුවැනි සහ දෙවැනි වසර වල ළමයින්ගේ හිත් වල ඇතිවෙන බය නැති කරන්න චොකලට් හරිම අපූරු බෙහෙතක් කියලා මම දන්නවා.'

ඇන්ටනට් හට මේට්‍රන් ගෙන් චොකලට් එකක් ලැබුන බව දැන ගැනීම ඇන්ජෙලා. ඇලිසන් සහ ඈන් මාරි ගේ හිත්වලට කිසියම් කෝපයක් ගෙන දෙන්නට හේතු විය. ඒ නිසා ඉක්මනින්ම ඇන්ටනට් සොයාගෙන ගොස් තමන් ගේ හිත්වල තිබෙන කෝපය ඇයට පැවසිය යුතු යැයි ඔවුන් කල්පනා කළ හ.

'ඒක නෙවෙයි මේට්‍රන්. ඇන්ටනට් ඉන්නේ කොහෙද කියලා ඔයා දන්නවද ?.'

ඇන්ජෙලා මේට්‍රන් වරියගෙන් ඇසුවා ය. සපත්තු පොලිෂ් සහ බෙහෙත්වල අප්‍රසන්න රසය තවමත් ඇගේ මුව තුළ රැඳී තිබෙන්නාක් මෙනි.'

' ආ... මම එයාව මැඩමොසෙල් ළඟට ඇරියා. ඇන්ටනට් ගොඩාක් බයවෙලා ඉන්නේ. ඉතින් මැඩමොසෙල් එයාගේ හිත හදයි කියලා මට සහතිකයි.'

ගැහැණු ළමෝ තිදෙනා කිසිම කථාවක් නොමැතිව නැවතත් ඔවුන්ගේ පාඩම් කාමරය වෙතට ඇවිද එන්නට වූහ. දැන් ඇන්ටනට් සොයා යාම එතරම් නුවණට හුරු දෙයක් නොවේ. මේ වනවිටත් ඇය මැඩමොසෙල් සමඟ රසවත් තේ පැන් සංග්‍රහයක් භුක්ති විඳින බවට කිසිම සැකයක් නැත. ඇන්ටනට් කියන සෑම දෙයක්ම නිවැරැදි යැයි මැඩමොසෙල් පවසනු ඇත. එමෙන්ම වැරැද්ද වැරැද්දකි. එහි පසුතැවිලි වන්නට දෙයක් නැති යැයි මැඩමොසෙල් තම ආදරණීය කුඩා ලේලියට නොඅනුමානවම කියනු ඇති බව ගැහැණු ළමුන් තිදෙනාට සහතිකය.

Scanned with CamScanner

sinhalaebooks.com



'ඉන්නකෝ...මම හෙටත් එයාට එන්න කියලා හොඳ වැඩක් කරනවා.'

ඇන්ජෙලා කෝපයෙන් බෙරිහන් දුන්නා ය.

'එයාගේ උදව් එපා කියලා මම කීවා තමයි. ඒ වුනාට මම එයාට තව පාරක් එන්න කියනවා. ඊට පස්සේ මේ වගේ ඇස් රතුවෙන විහිළු නොකරන්න මම එයාට හොඳ පාඩමක් උගන්වනවා. පුංචි නපුරු කෙල්ල. එයා හොඳ ළමයා වගේ මේට්‍රන් ළඟටත් ගිහිං බොරු කරලා. දෙයියනේ මේ කෙල්ල ක්ලෝඩින්ටත් වඩා නරකයි කියලා මට හිතෙනවා.'

ඇන්ටනට් හට තවත් වැඩ කිහිපයක් පවරන්නට ඇන්ජෙලා උත්සාහ කරයි. ඒ බව ඇසූ ඇලිසන් අවවාදාත්මක හඬකින් මෙසේ කීවා ය.

'ඇන්ජෙලා. දෙයියන්ගේ නාමෙට ආයේනම් මෝඩ වැඩ කරන්න එපා. ඇන්ටනට් කවදාවත්ම විශ්වාස කරන්න පුළුවන් ළමයෙක් නෙමෙයි. ආයේ අවස්ථාවක් ලැබුනොත් එයා මීටත් වඩා නපුරු වැඩක් කරයි. මම ඔයාට කීවා. ඇන්ටනට් කියන්නේ සාමාන්‍ය විදිහේ ළමයෙක් නෙමෙයි. එයා ඔයාව රවට්ටයි කියලා මම කල් ඇතිවම කීවා. කෝ ඔයා ඇහුව ද?....'

' කටවහ ගන්න ඇලිසන්.'

ඇන්ජෙලා ගේ කටහඬ කෝපයෙන් මෙන්ම අමනාපයෙන් ද පිරි ඇත.

'මම ඔයාට කීවා.... මම ඔයාට කීවා... කියලා හැම වෙලාවෙම කියන අය මට පෙන්නන්න බෑ. ඇන්ටනට් මෙයටත් වඩා නරක වැඩ කරනවා කියලා ඔයා කියනවා නම් මට එයාගෙන් කිසිම වැඩක් කරගන්න ඕනෑ නෑ. අදින් පස්සේ එයාගෙයි අපෙයි තිබ්බ හැම සම්බන්ධයක්ම ඉවරයි. කොහොමවුනත් එයා අපිට කරපු දේට උත්තරයක් දෙන්න තියෙනව නම් මම ඒකට හරිම කැමැතියි.'

Scanned with CamScanner

'මේ වැඩේ නම් වුනේ ඔයාගෙම වරද නිසයි. ඔයා හැමදාම පහළ පංතිවල ළමයින්ට නපුරු විදිහට සළකනවා නම් ඒ අයත් ඔයාට සලකන්නේ මෙහෙම තමයි. අපි අනිත් අය ගැන කරුණාවෙන් කල්පනා කරනවා නම් මෙහෙම දේවල් වෙන්නේ නෑ කියලා දැන්වත් තේරුම් ගත්තොත් හොඳයි. ඇන්ජෙලා.'

ඇලිසන් එසේ කියද්දි ඇන් මාරි යන්නට සූදානම් වූවා ය. මේ සිද්ධ වූ දේ නිසා තමාගේ කාව්‍යමය සිතිවිලි සියල්ලම මැකී ගියා යැයි ඇය චෝදනාත්මකව කීවා ය. තවත් ටික වෙලාවකට පසුව තමන්ගේ අග්‍රගණ්‍ය කාව්‍ය නිර්මාණයද රැගෙන ඇන් මාරි යන්නට ගියා ය.

'මේ සිද්ධ වුන දේ ගැන අපි කාටවත් වචනයක් වත් කියන්න හොඳ නෑ. එහෙම වුනොත් මුළු ඉස්කෝලෙම අපිට හිනා වෙයි. එහෙම දෙයක් වෙන්න දෙන්න හොඳ නෑ. අපි කට වහගෙන ඉදිමු.'

ඇන්ජෙලා ඇලිසන් ට එසේ කීවද එය රහසක් ලෙස වැඩි වෙලාවක් පැවතුනේ නැත. ඔවුන්ට පෙර ඇන්ටනට් පාසලේ සෑම දෙනාටම මේ කථාව පවසා තිබුනි. මුළු පාසලම මේ අපූරු විහිළුවෙන් වින්දනයක් ලබද්දි ඇන්ජෙලා පමණක් කෝපයෙන් මුසපත් වූවා ය. තමන්ට හිනාවෙන සෑම දෙනාටම ඈ වෛර කළා ය. වෙනකක් තබා ඇලිසන් ට සහ තමන්ට විහිළු කළ මිස් විල්කොක්ස් ට පවා ඇන්ජෙලාගේ කෝපය නො අඩුවම ලැබුනි.

'අපි ඇන්කෝච් සෝස් ගැන රචනාවක් ලියුවොත් නරක ද ?. අසරණ ඇලිසන්. අසරණ ඇන් මාරි. දෙයියනේ ඔයාලට මොනවද මේ වුනේ ?.'

මිස් විල්කොක්ස් ද ඔවුන්ට විහිළු කළා ය. ඒ සෑම අවස්ථාවකදීම ඇන්ජෙලා ගේ නපුරු මුහුණ සෑම දෙනාටම හොඳින්ම දැකගත හැකිවිය.



sinhalaebooks.com

# මිස් විල්කොක්ස් ට තරහ ගිහිං

කවුරුත් නොසිතූ ආකාරයෙන් මිස් විල්කොක්ස් ගේ හිතට කිසියම් තරහක් ඇති වී තිබෙන බව ගැහැණු ළමයින් ට වැටහෙයි. එයට හේතුවූයේ ද අපූරු කාරණයක් බව ගැහැණු ළමයින් ට සොයා ගත හැකිවිය. මිස් විල්කොක්ස් තමන්ගේ දෙවැනි කවි පොත ලියා අවසන් කළේ පසුගියදා ය. ඉන්පසුව එය ප්‍රකාශකයෙකුට ඉදිරිපත් කළ බවත් ළමුන් දැන ගෙන සිටිය හ. එහෙත් පසුගිය දිනෙක ඇගේ පොත ප්‍රකාශකයා විසින් ආපසු එවා ඇත. පළමු පොත තරම් මේ පොත සාර්ථක නොවන බව දන්වන සටහනක් ද පොත සමඟ අමුණා තිබුනි. මිස් විල්කොක්ස් ගේ හිතට දැඩි කෝපයක් දැනුනේ ඒ නිසා ය.

ඈන් මාරි මෙන්ම මිස් විල්කොක්ස් ද තමන් ලියන දේවල් ගැන දැඩි ලෙස උදම් අණන කෙනෙකි. එමෙන්ම තමා ලියූ දෙවැනි කවි පොත පළමු එකටත් වඩා අතිශයින් ම සාර්ථක පොතක් බව

Scanned with CamScanner

sinhalaebooks.com

ඇ නිතරම කියවූ බවද ගැහැණු ළමයින් ට මතකය. එසේ වුවත් දැන් ඒ සාර්ථක පොත. ප්‍රකාශකයා විසින් ප්‍රතික්ෂේප කොට ඇත. වෙනත් සාමාන්‍ය දුර්වල චරිත ලක්ෂණයක් ඇති කෙනෙක් මෙන් දැන් මිස් විල්කොක්ස් ද අධෛර්යයට පත්ව සිටින්නී ය. එදින මිස් විල්කොක්ස් ඉංග්‍රීසි පන්තියට ආවේ ද ඒ දුක්බර සිතිවිලි ද සමඟිනි.

පංතියට ආ මිස් විල්කොක්ස් මලානික බැල්මක් හෙලුවා ය. තමන්ගේ හිතේ තෙරපෙන කනස්සල්ල සමඟ කිසිම පාඩමක් නිවරැදිව කරන්නට හැකියාවක් නැති බවත් මිස් විල්කොක්ස් ගේ හිතට දැනේ. ඇත්තෙන්ම අද උදෑසන සිදුවූයේ මොන තරම් අප්‍රසන්න සිදුවීමක් ද ?.

මිස් විල්කොක්ස් ගේ පාඩම ඉතාම රසවත් ය. ඒ නිසා මුළු පංතියම ඇගේ පාඩමට සහභාගි වන්නේ උනන්දුවෙනි. එසේ වුවද අල්මා පුඩිං නම් පංතියේ පාඩම් වලට එතරම් උනන්දුවකින් සහභාගි වන්නේ නැත. ඩොරිස් ට ද කිසිම පාඩමක් මතක හිටින්නේ නැත. එහෙත් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරන්නේ නම් ඕනෑම පාඩමක අකුරක් නෑර මතක තබා ගැනීමේ හැකියාව ඇයට තිබේ. ෆෙලිසිටි උනන්දුවන්නේ සංගීතයට සහ කවි ආකාරයෙන් ඉදිරිපත් වෙන පාඩම් ගැන පමණි.

ඇත්තෙන්ම මේ උදෑසන පංතියේ සෑම දෙනාම බොහෝ සේ තෙහෙට්ටුවට පත්ව සිටියහ. උදෑසනම පැය භාගයක් පමණ ක්‍රීඩාගාරයේදී ඉතා මහන්සියෙන් ව්‍යායාම පාඩමක් ඉගෙන ගන්නට ඔවුන් සිදුවිය. ඉන්පසුව තිබුනේ ගණිත පාඩම ඉගෙන ගත යුතු පැය තුන් කාලක ඉතා අසීරු කාල පරිච්ඡේදයකි. මිස් විල්කොක්ස් ගේ ඉංග්‍රීසි පාඩම තිබුනේ ඉන්පසුවයි. ඇත්තෙන්ම ගැහැණු ළමෝ මේ පාඩමට ඉතාම කැමැතිය. මිස් විල්කොක්ස් ගේ ඉංග්‍රීසි කාල පරිච්ඡේදය තුළදී තමන්ගේ හිතට කිසියම් නිදහසක් ලබාගත හැකි යැයි ඔවුන් කල්පනා කළ හ. එහෙත් සිදුවුනේ ඔවුන් නොසිතූ දෙයකි. අද මිස් විල්කොක්ස් පංතියට ඇවිත් සිටින්නේ මහා දුකක්

Scanned with CamScanner

sinhalaebooks.com



ද හිත ඇතුලේ පුරවාගෙනයි.

මිස් විල්කොක්ස් පාඩම ආරම්භ කරන්න සූදානම් වෙද්දීම කාලෝටා විශාල ඈනුමක් ඇරියා ය. ඒ අතර තමාට අසනීප යැයි කියූ ක්ලෝඩින් පංතියෙන් පිටතට යන්නට මිස් විල්කොක්ස් ගෙන් අවසර පැතුවා ය.

'පාඩමේ කොටසක් මග හරින්න හිතුනම ඔයා මොකක් හරි බොරු ලෙඩක් ගන්නවා. ඔයා මේ වගේ ලෙඩ මොන තරම් ගත්තද කියලා නම් මට හිතාගන්න බෑ. ක්ලෝඩින්. කරුණාකරලා දැන්මම ගිහිං මේට්‍රන්ව හම්බ වෙන්න. එයාට කියලා බෙහෙතක් ගත්තම ඔයාගේ ලෙඩ හොඳවෙයි.'

මිස් විල්කොක්ස් නොඉවසිලිමත් ලෙස කියද්දී ක්ලෝඩින් ගේ හිත තිගැස්සුනාක් මෙනි. ඈ ආචාරශීලි ලෙස මෙසේ කීවා ය.

'මට ඒතරම් අසනීපයක් නෑ. හැබැයි ඔයා මේ විදිහට උගන්වන්න හැදුවොත් නම් මට තවත් අසනීප වැඩිවෙයි කියලා හිතෙනවා.'

ක්ලෝඩින් ගේ පිළිතුර නිසා මිස් විල්කොක්ස් ගේ හිතේ තිබූ තිගැස්ම තව තවත් වැඩිවූවා ය. ඒ අතර ෆෙලිසිටි තම ඩෙස්ක් එක මත කිසියම් දෙයක් කුරුටු ගාන අතරම ඇය කිසියම් තාලයක් ද මුමුණන්නට වූවා ය.

'ලා-ඩි-ලා-ඩි-ලා ඕ. ලා-ලා-ලා-ඩි-ලා'

ෆෙලිසිටිගේ මුවෙන් නික්මෙන රිද්මය දෙස ටික වෙලාවක් බලා සිටි මිස් විල්කොක්ස් කෝපයෙන් බෙරිහන් දුන්නා ය.

'ෆෙලිසිටි.... ඔයා මොනවද කරන්නේ ?.'

මිස් විල්කොක්ස් මොනතරම් හයියෙන් කථාකල ද ෆෙලිසිටි ට ඒ හඬ ඇසුන බවක් පෙනෙන්නටවත් නැත. ඈ දෑස වසාගෙන සිහින් හඬින් කිසියම් තාලයක් මුමුණයි. ඒ අතරම මේසයට සිහින්

Scanned with CamScanner

sinhalaebooks.com



ලෙස තට්ටු කරන්නට ද ඈ අමතක නොකළා ය.

'ෆෙලිසිටි '

එවර මිස් විල්කොක්ස් මොන තරම් හයියෙන් කෑගෑවා ද යත්. ඇගේ හිතේ ගසා තිබූ රත්තරන් පාට කොණ්ඩ කටුවක් ද ගැලැවී මේසය මතට වැටුනේ ය එහෙත් මිස් විල්කොක්ස් ඒ බව නුදුටුවා ය.

'ඔයාට මම කියන දේ ඇහුනේ නැද්ද ෆෙලිසිටි ?. ඇත්තටම ඔයා අද පංතියට ඇවිත් ඉන්නේ මොන කල්පනාවකින් ද ?.'

ඒ සමඟම බොබී ෆෙලිසිටිගේ උරහිසට හයියෙන් තට්ටු කළා ය. මෙතෙක් වෙලාවක් දැහැණට සමවැදුනාක් මෙන් සිටි ෆෙලිසිටි නින්දෙන් ඇහැරුනාක් මෙන් වටපිට බලන්නට වූවා ය. මිස් විල්කොක්ස් තමා දෙස කෝපයෙන් බලා සිටින බවක් හෝ තමන් පංතියේ ඉගෙන ගන්නා බවක් හෝ ෆෙලිසිටි ට වැටහුනේ නැත. ඇගේ කල්පනා ලෝකය ඒ තරම්ම දැඩිය. ඒ නිසාදෝ ෆෙලිසිටි නැවත වතාවක් තම දෑස වසාගෙන සිහින් හඬකින් තාලයක් මුමුණන්නට වූවා ය.

' එයා සංගීත පිස්සියක් මිස් විල්කොක්ස්. එයා මොකක් හරි සංගීත හීනයක් දකිනවා කියලා මට හිතෙනවා. එයාව මේ හීනයෙන් ඇහැරවන්න පුළුවන් වෙයි ද කියලා මට නම් විශ්වාස නෑ. ඒයි... ෆෙලිසිටි.'

'මෙයා අපේ පාඩම් කාමරේ ඉන්නෙත් මෙහෙමයි. හැමදාම ගොඩාක් රෑ වෙනකම් මොනවද කල්පනා කරනවා. ඒ වගේ වෙලාවට මම කරන්නේ මම ලියන කවියක් හයියෙන් කියන එකයි එතකොට ෆෙලිසිටි ට ඇහැරෙනවා.'

මෙතෙක් වෙලාවක් නිහඬව සිටි ඈන් මාරි අදහසක් ඉදිරිපත් කළා ය.

Scanned with CamScanner

sinhalaebooks.com



එහෙම වැඩක් කරන එක නම් වරදක් නෑ.'

පැට් සිනාසෙන්නට උත්සාහ කරන ගමන් කීවා ය. ඒ අතර ෆෙලිසිටි නැවත වතාවක් තම රිද්මය සිහින් හඬෙන් මුමුණන්නට වූවා ය.

'ලා-ඩි-ලා-ඩි-ලා'

ෆෙලිසිටිගේ හැසිරීම මිස් විල්කොක්ස්ට වටහා ගන්නට නොහැකිය. සංගීතයට මොනතරම් කැමැති වුවත් මෙවැනි හැසිරීමක් කාගෙන්වත් බලාපොරොත්තු වන්නේ කෙසේ ද ?.

'බොම්-ඩි-බොම්-ඩි-බොම්. ෂා නියමයි. ඔන්න මම අන්තිමේදි ඒක හොයාගත්තා.'

එසේ කියූ ෆෙලිසිටි මේසයට හයියෙන් පහරක් ගැසුවා ය. දැන් නම් ඇය සිහිනයෙන් අවදි වී ඇති සෙයකි. ගැහැණු ළමෝ හයියෙන් සිනාසෙති. ඇත්තෙන්ම ෆෙලිසිටිගේ හැසිරීම මොන තරම් විකාර රූපී ද ?. කිසියම් චකිතයකින් මෙන් වටපිට බලා ෆෙලිසිටි සිහින් ලෙස මෙසේ කීවා ය.

'ඇත්තටම මම ඒක හොයාගත්තා. පහුගිය සති දෙක තිස්සෙම මම ඒ තාලය හොයාගන්න මහන්සි වුනා. අද තමයි මට ඒක හොයාගන්න පුළුවන් වුනේ. මේ බලන්න ඒක මොන තරම් ලස්සනද කියලා. ලා-ඩි-ලා-ඩි-ලා.'

මිස් විල්කොක්ස් ගේ ඉවසීමේ සීමාව ඉක්ම ගියාක් මෙනි. ඈ තම මේසයට හයියෙන් තට්ටු කළේ ඒ නිසාය. සාමාන්‍යයෙන් මිස් විල්කොක්ස් නපුරු ගුරුවරියක නොවේ. එහෙත් දැන් ෆෙලිසිටි සීමාව ඉක්මවා ගොසිනි. මිස් විල්කොක්ස් ඒ වඩාත්ම තරහ යන්නට ඇත්තේ ඒ නිසා ය.

'ෆෙලිසිටි. කාමරයෙන් එළියට යන්න.'

මිස් විල්කොක්ස් අණ කළා ය. ඇගේ තරහ කොපමණ දැයි

Scanned with CamScanner

sinhalaebooks.com



ඒ වචන වලින්ම වටහාගත හැකිය.

'මේ වගේ මෝඩ වැඩ කරන කවුරුවත් පංතියේ තියාගන්න මම කැමැති නෑ. ඇත්තමයි. ෆෙලිසිටි ඔයාට තිබුනේ තුන් වැනි පංතියේම ඉන්නයි. ඔයා පස් වැනි පංතියට ඇවිත් කළේ ලොකු මෝඩ කමක්.'

'පංතියෙන් එළියට යන්න ?.'

ෆෙලිසිටි මිස් විල්කොක්ස් දෙස බලා සිටියේ පුදුමයෙනි.

'ඇයි මම පංතියෙන් එළියට යන්නේ ? මම පාඩමට බාධා කළේ නෑ. මම සංගීත තාලයක් ගැන හිතපු එක වැරැද්දක් වෙන්න පුළුවන්. හැබැයි ඒක මට හදිස්සියෙන් හිතුන දෙයක්. එකෙන් කාටවත් කිසිම කරදරයක් වුනා කියලා මට නම් හිතෙන්නේ නෑ.'

'ඔයා පංතියෙන් එළියට යන්න...'

මිස් විල්කොක්ස් නැවතත් අණ කළා ය. ගැහැණු ළමෝ මේ සිදුවීම දෙස බලා සිටියේ වික්ෂිප්තවයි. සාමාන්‍යයෙන් පස් වැනි වසරේ ඉගෙන ගන්නා ගැහැණු ළමයෙක් ගුරුවරියක විසින් පංතියෙන් එළියට දමන්නේ කලාතුරකිනි. බැරි වෙලාවත් මේ සිදුවීම මිස් තියෝබෝල්ඩ් දැන ගත්හොත් ෆෙලිසිටි හට බරපතල ප්‍රතිවිපාක වලට ද මුහුණ දෙන්නට සිදුවනු ඇත.

ටික වෙලාවක් කල්පනා කළ ෆෙලිසිටි සෙමෙන් සෙමෙන් නැගිට පංති කාමරයෙන් පිටතට යන්නට ගියා ය. ඇය තවමත් සිහිනයෙන් ඇවිදින්නාක් මෙන. පංති කාමරයෙන් පිටතට ගිය ෆෙලිසිටි බිත්තියට හේත්තු වූවා ය. ඉන්පසුව නැවතත් ඇය සංගීත රිද්මය තාලයකට අනුව මුමුණන්නට වූවා ය. පරිසරයම නිහඬ නිසා ඒ හඬ පංති කාමරය තුළ සිටින සැම දෙනාටම පැහැදිලිව ඇසේ. ඒ නිසා මිස් විල්කොක්ස් ඈන් මාරි ට මෙසේ කීවා ය.

'ඈන් මාරි. ෆෙලිසිටි ට ඔයාලගේ පාඩම් කාමරේට යන්න

Scanned with CamScanner

sinhalaebooks.com



කියන්න. ගිහිං එයාට ලියා ගන්න බැරිවුන නාට්‍යයේ හැම දෙබසක්ම ආයේ ලියන්න කියලා එයාට කියන්න. ඇත්තමයි. මේ වගේ මෝඩ හැසිරීමක් තියෙන ළමයෙක් නම් මම කවදාවත්ම දැකලා නෑ.'

' ෆෙලිසිටි හිතන්නේ තමන් හරිම දක්ෂ කෙනෙක් කියලයි. එයා මේ විදිහට හැසිරෙන්නේ ඒ නිසයි.'

ඈන් මාරි එසේ කීවද ඇගේ අදහස් අසන්නට මිස් විල්කොක්ස් කැමැති නැති සෙයකි.

' ඒ වගේ නිදහසට කරුණු අහන්න මම කොහොමටවත් කැමැති නෑ.'

මිස් විල්කොක්ස් කීවා ය. දැන් ඇයට තමන් ගේ ගැඹුරු එමෙන්ම සිත්ගන්නා කටහඬ අමතකව ඇති සෙයකි. මිස් විල්කොක්ස් ගේ මුවගින් නැගෙන්නේ කෝපයෙන් අපවිත්‍ර වූ කටුක හඬකි.

ඇත්තෙන්ම මේ අවාසනාවන්ත උදෑසන පංතියේ සෑම දෙනාටම කිසියම් අකරතැබ්බයන්ට මුහුණ දෙන්නට සිදුවිය. නාට්‍යයේ තමාට අදාල කොටස අමතක වූ නිසා මිස් විල්කොක්ස්ගේ බැනුම් අසන්නට ඩොරිස් ට සිදුවිය. පාඩම වෙලාවෙදි අල්මා රස කැවිල්ලක් කන ආකාරය අතටම හසුවූ නිසා ඇයටද මිස් විල්කොක්ස් ගේ කටුක බැනුමක් අසන්නට සිදුවිය.

' මේ ළමයා හරියට පළමු පංතියේ ළමයෙක් වගේ.'

එසේ කියූ මිස් විල්කොක්ස් මහත. දුක්බර මුහුණක් තිබෙන අල්මා අතේ තිබූ රස කැවිලි පාර්සලය උදුරාගෙන පැත්තකින් තැබුවා ය.

' අනේ අහිංසක අල්මා පුඩිං. කන එක ඇරෙන්න එයාගේ ජීවිතේ වෙන කිසිම වැදගත් දෙයක් නෑ කියලයි මට නම් හිතෙන්නේ.'

Scanned with CamScanner

sinhalaebooks.com



පැට් ඉසබෙල් ගේ කනට කොඳුරා කියද්දි මිස් විල්කොක්ස් ගේ උකුසු නෙත ඈ වෙතට යොමු විය.

'පැට්. ඔයා මොනවද කියන්නේ ?.'

මිස් විල්කොක්ස් අසද්දි පැට් ගේ මුහුණ ලැජ්ජාවෙන් රතු විය. එහෙත් ඈ මිස් විල්කොක්ස් ට පිළිතුරු දෙන්නට ද අමතක කළේ නැත:

' ඇත්තටම මිස් විල්කොක්ස්. මම ඔයාට මොනවත් කීවේ නෑ'

පැට් එසේ කීවා ය. තමා කියූ දේ නැවත කීවොත් සිදුවන්නේ අල්මා ගේ හිත රිදෙන එක පමණි. එවැනි දෙයක් කරන්නට පැට් ට ඇවැසි වූයේ නැත. කෙසේ වුවත් පැට් කියන්නට ඇත්තේ තමාගේ හිත රිදෙන දෙයක් බවට නම් මිස් විල්කොක්ස් ට කිසිම සැකයක් නැත. ඒ නිසා ඈ පැට් ට මෙසේ කීවාය.

' තේරුනාද පැට්. අද හවස ඔයාගේ නාට්‍යයේ ඉතිරි කොටස සම්පූර්ණයෙන්ම ලියලා ඉවර කරන්න ඕනෑ.'

මිස් විල්කොක්ස් ගේ කථාව නිසා පැට් ගේ හිතට කිසියම් දුකක් ඇතිවුනද ඈ මිස් විල්කොක්ස් සමඟ තර්ක කරන්නට ගියේ නැත. ඒ අතර ගැහැණු ළමයින් ගේ අවසනාවන්ත දේවල් නොකඩවාම සිදුවූයේ ය.

නොසිතූ මොහොතක පෝලීන් අතින් පොතක් බිමට වැටුනේ ය. එම හඬට මිස් විල්කොක්ස් බයෙන් පැත්තකට පැන්නා ය. එයින් පසුව මිස් විල්කොක්ස් ගෙන් තියුණු වදන් කිහිපයක් ම පෝලීන් ට ලැබුනේ ය. එමෙන්ම ඉඩ ලැබෙන සෑම අවස්ථාවකදීම බොබී සිහින් ලෙස විහිළුවක් කර පංතිය සිනා ගන්වන්නට ද අමතක කළේ නැත. එහෙත් මිස් විල්කොක්ස් ගේ හිතේ තිබෙන කෝපය හඳුනාගත් නිසාදෝ කිසිවෙකුත් එළිපිට සිනාසෙන්නට හෝ විහිළු කරන්නට කැමැති වූයේ නැත.

Scanned with CamScanner

sinhalaebooks.com


මේ සෑම කරදරයක් මැද්දේ ම මිස් විල්කොක්ස් ගේ හිත නොරිද්දවන්නට පියවර ගත්තේ ඇලිසන් සහ ඈන් මාරි පමණි. ඇත්තෙන්ම ඔවුන් දෙදෙනාම මිස් විල්කොක්ස් ගේ කළු පැහැති දෑසට මෙන්ම කඩා හැලෙන කෙස් කළඹට ආදරය කළ හ. එමෙන්ම මිස් විල්කොක්ස් ගේ අවධානය දිනාගන්නට ඔවුන් දෙදෙනා අතර තිබුනේ නොපරදින තරඟයකි. ඒ අතර මිස් විල්කොක්ස් ගේ හිසේ ගසා තිබූ රත්තරන් පැහැති කොණ්ඩ කටුව ගැලවී තිබෙන බව ඇලිසන් අහම්බෙන් මෙන් දුටුවා ය.

ඇලිසන් මොහොතක් හෝ පමා වූයේ නැත. ඇය ඉක්මනින් ම කොණ්ඩ කටුව අහුලා ගෙන මිස් විල්කොක්ස් ගේ මේසය මත තැබුවා ය. ඒ සමඟම ඇලිසන්ට සුන්දර සිනාවක් තිළිණ කරන්නට ද මිස් විල්කොක්ස් අමතක කළේ නැත.

'ඔයාට ගොඩාක් ස්තුතියි ඇලිසන්. ඔයා හැම වෙලාවෙම හැමෝටම උදව් කරනවා කියලා මම දන්නවා.'

ඈන් මාරි සහ ඇලිසන් නිතරම ආසා කරන ගැඹුරු. එමෙන්ම සිත්ගන්නා හඬෙන් එසේ කියන්නට මිස් විල්කොක්ස් අමතක කළේ නැත. ඒ නිසා ඇලිසන් ගේ සහ ඈන් මාරිගේ හිත්වලට දැනුනේ කිව නොහැකි තරම් සතුටකි.

එහෙත් ඈන් මාරිගේ හිත පුරා ඉරිසියාවක් ගලා ගියේ ය. මිස් විල්කොක්ස් ඇලිසන් ව වර්ණනා කරනවාට නම් ඈ කෙසේවත් කැමැති නැත. ඒ නිසා ඇය දෙගිඩියාවකින් මෙන් කල්පනා කරන්නට වූවා ය. දැන් පංතියේ ළමුන් සෑම දෙනාම නාට්‍යයේ දෙබස් පාඩම් කරති.

නාට්‍යයේ දෙබස් පාඩම් කිරීමෙන් පසුව ද තවත් විනාඩි පහක් පමණ ඉතිරිව ඇත. ඒ නිසාදෝ මිස් විල්කොක්ස් පංතිය දෙසට හැරී මෙසේ ඇසුවා ය.

'ඔයාලා කවුරු හරි කෙනෙක් ළඟ මොනව හරි විශේෂ

Scanned with CamScanner

sinhalaebooks.com



දෙයක් තියෙනව ?. එහෙමනම් අපිට පුළුවන් ඒක කියවන්න.'

අවස්ථාවක් ලැබෙන සෑම වෙලාවකදීම තමන් කැමැති කවියක් හෝ වෙනත් දෙයක් පංතිය ඉදිරියේ කියවන්නට අවස්ථාවක් ලබාදෙන්න මිස් විල්කොක්ස් අමතක නොකරන්නී ය. ඇත්තෙන්ම එය පංතියේ ගැහැණු ළමයින්ගේ හිත්වලට සතුට දැනෙන කාරණයකි. එහෙත් අද නම් ඔවුන්ට කියවන්නට තරම් සුවිශේෂ දෙයක් තිබුනේ නැත.

'අපි මේ සතිය පුරාම ගොඩාක් මහන්සි වුනා. ඒ වගේම ගොඩාක් පාඩම් කළා. මේ විභාගේ හින්දා අපිට කිසිම අමතර දෙයක් කරන්න අවස්ථාවක් ලැබුනේ නෑ.'

කිසිවෙක් ඉදිරිපත් නොවෙන නිසා දෝ හිලරි මිස් විල්කොක්ස් ට කීවා ය. ඒ සමඟම ඈන් මාරි උද්දාමයෙන් යුතුව කෑගැවා ය. ඇගේ මුහුණ පුරා තිබෙන්නේ උතුරා යන සිනාවකි.

'මිස් විල්කොක්ස්. මම ලියපු කවියක් තියෙනවා. මම ඒක පංතියේ අයට ඇහෙන්න කියන්න ද ?. අනේ කරුණාකරලා.'

කෙසේ වුවත් කවියක් රස විඳීමේ හැකියාවක් නම් දැන් මිස් විල්කොක්ස් ට නැත. එයට හේතුව නම් ඇය විසින්ම ලියූ කවිය ප්‍රකාශකයෙකු විසින් ප්‍රතික්ෂේප කිරීමේ දුකයි. එසේ වුවත් විනාඩි පහත් ඉතිරිව ඇති නිසා පංතියේ ළමුන්ට කිසියම් විවිධත්වයක් ලබා දිය යුතුය. ඈන් මාරි ගේ අදහසට කැමැත්ත ලබාදෙන්නට මිස් විල්කොක්ස් තීරණය කලේ ඒ නිසා ය. ඈන් මාරි ගේ හිත සතුටෙන් පිරී ඉතිරී ගියේ නිමේෂයකිනි. මිස් විල්කොක්ස් තමාගේ කවිය අගයනු ඇතැයි ඈන් මාරි ගේ හිතේ දැඩි බලාපොරොත්තුවක් විය. එසේ වුවහොත් පංතියේ ළමයින්ගේ හිත් වලට ඉරිසියාවක් ඇතිවෙනු ඇතැයි ඇගේ හිත හඬ ගා කියයි.

'හොඳයි... ඔයා කැමැති නම් ඒ කවිය කියවන්න ඈන් මාරි.'

Scanned with CamScanner

sinhalaebooks.com



මිස් විල්කොක්ස් කීවා ය. එහෙත් ඇගේ මුහුණේ කිසිම සතුටක සේයාවක් වත් නැත.

ඈන් මාරි හනි හනික තමන්ගේ ඩෙස්කය තුළින් කොල කැබැල්ලක් එළියට ගත්තා ය. එම කොලය පුරාම ඇගේ ලොකු අපැහැදිලි අත් අකුරු පිරී තිබේ. කොල කැබැල්ල අතට ගත් ඈන් මාරි උගුර පාදාගෙන කවිය කියන්නට සූදානම් වූවා ය. මිස් විල්කොක්ස් කවි කියවන ආකාරය අනුකරණය කරන්නට උත්සාහ කරන නිසාදෝ ඈන් මාරි ද ගැඹුරු කටහඬකින් කවිය කියන්නට උත්සාහ කරන්නී ය. ඇගේ කවිය මෙවැන්නකි.

**හුදකලා පිටි මෝල**

කාලයේ මිහිදුම් සළුවෙන් වැසුන
හුදකලා පිටි මෝල
වසර ගණනක් පුරා නිහඬත්වයෙන් වෙලී
බලා සිටියි හුදකලාවෙම

කිසිවෙකුත් ඒ කවිය අසන්නට උනන්දු වූයේ නැත. එහෙත් ඈන්ජෙලා නම් ඈන් මාරිගේ කවිය රස වින්දේ උද්දාමයෙනි. ඈන් මාරි ගේ කවිය අසන්නට බැරි තරම් අරුත් සුන් නීරස එකකි. ළමයින්ගේ නොකැමැත්ත ගණනකටවත් නොගත් ඈන් මාරි තමාගේ මලානික කටහඬෙන් කවිය කියවා ගෙන ගියා ය.

එහෙත් ඉන්පසුව සිදුවූයේ කිසිවෙකුත් නොසිතූ දෙයකි. මිස් විල්කොක්ස් ඈන් මාරි කියවන කවිය දෙස උනන්දුවෙන් බලා සිටියා ය. ඒ සමගම කවිය නතර කරන ලෙස ද මිස් විල්කොක්ස් ඈන් මාරි ට අණ කළා ය. ඈන් මාරි තමන්ගේ කවියක් ලෙස කියවන කවිය තමන්ගේ කවියක් අනුකරණය කරමින් ලියූ එකක් බව මිස් විල්කොක්ස් ට වැටහී ඇත. එම කවිය මිස් විල්කොක්ස් මෙයට පෙර පල කළ කවි පොතේ තිබූ කවියකි. ඈන් මාරි ඒ කවි

sinhalaebooks.com



පොත මිළදී ගෙන එහි තිබූ කවිය කොපි කරන්නට ඇත.

මිස් විල්කොක්ස් ගේ කවිය නම් කොට තිබුනේ 'අත්හැර දමන ලද ගොවිපොළ' යනුවෙනි. එම කවියේ අදහස එහෙම පිටින්ම කොපි කර වෙනත් වචන කිහිපයක් දමා ඈන් මාරි තමාගේ කවිය ලියා ඇති බව මිස් විල්කොක්ස් තේරුම් ගත්තා ය. සත්තකින්ම කවියක් අනුකරණය කිරීම ද ඥාණවන්තව කළ යුතු දෙයකි. එහෙත් ඈන් මාරි ට නම් එවැනි දෙයක් කිරීමේ හැකියාව පවා නැති බව නම් පැහැදිලිය.

' ඔය කවිය නතර කරන්න.'

ගුරුවරිය අණ කරද්දී ඈන් මාරි ඇය දෙස පුදුමයෙන් බලා සිටියා ය. මිස් විල්කොක්ස් කෝපයෙන් රවාගෙන ඈන් මාරි දෙස බලා සිටින්නී ය.

'ඈන් මාරි. ඔයා ලියන හැම දෙයක්ම ඇත්ත දේවල් වෙන්න ඕනෑ. එහෙම නැතිව වෙන කාගෙවත් නිර්මාණ වලින් කොපි කරන එක හරිම නරක වැඩක්. ඈන් මාරි. ඔයා දැන් කියවන කවිය මම ලියපු කවියකින් කොපි කරපු එකක්. ඔයා ඒක නෑ කියලා කියනව ද?.'

මිස් විල්කොක්ස් ගේ ගැඹුරු. එමෙන්ම තියුණු කටහඬ ඇසෙද්දී ඈන් මාරි ගේ හදවත පුරා තිගැස්මක් ගලා ගියේ ය. ඈ ගොත ගසන්නට වූයේ ඒ නිසා ය.

'ඒ වුනත් මිස් විල්කොක්ස්. මම මේ කවිය කොහෙන්වත් කොපි කළේ නෑ. හැබැයි මම මම ඔයාගේ කවි ශෛලීය අනුකරණය කරන්න නම් උත්සාහ කළා. ඒ... ඒ... නිසයි මම. '

කෙසේ වුවද ඈන් මාරි ලියූ කවිය ශේක්ෂ්පියර් ගේ කවියකට වඩා අර්ථවත් වුවද මේ උදෑසන නම් මිස් විල්කොක්ස් ඒ බව පිළිගත්තේ නැත. තමාගේ කවි පොත ප්‍රතික්ශේප වූ නිසා සිතේ

Scanned with CamScanner

sinhalaebooks.com



උපන් දුක සහ වේදනාව නිසා ඇගේ හිත දැන් ව්‍යාකූලය.

' මට නිදහසට කාරණා කියන්න එපා ඈන් මාරි. ඇත්තටම මම ඔයා වුනා නම් ඔය කවිය කීතු කීතු වලට ඉරලා දමනවා. හරි කමක් නෑ ඔන්න සීනුව වදිනවා. දැන් ඉතින් ඔයාලා ටිකක් එළියට යන්න. ඇලිසන් ඔයා ටිකක් නතර වෙලා පොඩි උදව්වක් කරන්න. මට මේ ප්‍රශ්න පත්‍ර ටික පිළිවෙලකට තියාගන්න තියෙනවා.'

මිස් විල්කොක්ස් එසේ කියද්දි ඈන් මාරි දෑසින් කඳුළු පෙරාගෙන පංතියෙන් එළියට දිව ගියා ය. ඇලිසන් මිස් විල්කොක්ස් ට උදව් කරන්නට පංතියෙම නතර වූවා ය. කරදරකාරි ඉංග්‍රීසි පාඩම නිමාවු සතුටත් අරන් අනිත් ගැහැණු ළමෝ ද හනි හනික පංතියෙන් එළියට දිව ගිය හ.

Scanned with CamScanner

sinhalaebooks.com

# කම්මැලි විදිහටයි දවස් ගෙවෙන්නේ

' කොකොම වුනත් ඔයා බොරුවට අසනීප වෙන එක අද නම් හරි ගියේ නෑ නේද ක්ලෝඩින් ?.'

ඔවුන් පංතියෙන් පිටව යද්දි ඇන්ජෙලා සමච්චලයෙන් මෙන් ක්ලෝඩින් ගෙන් ඇසුවා ය.

' ඒක ගණන් ගන්න දෙයක් නෙවෙයි. ෆෙලිසිටි. මිස් විල්කොක්ස් ගේ අවධානය දිනාගත්තා. එහෙම නැතිනම් මට මේට්‍රන් හම්බ වෙන්න යන්න තිබුනා. '

ක්ලෝඩින් සැහැල්ලුවෙන් කීවා ය. ඒ සමඟම ඉසබෙල් පැට් ගේ අතින් අල්ලා ගෙන පාඩම් කාමර පැත්තට දුව යන්නට වූවා ය.

' එන්න. අපි ඉක්මනට ෆෙලිසිටිගේ පාඩම් කාමරේ පැත්තට යමු. එයා නාට්‍යයේ පිටපත ලියලා ඉවර වුනා නම් හරිම පුදුමයක්.

Scanned with CamScanner

sinhalaebooks.com



ඇත්තටම ඒ නාට්‍යය ගොඩාක් දිග එකක්.'

ඔවුන් ෆෙලිසිටි ගේ පාඩම් කාමරයට ඇතුළු වූහ. ඈන් මාරි ද කඳුළු සලමින් එහි සිටියා ය. ඔවුන් කාමරයට ඇතුළු වෙද්දීම ඈන් මාරි ගේ හැඬුම තව තවත් වැඩි විය.

'මෝඩ ළමයා. දුක්වෙන්න එපා.'

පැට් ඈන් මාරි ගේ හිත සනසන්නට උත්සාහ කරන ගමන් කීවා ය.

'ඩෙයඩ්‍රි ඔයාගේ කවිය ගැන කියපු දේවල් ගණන් ගන්න එපා. ඒක තේරුමක් නැති වැඩක් කියලා ඔයාට හිතෙන්නේ නැද්ද ?. මට නම් හිතෙන්නේ එයාට ඔයාගේ කවිය ගැන ඉරිසියා හිතුනා අන්න ඒ නිසයි එහෙම කථාවක් කීවේ.'

' ඔයා කවි ගැන කිසිම දෙයක් දන්නේ නෑ.'

ඉකි ගසන ගමන්ම ඈන් මාරි කීවා ය.

'අනිත් එක තමයි ඔයා මගේ කවි වල එක වචනයක් වත් අහලා නැතුව ඇති. මට නම් ඒක සහතිකයි.'

'සම්පූර්ණ ඇත්ත. මම ඔයාගේ කිසිම කවියක් අහලා නෑ. අනික ඔයා කවි වල ලියන්නේ මොනවද කියලා තේරුම් ගත්ත නම් මට ඔයාගේ කවි රස විඳින්න ලැබෙන්නේ නෑ. තේරුනාද ඈන් මාරි ?. ඒ වුනත් කවි වලින් ඔයාට කියන්න මොනව හරි වැදගත් දෙයක් තියෙනවා කියලා නම් මට හිතෙනවා.'

පැට් එසේ කියද්දී ඈන් මාරි ගේ ඉකි ගැසීම තවත් වැඩි වූයේ ය.

' ඔයාලා ක්වුරුවත් මට අනුකම්පා කරන්නේ නෑ.'

ඇත්තෙන්ම ඈන් මාරි ට දුක් වන්නට කාරණා දෙකක් තිබේ. තමාගේ වටිනා කවිය කොපි කළ එකක් යැයි චෝදනාවක්

Scanned with CamScanner

sinhalaebooks.com

නැගීම ඉන් පළමු වැනි කාරණයයි. දෙවැනි කාරණය තම, තමා වඩාත් කැමැති ගුරුවරිය ඉදිරියේ සමච්චලයට ලක්වෙන්නට සිදුවීමයි. මේ හේතු දෙක නිසාම ඈන් මාරිගේ හිතට දැනෙන දුක දෙනෙත් වලින් දෝර ගලා යයි.

' අනේ ඈන් මාරි ඔයා පුංචි දරුවෙක් වෙන්න එපා.'

නොඉවසිලිමත් ලෙස කියූ පැට් ෆෙලිසිටි දෙසට හැරුනා ය. කාමරයේ පැත්තක වාඩි වී සිටින ෆෙලිසිටි කිසිම කථාවක් නොමැතිව නාට්‍යයේ දෙබස් ලිය යි. ඇගේ ඉතාම කුඩා අත් අකුරු බලන්නට ලස්සන ය.

' සිද්ධ වුන දේ ගැන අපිට කනගාටුයි ෆෙලිසිටි. ඈන්වත් ටිකක් එළියට යන්න එන්න. මේ වගේ උදේ වෙලාවක පිරිසිදු හුලං ටිකක් විඳින එක ගොඩාක් හොඳයි. එතකොට ඔයාගේ මුහුණේ තියෙන මලානික ගතිය ත් නැතිවෙලා යයි.'

තමාගේ කාර්යය මොහොතකට නතර කොට පැට් දෙස බැලූ ෆෙලිසිටි චකිතයෙන් මෙසේ කීවා ය.

'අද පංතියේදි මොනව වුනාද කියලා මම දන්නේ නෑ. ඔයා දන්නවද ? මම සංගීතය ගැන ගොඩාක් උනන්දු වෙනවා. ඒ හින්දා තමයි සංගීත රිද්මය නොහිතපු වෙලාවට මගේ හිතට ආවේ. ඊට පස්සේ වටපිට තිබුන හැම දෙයක්ම මට අමතක වුනා. ඇත්තටම ඇත්තටම හරිම පුදුමයි.'

'ආ... ඔයා දක්ෂ ළමයෙක් නේ. ඒ නිසයි එහෙම දෙයක් වෙන්නේ.'

පැට් කරුණාවෙන් කීවා ය. ඇත්තෙන්ම ඇය ෆෙලිසිටි ට කැමැතිය. කිසිම කෙනෙක් ගැන එක් වරම නොපැහැදෙන පැට් ෆෙලිසිටි ට කැමැති වූයේ කුමක් නිසා දැයි ඇයට වටහා ගත නොහැකි ය.

Scanned with CamScanner

sinhalaebooks.com

'මොකක් හරි දේකට ගොඩාක් දක්ෂ අය සමහර වෙලාවට අමුතු ඒ වගේම හිතා යන දේවල් කරනවා. ඒ අයට ඒ වගේ පුරුදු වලින් ගැළවෙන්න බෑ. සමහර අය ගොඩාක් රෑ නැගිටලා වැඩ කරනවා. තවත් අය දවස් ගණන් කෑමක් බීමක් නැතිව එක එක දේවල් කරනවා. සමහර අය ඇවිදින ගමන් නිදාගන්නවා. හැබැයි එහෙම අය නම් සාමානය අයට වඩා ගොඩාක් වෙනස් මානසික තත්ත්වයක් තියෙන අය කියලා කියන්න පුළුවන්. ඒ හින්දා දුක් වෙන්න එපා. ඔයාට අති දක්ෂ පුද්ගලයෙක් වෙන්න තවත් කල් තියෙනවා. හැබැයි ඔයා ගොඩාක් මහන්සි වෙලා වැඩ කරන කෙනෙක් කියලා නම් මම දන්නවා.'

පැට් ගේ මේ අපූරු කථාව දෙස ඈන් මාරි බලා සිටියේ කඳුළු කඩා හැලෙන දෑසිනි. මෙතෙක් දිනක් ඈ සිතාගෙන සිටියේ තමා ෆෙලිසිටි ට වඩා දක්ෂ ළමයෙක් බවයි. එහෙත් ඒ ගැන කවුරුත් කථා කොට නැත. වෙනකක් තබා කිසිවෙකුත් ඇය අති දක්ෂ අයෙකු යැයි කියා නැත. ඇන්ජෙලාවත් එවැනි කථාවක් කියන්නට උත්සාහ කළේ නැත. එහෙත් සාමාන්‍ය මොන්ටිසෝරි ගීතයක් සහ උසස් කවියක් අතර වෙනස හඳුනාගන්නට හැකියාවක් නැති ඇන්ජෙලා ගෙන් එවැනි දෙයක් බලාපොරොත්තු වන්නේ කෙසේ ද ?. එහෙත් අහිංසක ඈන් මාරි ට එවැනි දෙයක් වැටහෙන්නේ නැත.

'සමහර විට මටත් ඇන්ජෙලා කරන දේවල් වගේ අමුතු දෙයක් කරන්න පුළුවන් වෙයි. එහෙම දෙයක් කළොත් මේ මෝඩ කෙල්ලෝ හිතයි මම ත් අති දක්ෂයෙක් කියලා. ඒ වගේ දෙයක් කරන්න උත්සාහ කළොත් හොඳයි කියලා මට හිතෙනවා. ඇත්තටම ෆෙලිසිටි ගේ හැසිරීම මොනතරම් මෝඩ ද ?.'

එසේ සිතූ ඈන් මාරි කිසියම් සතුටක් ද සමඟ දහවල් විවේකය සඳහා නික්ම ගියා ය. එහෙත් ෆෙලිසිටි පිටතට ගියේ නැත. ඇය තවමත් නාට්‍ය පිටපත ලියා අවසන් කර නැති කම ඊට

Scanned with CamScanner

sinhalaebooks.com


හේතුවයි. එම කාර්යය අවසන් කිරීමෙන් පසුව තමන්ගේ සංගීත දැනුම දියුණු කර ගැනීමේ කටයුතු නිදහස් ව කරගත හැකි බව ඇයට වැටහෙයි. ඇත්තෙන්ම මේ වාරයේදී ෆෙලිසිටි ගේ දවස් ඉතා කාර්ය බහුලය. හතර වසරේ පංතියේදී ලබාගන්නා අධ්‍යාපන කටයුතු වලට වඩා පස්වැනි වසරේදී ගොඩාක් මහන්සියෙන් අධ්‍යාපනය ලබන්නට ද ඇයට සිදුවෙයි. එයටත් අමතරව තමා මුහුණ දෙන අසීරු විභාගයට මුහුණ දීම සඳහා ද දිවා රෑ නොතකා මහන්සි වන්නට ද ෆෙලිසිටි ට සිදුව තිබේ.

පාසලේ ක්‍රීඩා කටයුතු දියුණු කිරීම සඳහා මිරාබෙල් ද දිවා රෑ නොබලා වෙහෙස මහන්සි වූවා ය. ඒ අතරිනුත් තුන් වැනි සහ හතරවැනි වසර වල ළමුන් ගේ ලක්‍රොස් ක්‍රීඩා හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ඇය දැරූ වෙහෙස අපමණ ය. එවැනි අසීරු කටයුත්තක් කළොත් මිරාබෙල් ට ලැබෙන කීර්තිය මොන තරම් ද ?

එසේ වුවද දිනපතා උපරිම අන්දමෙන් සිදුවෙන මෙම පුහුණු කටයුතු ගැන ග්ලැඩිස් ගේ හිතේ එතරම් මනාපයක් තිබුනේ නැත ඒ නිසා ඇය එක් දිනක් මිරාබෙල් ට මෙසේ කීවා ය.

'ඔයා ගොඩාක් අමාරු දේවල් මහ ගොඩාක් එක පාරටම කරන්න හදනවා. ඒ වගේ දේකින් හොඳ ප්‍රතිඵල ලැබෙන්නේ නෑ. හැබැයි ඔයා ගොඩාක් හෙමෙන් ඒ දේවල් කළොත් ලැබෙන ප්‍රතිඵලය හරිම සාර්ථක වෙයි. මිරාබෙල්. බලන්නකෝ. පළමු වසර ළමයින්ට ක්‍රීඩා පුහුණු වෙන්න කියලා ඔයා දීලා තියෙන කාල සටහන. ඒ ළමයි මේ විදිහට මහන්සි වුනොත් ඒ අයට හැම දෙයක්ම එපා වෙයි.'

'හැබැයි දැන් ඒ අය ගොඩාක් දක්ෂයි.'

දෙවැනි පංතියේ ළමයින් ගේ ක්‍රීඩා පුහුණු කාල සටහන දෙස විපරම් කරන ගමන් මිරාබෙල් කීවා ය.

'ඇත්තටම මම ක්‍රීඩා පුහුණු කරන්න ගත්තට පස්සේ ඒ අය

Scanned with CamScanner

sinhalaebooks.com



ගොඩාක් ආසාවෙන් සෙල්ලම් කරනවා කියලා මට හිතෙනවා. ජේන් ටිල් තමයි හොඳම උදාහරණය. මම පුහුණු කරන්න පටන්ගත්ත කාලෙට වඩා එයා දැන් දස ගුණයක් හොඳයි. ඇත්තටම ජේන් තමයි පළමු පංතියේ ඉන්න ළමයින්ගෙන් ගොඩාක් දක්ෂ විදිහට බෝල අල්ලන්නේ.'

එහෙත් ග්ලැඩිස් ට නම් ඒ කථාව එතරම් ප්‍රිය මනාප නැත. ඈ මෙසේ කීවේ ඒ නිසා ය.

' ඒ කථාව හරි. ජේන් වගේ ළමයින්ට නම් ඕනෑ දෙයක් කරන්න ඔයාට පුළුවන්. ඒ වගේ අය බලාගෙන ඉන්නේ තමන් කැමැති අය අතර පුළුවන් තරම් කැපී පෙනෙන්න. හැබැයි අනිත් අයට නම් එහෙම දෙයක් කරන්න ලැබෙන්නේ නෑ. ඔයා දන්නවද මිරාබෙල් ?. ඔයාගේ පුහුණුව ගැන හතර පංතියේ ළමයි ටිකක් වත් කැමැති නෑ. ඒ නිසා ක්ලෝඩින්. කාලෝටා ඇන්ජෙලා වගේ ළමයි එක්ක ගණුදෙනු කරන කොට ඔයාට ගොඩාක් කල්පනා කරන්න වෙයි කියලා මට හිතෙනවා.'

'මගේ මොනව හරි දුර්වල කමක් දැකපු නැති දවසක් නැද්ද ග්ලැඩිස් ?. ඇත්තටම ඔයා කරන දේවලුයි. කථා කරන දේවලුයි දිහා බැලුවම හරිම වෙනස්. ඉස්සර ඔයා කීවේ මාව අනුගමනය කරනවා කියලයි. අනික මම ගොඩාක් දක්ෂ කෙනෙක් කියලත් ඔයා ඒ දවස්වල කීවා. ඒ වුනාට දැන් කියන්නේ මෙන තරම් වෙනස් කථාවක් ද?'

මිරාබෙල් අමනාපයෙන් මෙන් කියද්දි ග්ලැඩිස් ගේ සිහින් එමෙන්ම නිවුණු කටහඬ ඇසුනේ ය.

' ඔයා කියන දේ මම දන්නවා. ඔයාට තියෙන දක්ෂතාවලින් භාගයක් වත් මට නෑ කියලත් මම දන්නවා. ඒ වුනත් මිරාබෙල් මම ඔයාගේ උප ක්‍රීඩා නායිකාව. ඒ නිසා ඔයා ගන්න තීරණ ගැන මමත් දැනගන්න ඕනෑ. මගේ අත්දැකීම් ඔයා එක්ක බෙදාගන්න එකත්

Scanned with CamScanner

sinhalaebooks.com

මගේ වගකීමක් කියලා මම හිතනවා. ඒ වගේ දෙයක් නොකර පැත්තකට වෙලා බලාගෙන ඉන්න මට බෑ. ඒ නිසයි මම මේ වගේ දේවල් ඔයාට කියන්නේ. මම කියන සමහර දේවල් වලට ඔයා කැමැති නෑ කියලත් මම දන්නවා. මොනව වුනත් කියන්න තියෙන දේවල් නොකියා හිටියොත් මට නින්ද යන්නෙත් නැතිවෙයි.'

ඇත්තෙන්ම ග්ලැඩිස් ගැන මිරාබෙල් ගේ හිතට නැගුනේ පුදුමයකි. සෑම අවස්ථාවකදීම තමා නායකත්වය ගනිද්දි ග්ලැඩිස් කිසිදු කථාවක් නොමැතිව ඇය අනුගමනය කරන්නීය. එහෙත් දැන් සිදුවන්නේ එවැනි දෙයක් නොවේ. ග්ලැඩිස් තමාගේ යම් යම් කාර්යයන් ගැන විවේචනය කරයි. ඒවාට අභියෝග කරයි. මෙවැනි දේවල් ගැන කිසිම සතුටක් මිරාබෙල් ගේ හිතේ නැත. පාසලේ ක්‍රීඩා නායිකාව නිසා උපන් ආත්මාභිමානය මිරාබෙල් ගේ හිත පුරා ගලා යයි.

' ඔයා දන්නව ද?. සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලේ මේ රටේ ම තියෙන හොඳම ක්‍රීඩා ඉස්කෝලේ බවට පත් කරන්නයි මම උත්සාහ කරන්නේ. ඒ වගේ බලාපොරොත්තුවක් තියෙන කොට කිසිම නිදහසට කාරණයක් අහන්න මම කැමැති නෑ. අනික මම කිසිම කෙනෙක් වැඩිපුර මහන්සි කරලා පුහුණු කරන්නේ නෑ. හැබැයි මම මේ හැමදේම කරන්නේ ඉස්කෝලේ වෙනුවෙන් කියලා ඒ ළමයි දන්නවා. අන්න එක අමතක කරන්න එපා. හොඳ ද ග්ලැඩිස්.'

' මේ ඉස්කෝලේ කවුරුවත් ඔයා තරම් ලොකු නෑ. ඒ වගේම ශක්තිමත් නෑ.'

ග්ලැඩිස් තමා ඉදිරියේ සිටින දැවැන්ත සිරුරක් ඇති ගැහැණු ළමයා දෙස බලා කීවා ය.

'ඔයා ක්‍රීඩා ගුරුවරියක් වෙන්න පුහුණු වෙනවා කියලා ඇහුනත් මම නම් පුදුම වෙන්නේ නෑ. ඔයා ඒකට හොඳටම ගැලපෙනවා. අනිත් එක දවස තිස්සෙම සෙල්ලම් කරලා හැන්දෑ

Scanned with CamScanner

sinhalaebooks.com

වරුවේ හැතැප්ම දහයක් ඇවිද්දත් ඔයාට කිසිම මහන්සියක් දැනෙන්නේ නෑ කියලා මට සහතිකයි. ඒත් ජේන් ටිල් වගේ පොඩි ළමයින් ට නම් ඒ වගේ දෙයක් කරන්න තරම් ශක්තියක් නෑ. අන්න ඒ වගේ දේවල් ඔයා තේරුම් ගන්නේ නැති එක ලොකු වරදක් මිරාබෙල්.'

ඇත්තෙන්ම මිරාබෙල්. කියන සෑම දෙයක්ම නොපිරිහෙලා ඉටුකරන්නට ජේන් ටිල් අමතක කරන්නේ නැත. ඇය ඉතා කීකරු සහ මහන්සියෙන් වැඩ කරන ගැහැණු ළමයෙක් බවට පත්ව සිටින්නී ය. ලක්‍රොස් ක්‍රීඩාවේදි ජේන් ටිල් ඉතාම දක්ෂ බව එක් දිනක් මිරාබෙල් කීවා ය. එය ජේන් ගේ හිත සතුටෙන් පුරවන කාරණයක් විය.

දැන් ජේන් ටිල් ඇන්ජෙලා ගැන වැඩිපුර දුක්වන්නේ නැත. එහෙත් ඇන්ජෙලා සමඟ නැවතත් හිතවත් කමක් ඇතිකරගන්නට ද ජේන් සමහර අවස්ථාවලදි උත්සාහ කරන්නී ය. පාසලේ වැඩ කටයුතු අතරේදි පවා ජේන් ගේ හිතේ තිබෙන්නේ ඇන්ජෙලා පිළිබඳ මතකයයි. ඇන්ජෙලා සමඟ නැවතත් හිතවත් කමක් ඇති කර ගැනීම සඳහා ද ජේන් නිතරම කල්පනා කරන්නී ය. ඇන්ටනට් කළ මෝඩ වැඩෙන් පසුව ඇන්ජෙලා ගේ කටයුතු දැන් කරන්නේ වයලට් විසිනි. වයලට් ව පරාජය කොට නැවතත් ඇන්ජෙලාගේ හිත ගන්නට හැකිනම් ඇගේ වටිනා තෑගි තමාට ලබාගත හැකි බව ද ජේන් නිතරම කල්පනා කරයි.

' ජේන්. ඔයා හීනයක් දකිනවා කියලයි මට නම් හිතෙන්නේ. ඔයා ගණන් හදන්නෙත් නෑ. පාඩම් කරන්නෙත් නෑ. මුහුණේ තියෙන්නේ මහා ලොකු පටලැවිල්ලක් වගේ.'

දිනක් පාඩම අවසානයේදි මිස් රොබට් එසේ කියද්දි ජේන් ගේ සිහින මාළිගාව කඩා ගෙන වැටුනේ ය. ඇය හිස පහතට නමාගෙන කැළඹුණු සිතින් යුතුව ගුරුවරියට මෙසේ කීවා ය.

Scanned with CamScanner

sinhalaebooks.com



'ම... මම පොඩි කාරණයක් ගැන කල්පනා කළා.'

අවසානාවට මෙන් ඊළඟ දිනයේදී වයලට් ට ඉතා බරපතල උන්දමේ සෙම්ප්‍රතිශ්‍යාවක් වැළදුනේ ය. ඒ නිසා ඇයට අසනීප කාමරයට රැගෙන යන්නට මේට්‍රන්ට සිදුවිය. කිවිසුම් අරින. තෝරතෝංචියක් නොමැතිව කසින වයලට් ගැන මේට්‍රන් වරිය බොහෝ සේ දුක්වූවා ය. අසනීප කාමරයට යන අතර තුරදී මේට්‍රන් වරිය වයලට් ට මෙසේ කීවා ය.

' වයලට් මට කියන්න මොකක් හරි ලස්සන කථාවක් ලෑස්ති කරගන්නකෝ. ඒ වගේ මම ළඟ අපූරු පීග්සෝ ප්‍රෙහෙලිකාවක් තියෙනවා. ඒකත් ඔයාට දෙන්න පුළුවන් වෙයි කියලා මට හිතෙනවා.'

වයලට් අසනීප කාමරයට යද්දී එම උදෑසන ම ජේන් වයලට් ගේ කබඩය තිබෙන තැනට ගියා ය. තමාට අවශ්‍ය කිසියම් දෙයක් එම ස්ථානයේ තිබෙන බව ජේන් ට දැකගත හැකිවූයේ ඒ අවස්ථාවේදී ය. සත්තකින්ම ජේන් දැක්කේ කුමක් ද ?. එතැන තිබුනේ ඇන්ජෙලා ගේ මේස් යුවලක් සහ බැනියම් දෙකකි. ඒ සෑම දෙයක්ම මසන්නට තිබෙන ඒවා ය. ජේන් මේ දේවල් දෙස බලා සිටියේ පුදුමයෙනි. වයලට් හට දවස් තුන හතරක් ම අසනීප කාමරයේ සිටින්නට සිදුවෙයි. ඒ නිසා මේ ඇඳුම් සෑම එකක්ම අපූරුවට මසා ඇන්ජෙලා ට ගිහිං දෙන්නට හැකිනම් මොන තරම් අපූරුදැයි ජේන් ට සිතිනි. එවැනි දෙයක් කළහොත් මෙතෙක් දිනක් වයලට් ට ලැබුන ඇන්ජෙලාගේ සැළකිල්ල නැවතත් තමන්ට උදුරාගත හැකි යැයි ජේන් කල්පනා කළා ය. එවැනි දෙයක් කළහොත් තමාට නැවතත් ඇන්ජෙලා ගේ අලංකාර පාඩම් කාමරයට යන්නට හැකිය. එය පිරිසිදු කරන්නට හැකිය. කාමරයේ එල්ලා තිබෙන අලංකාර පින්තූර දෙස ඇති තරම් වෙලාවක් බලා සිටින්නට ද අවස්ථාවක් ලැබෙනු ඇත. මල් වාස් වලට ජලය පුරවන්නට ද පුළුවන. මේ සෑම දෙයකටම වඩා ඇන්ජෙලා ගේ ලස්සන සිනාව හිතේ හැටියට

Scanned with CamScanner

sinhalaebooks.com

විඳ දරාගන්නට ද හැකියාව ලැබේ. මෙවැනි සිතිවිලි සමුදායක්ම හිතේ නැගෙද්දි ජේන් වයලට් ගේ කබඩයේ තිබූ ඇන්ජෙලා ගේ රෙදි සියල්ලම රැගෙන ආවා ය.

ඉන්පසුව තමාගේ විවේක කාලය සම්පූර්ණයෙන් ම ගෙවා දමා ඇන්ජෙලා ගේ ඇඳුම් කදිමට මසන්නට ජේන් අමතක කළේ නැත. සමහර අවස්ථාවලදි නාට්‍ය පාඩම ඉගෙන ගන්නට තිබෙන කාල වෙලාව පවා කැපකර ඇන්ජෙලාගේ මේස් සහ බැනියම් මසන්නට ඇය අතපසු නොකළා ය. එයින් නොනැවතුනු ජේන් රාත්‍රියේ දි පවා තමන්ගේ වැඩය කරන්නට උපායක් කල්පනා කළා ය.

'රෑට ලයිට් නිවන හින්දා මගේ වැඩේ කරන්න අමාරු යි. කමක් නෑ. මම ඒකට වැඩක් කරන්නම්. රෑට මම ටෝර්ච් එක අරන් නිදාගන්න යනවා. හැමෝටම නින්ද ගියාට පස්සේ මම ටෝර්ච් එක පත්තු කරගෙන ඇන්ජෙලා ගේ ඇඳුම් මහනවා.'

ජේන් එසේ කල්පනා කළා ය. රාත්‍රියේ වෙහෙස වී මෙවැනි දෙයක් කළොත් පසුදිනට දැඩි මහන්සියක් දැනේ. එහෙත් කළ හැකි දෙයක් නැත. ඇන්ජෙලා ගේ හිත ගන්නට හැකි ඕනෑම දෙයක් කරන්නට ජේන් සූදානම් ය.

පසුදින ඇන්ජෙලා ගෙන් වයලට් ට පණිවුඩයක් ලැබුනි. එහෙත් ඇන්ජෙලා හමුවන්නට ගියේ වයලට් නොව ජේන් ය. ඇන්ජෙලා ගේ කාමරය අසලට ළං වෙද්දි තමාගේ හදවත ගැහෙන ආකාරය ද. හිත චංචල වෙන ආකාරය ද ජේන් ට දැනේ.

එහෙත් කාමරයේ සිටියේ ඇලිසන් පමණකි. ජේන් දුටු සැනින් ම ඇලිසන් ගේ හිත පුරා කිසියම් පුදුමයක් පැතිර ගියා සේය. ඈ ජේන් ගෙන් මෙන් ඇසුවා ය.

' හලෝ ළමයා. කෝ වයලට් ?.'

'වයලට් ට සනීප නෑ. එයා අසනීප කාමරේ. ඒ හින්දා මම

Scanned with CamScanner

sinhalaebooks.com



ඇන්ජෙලා ගේ ඇඳුම් හැම එකක්ම මහලා ඉවර කළා. ඇන්ජෙලා කොහෙද ඉන්නේ ඇලිසන් ?.'

'එයා මිරාබෙල් එක්ක ලොකු කථාවක්.'

ඇලිසන් කීවා ය. සැබැවින්ම එදින පස් වැනි වරයේ ළමුන් සමග ඉතාම වැදගත් කථාවක නිතර වන්නට මිරාබෙල් තීරණය කළා ය සෙන්ට් ක්ලෙයාර් පාසලේ ක්‍රීඩා දක්ෂතාවයන් ඉහළ නංවන්නේ කෙසේද යන ආකාරය ගැන ළමුන් ගේ අදහස් දැනගැනීම සඳහා එම රැස්වීම සංවිධානය කර තිබුනේ ය මේ කාර්‍යයයේදී ඇන්ජෙලා ගෙන් ලැබුනේ අවම දායකත්වයකි ශරීරය මහන්සි වෙන නිසා සහ අපිරිසිදු වෙන නිසා ක්‍රීඩා පිටියට බසින්නට ඇන්ජෙලා එතරම් කැමැත්තක් දක්වන්නේ නැත.

' ආ.......'

ජේන් ගේ මුහුණ මැලවූනේ ය. දැන් සිදුව තිබෙන්නේ නොසිතූ දෙයකි. එහෙත් වැඩි වෙලාවක් යන්නට පෙර ඇන්ජෙලා කාමරය දෙසට එන ආකාරය ජේන් ට දැක ගත හැකිවිය. ඇගේ මැළවුන මුහුණ නැවතත් දීප්තිමත් විය.

'මේ මෝඩ මිරාබෙල් එක්ක නම් කිසිම දෙයක් කරන්න බෑ'.

ඇන්ජෙලා කෝපයෙන් ඇලිසන් ට කීවා ය. ජේන් කාමරය තුළ සිටින බව ඈ මුලින්ම නුදුටුවා ය.

' එයා හදන්නේ අපිවත් එයා වගේම අපිරිසිදු ළමයි කරන්න. හැමතැනම ඇවිදින්න. එයා වගේ කෑගහන්න. දුවන්න. සෙල්ලම් කරන්න කියලා අපිටත් බල කරනවා. අනේ ඇත්තටම එයාට කරන්න වෙන වැඩ නැද්ද දන්නේ නෑ.'

'ජේන් මෙතැන ඉන්නවා.'

ඇලිසන් අවවාදාත්මක හඬකින් කියද්දී ඇන්ජෙලා ජේන්

Scanned with CamScanner

sinhalaebooks.com



දෙසට හැරුනා ය. ඇගේ මුහුණේ තවමත් කෝපය දෝර ගලා යයි. ඒ නිසා තමන් මෙතැනට ආවේ කුමන හේතුවක් නිසා දැයි ඇන්ජෙලා ට පැහැදිලි කරන්නට පවා ජේන් ගේ හිතට කිසියම් දෙගිඩියාවක් දැනේ.

' වයලට් ට සනීප නෑ ඇන්ජෙලා. ඒ හින්දා ඔයාගේ ඇඳුම් ටික මම මැහුවා. මම එහෙම දෙයක් කළාට ඔයා අමනාප වෙන්නේ නෑ කියලා මම දන්නවා අනික කැමැති නම් ඔයාගේ වැඩ ආයෙමත් කරලා දෙන්න මම කැමැතියි ඇන්ජෙලා.'

ජේන් ගොත ගැසුවා ය. ඇන්ජෙලා ඈ දෙස බලා සිටියේ සිනා පොදක් හෝ නොමැති මුහුණෙනි. ඉන්පසු ඈ සමච්චල් සහගත ලෙසින් මෙසේ කීවා ය.

' ඒ වුනාට ඔයා ගොඩාක් කැමැති මිරාබෙල් ට මොකද කියන්නේ ?. ඔයා අපූරු ක්‍රීඩිකාවක් කරන්න හදපු එයාට ගොඩාක් දුක හිතෙයි නේද ?'

' මම ඔයාලා දෙන්නටම සේවය කරන්නම්. ඒ හැම දේකටම ඕනෑ කරන කාලය මම කොහොම හරි හොයා ගන්නම්. කැමැති නම් මම ඔයාගේ වැඩත් කරලා දෙන්නම් ඇන්ජෙලා.'

ජේන් බයාදු ලෙස කියද්දි ඇන්ජෙලා කල්පනා කරන්නට වූවා ය. තමා නැවතත් ජේන් ගෙන් වැඩ කරවා ගනිද්දි මිරාබෙල්ගේ හිතට කෝපයක් නැගෙන බව ඇයට වැටහෙයි. සත්තකින්ම මිරාබෙල් ට රිදවන්නට මෙය කදිම අවස්ථාවක් නොවන්නේ ද ?. එසේ සිතූ ඇය ජේන් දෙසට කදිම සිනාවක් විසිරුවා මෙසේ කීවා ය.

' හොඳයි ජේන්. මම ඔයාට ආයෙමත් අවස්ථාවක් දෙන්නම්. කොහොමටත් අර මෝඩ වයලට් ගේ වැඩ හින්දා මට එපා වෙලයි තිබුනේ. එයා එළදෙනකගේ වගේ ලොකු ඇස්වලින් බලන කොට මට හරියට බය හිතෙනවා. ඒ හින්දා ඔයා ඇවිත් ආයෙමත් මගේ

Scanned with CamScanner

sinhalaebooks.com



වැඩ ටික කරලා දෙන්න.'

ඇන්ජෙලා එසේ කියද්දි ජේන් සතුට උතුරන සිතින් යුතුව කාමරයෙන් පිටව ගියා ය. දැන් සියල්ලම නැවතත් පෙරසේම හොඳින් සිදුවෙනු ඇත. ඇන්ජෙලා ගේ සුන්දර සිනාව හිත් සේ විඳ දරා ගැනීමේ අවස්ථාව නැවතත් ජේන් ට ලැබේ. මේ ගැන සිහිපත් වෙද්දි ජේන් ට දැනෙන සතුට නිමක් නැත.

Scanned with CamScanner

sinhalaebooks.com



# කවුද මේ වගේ මෝඩ වැඩ කරන්නේ ?

දැන් මිරාබෙල් කරන මෝඩ වැඩ වල නිමක් නැත. සත්තකින්ම මේ දිනවල පස් වැනි වාරයේ ළමුන් ඔවුන්ගේ විභාගය සඳහා ඉතාම මහන්සියෙන් පාඩම් කරති. ඔවුන් ගේ අධ්‍යාපන කටයුතු වලට නිතරම බාධා කරන මිරාබෙල් ක්‍රීඩා පුහුණුව සඳහා ඔවුන්ට රැගෙන යන්නට නිතරම උත්සාහ කරන්නී ය එයට පස් වැනි පංතියේ ගැහැණු ළමයින් ගේ එතරම් මනාපයක් නැත. කුඩා පංතිවල ගැහැණු ළමයින්ට ද අසීමාන්තිකව ක්‍රීඩා පුහුණුව ලබාදෙන්නටද මිරාබෙල් අමතක කළේ නැත.

' ඒක නම් ඇත්තටම හරිම මෝඩ අදහසක්.'

පැට් නොඉවසිලිමත් ලෙස කීවා ය.

'පහළ පංතිවල ඉන්න ළමයි ක්‍රීඩා පුහුණු වෙන්නේ ඒ අයට පුරුදු ක්‍රමවලට. අපි ලොකු ළමයි. අපි බලපෑම් කරනවට ඒ අය කැමැති නෑ.'

Scanned with CamScanner

sinhalaebooks.com



'අනිත් කාරණේ තමයි විභාගය හින්දා අපිත් ගොඩාක් මහන්සි වෙන වෙලාවක් මේක.'

හිලරි ද පැට් ගේ අදහස අනුමත කළා ය.

'මිරාබෙල්. විභාගේ ළඟම එනවා. ඒ වුනාට ඔයා කිසිම මහන්සියක් වෙන්නේ නෑ. ඒ ඇයි කියල නම් මට හිතාගන්න බෑ. අනික මේ දවස්වල ඔයාගේ හැම හැන්දෑ වරුවක්ම ගෙවෙන්නේ තරඟ කාල සටහන් හදන්න. සීමාවක් නැතිව එහෙම දෙයක් කළොත් විභාගෙට මොනව වෙයිද?'

එය මොන තරම් සැබෑවක් ද?. මිරාබෙල් විභාගය සඳහා කිසිදු අමතර මහන්සියක් දරන්නේ නැත. විභාගයට සාර්ථකව මුහුණ දෙන්නට හැකියාව ඇතැයි ඇය විශ්වාස කළ ද තමාට මොන තරම් හොඳ ලකුණු ප්‍රමාණයක් ගත හැකි දැයි විශ්වාසයක් ඇයට නැත. මේ දිනවල ඇයගේ සම්පූර්ණම කාලයම වියදම් වන්නේ පාසලේ ක්‍රීඩා ක්ෂේත්‍රය හැකි තරම් ඉහළ තලයකට රැගෙන ඒම සඳහා ය. සමහර විට අනාගතයේදි ඇය ක්‍රීඩා ආචාර්ය වරියක වන්නට සිතා සිටිනවා විය හැකි ය. සත්තකින් ම මිරාබෙල් ගේ හිත දැඩි ය. ඒ නිසා එල්ල වෙන සෑම බලපෑමක් ම අපහසුවකින් තොරව දරා ගැනීමේ හැකියාව ද ඇය සතුය.

'මිරාබෙල් වැඩ කරන්නේ හරියට යුද්ධ ටැංකියක් වගේ. එයාව නතර කරන්න කාටවත් බෑ. එයා ගේ තර්ක ඉස්සරහ අපි ගොළු වෙනවා. ඒ හින්දා තමන්ට ඕනෑ දේ එයා කිසිම අපහසුවක් නැතිව කරගන්නවා.'

බොබී කීවා ය. එවිට ඩොරිස් ද කථා කරන්නට වූවා ය.

'ඇත්ත මිරාබෙල් එක්ක තර්ක කරන්න කාටවත් බෑ. අනික එයා අපි කියන කිසිම දෙයක් අහන්නේ නෑ. මේ දවස්වල එයා ග්ලැඩිස් කියන දෙයක් වත් අහන්නේ නෑ කියලයි මට නම් හිතෙන්නේ. ග්ලැඩිස් කියන්නෙත් ඒ තරම් හිත හයිය ළමයෙක් නෙවෙයි. හැබැයි

Scanned with CamScanner

sinhalaebooks.com



මිරාබෙල් ට වඩා මොකක් හරි දෙයක් හොඳට කල්පනා කරලා තේරුම් ගන්න පුළුවන් හැකියාවක් ග්ලැඩිස් ට තියෙනවා.'

' ඒක ඇත්ත. ග්ලැඩිස් හොඳ කල්පනාවක් තියෙන ළමයෙක්.

පැට් ද කීවා ය.

'මිරාබෙල් මේ ඉස්කෝලෙට ආපු හැටි ඔයාලට මතක ද? මුල් දවස්වල එයා හරිම නපුරුයි. ඒ වගේම මුරණ්ඩුයි. කවුරුවත් කියන කිසිම දෙයක් අහන්නේ නෑ. හැබැයි ඒ විදිහට වාරයෙන් භාගයක් වත් ඉන්න ලැබුනේ නෑ. එයාට මොකද වුනේ කියලා ඔයාලට මතක ද?'

' මට මතකයි.'

ඉසබෙල් කීවා ය. ඇගේ හිතට පසුගිය කාලයේ සිදුවූ දේවල් හොඳින්ම මතක ය.

' ඒ දවස් වල එයා හරිම මුරණ්ඩුයි. කවුරුවත් කියන කිසිම දෙයක් අහන්නේ නෑ. හැබැයි මිරාබෙල් ගේ තියෙන ගතිගුණ වෙනස් කළේ කවුද දන්නවද ? එයා තමයි ග්ලැඩිස්. එයා ටිකෙන් ටික මිරාබෙල් ගේ දරදඬු ගතිගුණ වෙනස් කෙරුවා. ඇත්තටම එයා සෙන්ට් ක්ලේයාර් ඉස්කෝලෙට ආපු හරිම අපූරු චරිතයක්.'

' ඒ වුනාට දැන් මිරාබෙල් හරිම වෙනස් ළමයෙක් වෙලා. එයා දැන් සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලේ ක්‍රීඩා නායිකාවනේ. ඒ හින්දා ගොඩාක් ආඩම්බර වෙලා.'

බොබී නැවතත් කථා කරන්නට වූවා ය.

'දැන් ග්ලැඩිස්ට වුනත් කරන්න දෙයක් නෑ. පහුගිය දවසක ඒ දෙන්නා වාද කරනවා මට ඇහුනා. ග්ලැඩිස් කියපු දේවල් හින්දා මිරාබෙල් ට ගොඩාක් තරහා ගියා. ඊට පස්සේ එයා හයියෙන් දොර වහලා කාමරයෙන් යන්න ගියා.'

Scanned with CamScanner

sinhalaebooks.com




'මම නම් මේ දැන් ඉන්න මිරාබෙල් ට ටිකක් වත් කැමැති නෑ.'

ක්ලෝඩින් කීවා ය. තමාව නිතරම ක්‍රීඩා පිටියට රැගෙන යන්නට උත්සාහ කරන නිසා ක්ලෝඩින් මිරාබෙල් ට කැමැති නැත.

'එයා හැම වෙලාවෙම මම පස්සෙන් එනවා. මාව පිට්ටනියට අරන් යන්න හිතාගෙන. අන්න ඒ හින්දා මම එයාට ටිකක්වත් කැමැති නෑ.'

ගැහැණු ළමෝ සිනා සෙති. තමන් අකමැති කවරෙකු හෝ ප්‍රතික්ශේප කර දමන්නට ක්ලෝඩින්ට තිබෙන්නේ පුදුමාකාර හැකියාවකි. තමන් අකමැති අය අතලොස්සක් අතරිනුත් ක්ලෝඩින් ට මිරාබෙල් නම් පෙන්නන්නම බැරිය. එයට හේතුව නම් ඇය නිතරම ක්ලෝඩින් ව ක්‍රීඩා පිටියට රැගෙන යන්නට උත්සාහ කිරීමයි. ඒ අතර ක්ලෝඩින් තවත් අපූරු කථාවක් කියන්නට උත්සාහ කළා ය. ගැහැණු ළමෝ ඇගේ කථාව අසා සිටියේ පුදුමයෙනි.

'ඔයාලා දන්නවද ? ඊයේ හරිම අපූරු දෙයක් වුනානේ. ඊයේ මම මිස් තියෝබෝල්ඩ් හම්බවෙන්න ගියා. ඔන්න මිරාබෙලුත් මට පිටිපස්සෙන් එනවා. මම එයාට අපූරු වැඩක් කළා. ඔයාලා දන්නවද? මම කකුලත් එක්ක කථා කරන්න පටන් ගත්තා.'

තමන්ගේ දෙබැම ඔසවා. දැස කරකවා කියන්නට අර අදින්නේ අපූරු කථාවක් යැයි ගැහැණු ළමයින් ට සිතේ.

'මොනවා. ඔයා කකුලත් එක්ක කථා කෙරුවා.'

බොබී සිනාසෙන්නට උත්සාහ කළා ය.

'කකුලත් එක්ක කථා කළා කියන්නේ මම පුළුවන් තරම් හයියෙන් දුවගෙන ගියා කියන එකයි. මම දුවගෙන ගියේ කොහාටද දන්නවද ? මිස් තියෝබෝල්ඩ් ගේ කාමරයට. එයාගේ කාමරේ

Scanned with CamScanner

sinhalaebooks.com



ඇතුළට ගිහිං මම ඉක්මනට දොර වහ ගත්තා'

ක්ලෝඩින් කියන්නේ කුමක් දැයි දැන ගැනීම සඳහා ගැහැණු ළමෝ උනන්දු වෙන්නට වූහ.

' ඉතින්... ඔයා කරපු වැඩේ හින්දා මිස් තියෝබෝල්ඩ ට ගොඩාක් තරහ යන්න ඇති නේද ?'

ජැනට් අසද්දී ක්ලෝඩින් බයාදු ලෙසින් මෙසේ කීවා ය.

' නෑ හැබැයි ඊට පස්සේ මම මිස් තියෝබෝල්ඩ් එක්ක මහා ලොකු කථාවක් පටන්ගත්තා. ආ.. අපි දෙන්නා කථා කෙරුවා. ගොඩාක් වෙලා කථා කෙරුවා. අනේ අපේ දිග කථාව ඉවර වෙනකම් මිරාබෙල් ඉවසිල්ලක් නැතිව එළියට වෙලා බලාගෙන හිටියා.'

'දෙයියනේ. ඔයා මොනවද ප්‍රින්සිපල් එක්ක ඔය තරම් වෙලාවක් කථා කෙරුවේ ?.'

බොබී ඇසුවේ දරාගත නොහැකි පුදුමයෙනි. ඒ සමඟම ක්ලෝඩින් යාන්තමට මෙන් මෙසේ කීවා ය.

'ඇත්තම කියනවා නම් කාමරේ ඇතුලේ මිස් තියෝබෝල්ඩ් හිටියේ නෑ මම ප්‍රශ්න ඇහුවා. ඊට පස්සේ මිස් තියෝබෝල්ඩ් උත්තර දෙනවා වගේ මම ම උත්තරත් දුන්නා. කාමරේ දොර වහලා තිබුන නිසා කාමරේ ඉන්නේ මම විතරයි කියලා මිරාබෙල් දැනගත්තේ නෑ. ඉතින් මම තනියම ගොඩාක් වෙලා ඒ රඟපෑම කරගෙන ගියා.'

'ඔයා එළියට එනකොට මිරාබෙල් එතැනම හිටිය ද. ?'

බොබී පුදුමයෙන් අසද්දී ක්ලෝඩින් සිනාසී මෙසේ කීවා ය.

' ආ... මිරාබෙල් දොර ළඟ හිටගෙන ඉන්න කොටම මිස් තියෝබෝල්ඩ් කාමරේ පැත්තට ඇවිදගෙන ආවා. දෙයියනේ අහිංසක මිරාබෙල්. මිස් තියෝබෝල්ඩ් දිහා බලාගෙන හිටිය හැටි

Scanned with CamScanner

sinhalaebooks.com



දැන්කම මට හිනාව නවත්තා ගන්න බැරි වුනා. හැබැයි මිස් තියෝබෝල්ඩ් ගේ කටහඬ ඇහුන ගමන් මම තව දුරටත් කාමරේ ඇතුලේ හිටියේ නෑ. ඉක්මනින්ම මම කාමරේ ජනේලෙන් එළියට පැන්නා. මම එළියට පනින කොටම උයන් පල්ලා එතැන හිටියා. එයත් මට බයවෙලා පණ එපා දුවගෙන ගියා.

ගැහැණු ළමෝ මේ කථාව දෙස බලා සිටියේ පුදුමයෙනි. ඇය මිරාබෙල් ගෙන් සහ මිස් තියෝබෝල්ඩ් ගෙන් බේරෙන්නට ජනේලයෙන් එළියට පැනගත් කථාව කෙසේනම් විශ්වාස කරන්න ද ?. කාලෝටා ට හැර මෙවැනි හපන් කමක් කළ හැකි කිසිවෙකු සෙන්ට් ක්ලේයාර් පාසලේ නැත. එහෙත් දැන් ක්ලෝඩින් එවැනි හපන් කමක් කර තිබේ..

' ක්ලෝඩින්. ඔයා නම් ඇත්තටම ගානට වැඩියි.'

බොබී කීවා ය.

'බොබී. මොකක්ද ඔයා මේ හැම වෙලාවෙම කියන සීමාව.

ක්ලෝඩින් බොබී දෙසට හැරී පුදුමයෙන් ඇසුවා ය. එයට පිළිතුරු ලැබුනේ හිලරි ගෙනි. ඇය නිතරම ක්ලෝඩින් ගේ මෙවැනි වැඩ වලින් උපරිම සතුටක් ලබාගන්නට උත්සාහ කරන්නී ය.

' ආ... ඔයා ඒ ගැන ගණන් ගන්න එපා. ඊළඟට වුනේ මොකක්ද කියලා අපිට කියන්නකෝ.'

' ඊට පස්සේ මම පැති දොරෙන් එළියට ගියා. මිරාබෙල් මිස් තියෝබෝල්ඩ් එක්ක ගොඩාක් පුදුමයෙන් කථා කරන සද්දේ මට ඇහුනා. ඔයාලා දන්නවද ? ප්‍රින්සිපල් මිරාබෙල් ට කීවේ මොකක්ද කියලා. - මිරාබෙල් මම මෙතැනමනේ හිටියේ. ඉතින් මම කාමරේ ඇතුලේ කථා කර කර හිටියා කියලා ඔයා කොහොමද කියන්නේ ?. අනේ කරුණාකරලා මෝඩ කථා නම් කියන්න එපා. - අන්න එහෙමයි මිස් තියෝබෝල්ඩ් මිරාබෙල් ට කීවේ.'

Scanned with CamScanner

sinhalaebooks.com



ගැහැණු ළමයින් ගේ මුහුණු පුරා සිනා වැල් පැතිර ගියේ ය. මුලින්ම කථා කළේ ජැනට් ය.

'ඊට පස්සේ ප්‍රින්සිපල් කාමරේ දොර ඇරිය ද?.'

' ඇයි නැත්තේ ?'

ක්ලෝඩින් සිනාසෙන්නට වූවා ය.

' ඒ වුනාට කාමරේ කවුරුවත් හිටියේ නෑ. ඊට පස්සේ මිරාබෙල් ගේ මුහුණේ තිබුන පුදුම සහගත බැල්ම දැක්කම මට හිනාව නවත්ත ගන්න බැරි තරම් වුනා. එතකොට මිස් තියෝබෝල්ඩ්. එයාගේ මුහුණත් ඒ වගේමයි.'

' ඒ වුනාට සිද්ධ වුනේ මොකක්ද කියලා මිරාබෙල් ඔයාගෙන් ඇහුවෙ නැද්ද.?'

පැට් ගේ කටහඬ තුළ දරාගත නොහැකි විශ්මයක් තැවරී තිබේ.

'එයා මගෙන් කිහිප සැරයක් ම ඇහුවා. හැබැයි එයා කියන කිසිම දෙයක් මට තේරුනේ නෑ. එයාගේ ප්‍රංශ භාෂාව හරිම දුර්වලයි. ඒ හින්දා එයා කියන දේවල් මට හරියට තේරුම් ගන්න බැරි වුනා.'

ක්ලෝඩින් එසේ කියද්දීම පෝලීන් විශ්මයෙන් කෑ ගැවා ය

' ආ... මෙන්න මිරාබෙල් එනවා.'

සෙන්ට් ක්ලෙයාර් පාසලේ ක්‍රීඩා නායිකාව ඔවුන් සිටින කාමරයට හෙමෙන් හෙමෙන් ඇවිද එයි. ඇත්තෙන්ම මිරාබෙල් ඇවිද එන විට ඕනෑම කෙනෙකුට පහසුවෙන් හඳුනාගත හැකිය. ඈ පාද තබන්නේ හයියෙනි. එම පා සටහන් වල හඬ සෑහෙන ඈතකට ඇසේ. තවත් ටික වෙලාවකට පසුව මිරාබෙල් කාමරයේ දොර හයියෙන් විවෘත කළා ය. ඇගේ ගැඹුරු කටහඬ තුළ කිසියම් විශ්වාසනීය බවක් තිබේ. කාමරය තුළ සිටින ගැහැණු ළමයින් සමූහය වෙතට ආ මිරාබෙල් ඔවුන්ට මෙසේ කීවා ය.

Scanned with CamScanner

sinhalaebooks.com



'ඔයාලා දන්නවද ?. හෙට රෑ අපි ලොකු ක්‍රීඩා රැස්වීමක් පවත්වනවා. ප්‍රධාන ශාලාවේ. මම ඒකට මිස් තියෝබෝල්ඩ් ගෙන් අවසර ගත්තා. හවස හතටයි රැස්වීම පැවැත්වෙන්නේ. මේ වාරයේදී අපි සෙල්ලම් කරන තරඟ ගැන කථා කරගන්න තියෙනවා. ඇත්තටම ඒවා ගොඩාක් වැදගත් තරඟ. ඔන්න වෙලාව මතකයි නේ. හවස හතට. කවුරුවත් අමතක කරන්න එපා හොඳ ද ?. පස්වැනි පංතියේ ඉන්නේ හැම දෙනාම රැස්වීමට එයි කියලා මම හිතනවා. පොඩි පංතිවල ළමයි නම් හැම දෙනාම එනවා. ඉතින් අපි රැස්වීමට ඇවිත් හිටියේ නැති වුනාම ඒ ළමයින් ගේ හිත් අධෛර්යමත් වෙන්න පුළුවන්.'

'හොඳයි මිරාබෙල්. ඒ වුනාට හෙට සෙනසුරාද නේ. අපිට හෙට නැටුමකට යන්න තියෙනවා කියලා ඔයාට අමතක වුනා ද ?. දැන් හැම දෙයක්ම ලෑස්ති කරලා ඉවරයි කියලා මම හිතනවා. තුන් වැනි සහ හතර වැනි වසර වල ළමයි හැම දෙනාමත් ඒ නැටුමට එනවා. ඒක හැම දෙනාටම ගොඩාක් සතුටු වෙන්න පුළුවන් අවස්ථාවක්.'

මිරාබෙල් ගේ අදහසට කෙලින්ම විරුද්ධ වෙන්නට හිලරි ඉදිරිපත් වූවා ය. එහෙත් මිරාබෙල් යනු කිසිදා පරාජය පිළිගන්නට අකමැති ගැහැණු ළමයෙකි. ඈ මෙවැනි දෙයක් කියුවේ ඒ නිසාය..

'ඒ වුනාට මම හෙට රැස්වීම යොදාගෙන ඉවරයි. අනික තේරුමක් නැති නැටුමකට වඩා මගේ රැස්වීම වැදගත් නැද්ද ?. දැන් කරන්න දෙයක් නෑ. වෙන සෙනසුරාදා දවසකට ඔය නැටුම දා ගන්න. අපේ ඉස්කෝලේ ක්‍රීඩාව දියුණු කරන්න අළුත් අදහස් ගොඩක් ගැන මට හිතන්න තියෙනවා.'

'අනික ඔය රැස්වීම දා ගන්න ඉස්සර අපෙන් අහන්න තිබුනා. එහෙම කරන්නේ නැතිව ඔයා රැස්වීම ගැන තනියම තීරණය කරලා. ඔයා හරි උඩඟු ළමයෙක් මිරාබෙල්. ඒ හින්දා මම නම්

Scanned with CamScanner

sinhalaebooks.com



ඔයාගේ රැස්වීමට එන්නේ නෑ.'

ඇලිසන් එසේ කියද්දී මිරාබෙල් හිස සොලවා ඈ දෙසට හැරුනා ය. ළමයින් අතරින් මෙවැනි විරෝධයක් නැගෙද්දී ක්‍රීඩා රැස්වීම පවත්වන්නේ කෙසේ ද ?. වැදගත් දේවල් සාකච්ඡා කරන්නේ කෙසේ ද ?. මිරාබෙල් ගේ හිතට කිසියම් දෙගිඩියාවක් නැගෙද්දී ඈ ඇලිසන් දෙසට රවා මෙසේ කීවා ය.

'ඔයාට රැස්වීමට එන්නම වෙනවා ඇලිසන්. මොකද මිස් තියෝබෝල්ඩ් තමයි මේ රැස්වීම තියන්න කීවේ. මම කළේ සංවිධානය කරන එක විතරයි. හැම දෙනාටම රැස්වීමට එන්න කියලා මිස් තියෝබෝල්ඩ් කියන්න කීවා. අනික රැස්වීම වැඩි වෙලාවක් තියෙන්නේ නෑ.'

මිරාබෙල් එසේ කීවද කාලෝටා එයට හරස් කැපුවා ය.

'ඔයා හැමදාම කියන්නේ එහෙම තමයි. හැබැයි ඔයාගේ රැස්වීම් වලට හැමදාම ගොඩාක් වෙලා යනවා. ඔයා තනියම කථා කරගෙන කරනවා විතරයි. අනේ මම නම් ඔය පම්පෝරි කථා අහන්න එන්නේ නෑ.'

'කමක් නෑ. හැබැයි රැස්වීමට එන්නේ නැති හැම දෙනාම ගැන මම ප්‍රින්සිපල්ට රිපෝට් කරනවා.'

මිරාබෙල් ගේ මුහුණ කෝපයෙන් කළුවෙන ආකාරය සෑම දෙනාටම දැකගත හැකි ය. ඒ අතර හිලරි මෙසේ කීවා ය.

'මිරාබෙල් ඔය රැස්වීම වෙන වෙලාවකට දමාගන්න. අපි හැම දෙනාම කියන දේවල් අහන්න ඔයාට අයිතියක් තියෙනවා. අනික හෙට රෑ අපි හැම දෙනාම ටිකක් විනෝද වෙන දවසක්. ඒක නැති කරන්න එපා. මොකද අපි මේ සතිය පුරාම පාඩම් කරන්න ගොඩාක් මහන්සි වුනා.'

'මට කනගාටුයි. ඔයාලා මොනව කීවත් රැස්වීම හෙට රෑ

Scanned with CamScanner

sinhalaebooks.com



හතට තියෙනවමයි. ඔයාලා හැම දෙනාම විරුද්ධ වුනත් ඒ රැස්වීම වෙනස් කරන්න මම සූදානම් නෑ. තේරුනාද හිලරි ?. ඔයා මේ පංතියේ නායිකාව වෙන්න පුළුවන්. ඒ වුනාට මම මේ මුළු ඉස්කෝලේම ක්‍රීඩා නායිකාව කියන එක අමතක කරන්න එපා.'

මිරාබෙල් ගේ කටහඬ තුළ කිසිම ආකාරයක සැහැල්ලුවක් හෝ බුරුලක් තිබුනේ නැත. ඉන්පසුව මිරාබෙල් ශබ්ද නගා කාමරයේ දොර වසාගෙන පිටව ගියා ය. තමන් පිටව යාමෙන් පසුව ගැහැණු ළමයින් දොස් පවරන බව මිරාබෙල් හොඳින්ම දැන සිටියා ය. එසේ වුවද සෙන්ට් ක්ලෙයාර් පාසල වෙනත් පාසලකට එරෙහිව තරග වදින විට මිරාබෙල් තමුන් සතුව ඇති උපරිම ශක්තියෙන් තරග කොට පාසලට කීර්තියක් අත් කර දෙන බව ද ගැහැණු ළමයින් ට රහසක් වූයේ නැත.

' එයා තමන්ට හිතෙන දේ කාගෙන්වත් අහන්නේ නැතිව කරන ළමයෙක්.'

ක්ලෝඩින් නොඉවසිල්ලෙන් කියද්දි පැට් ද ඔවුන්ගේ කථාවට එකතු වූවා ය.

' ඔයා කියන්නේ එයා කවුරුවත් කියන දේ අහන්නේ නැති ළමයෙක් කියල ද ?. ක්ලෝඩින් ඔයා කියන්නේ සම්පූර්ණ ඇත්ත. මිරාබෙල් නිතරම හිතන්නේ ක්‍රීඩාව ගැන විතරයි. එයාට ක්‍රීඩාවෙන් තොර ලෝකයක් නෑ. ඇත්තම කියනව නම් මේ වෙලාවේ හැටියට මට පිට්ටනියට ගිහිං නාස්ති කරන්න කාලයක් නෑ. ඒ වුනත් මිරාබෙල් ඔය තත්ත්වය තේරුම් ගන්නේ නෑ. අන්න ඒකයි එයාගේ තියෙන දූර්වලකම.'

' ඇත්තටම අපි මේ එපා කරපු රැස්වීමට යනව ද ?. මගේ සංගීත පුහුණුවටත් වෙලාව ඕනෑ වෙලා තියෙනවා.'

ෆෙලිසිටි කියද්දි ඈන් මාරි ද ඇයට අත්වැල් අල්ලන්නට මෙන් මෙසේ කීවා ය.

Scanned with CamScanner

sinhalaebooks.com



' මගේ අළුත්ම කවිය ඉවර කරන්නත් තියෙනවා.'

'මිරාබෙල් ගේ රැස්වීමට මිස් තියෝබෝල්ඩ් අනුමැතිය දීලා තියෙනව නම් අපිට යන්න වෙනවා. අනික අපිට මේ රැස්වීමට එන්න බෑ කියලා මිස් තියෝබෝල්ඩ් ට කියන්න බෑ. අපි එහෙම කියන එක හරි නෑ. හැබැයි අපිට ඒ ගැන කියන්න අවස්ථාවක් ලැබෙයි.'

හිලරි එසේ කියද්දි ක්ලෝඩින් හරිම අමුතු කථාවක් කියුවා ය.

' සමහර විට හෙට මේ රැස්වීම තියන්න බැරිවෙයි කියලා මට හිතෙනවා.'

බොබී සැකයෙන් මෙන් ක්ලෝඩින් දෙසට හැරී මෙසේ කීවා ය.

'ඒ ගැන හිතන්නවත් එපා. මොකද මිරාබෙල් කවුද කියලා මම හොඳට දන්නවා. එයා මොකක් හරි දෙයක් කරන්න හිතුවොත් මොන දේ වුනත් එයා ඒක කරනවා මයි. එයා උපතින්ම ආඥාදායකයෙක් කියලා කීවොත් වරදක් නෑ.'

' මම කියන්නේ ඒක නෙවෙයි. මේ රැස්වීම තියන්න ලැබෙන්නේ නෑ කියන එකයි.'

ක්ලෝඩින් හිස් අහස දෙස බලා කියූ දේ කිසිවෙකුටත් වටහා ගත නොහැකි ය. බොබී සැකයෙන් මෙන් ඈ දෙසට හැරී මෙසේ ඇසුවා ය.

'ඔයා මොනවද මේ කියන්නේ ?.'

ඇත්තටම මට එහෙම හිතෙනවා. සාමාන්‍යයෙන් මට එහෙම දෙයක් හිතුනම ඒ දේ හරියටම හරියනවා. ඒ කියන්නේ හෙට රැ තියෙන රැස්වීමත් තියන්න ලැබෙන්නේ නෑ කියන එකයි. ඇත්තටම කොහොමද ඒක වෙන්නේ ?. අනේ ඒ ගැන නම් මට

Scanned with CamScanner

sinhalaebooks.com


ගන්න බෑ'

ක්ලෝඩින් එසේ කියද්දි හිලරි විමසිල්ලෙන් මෙන් ඈ දෙස බලා සිටියා ය. එහෙත් ක්ලෝඩින් ගේ දෑසෙහි කිසිදු වෙනසක් නැත. ඈ දිලිසෙන නෙතින් හිලරි දෙස බලා සිටින්නී ය.

' ඔයා මොනව හරි දෙයක් ගැන කල්පනා කරනව ද ?. එහෙම දෙයක් කරන්න හිතනව නම් කරුණාකරලා දැන්මම ඒ අදහස අත අරින්න ක්ලෝඩින්. මොකද ඔයා දැන් පස් වැනි පංතියේ ළමයෙක්. ඒ හින්දා ඉස්කෝලේ වැදගත් රැස්වීමක් තියෙන වෙලාවක කිසිම විදිහක බාධා කිරීමක් කරන එක හොඳ වැඩක් නම් නෙමෙයි.'

හිලරි අවවාදාත්මක ලෙස කියද්දි ක්ලෝඩින් කිසිවක් නොකියාම කාලෝටා සමඟ තමන්ගේ පාඩම් කාමරය දෙසට ඇවිද ගියා ය.

රාත්‍රිය උදාවූයේ ය. පාසලේ සැම දෙනාම සුව නින්දේ පසුවෙති. සියල්ලම නිදිගත් රාත්‍රියේ දි ක්ලෝඩින් සෙමෙන් සෙමෙන් කාමරයෙන් එළියට විත් කොරිඩෝරයට ආවා ය. දැන් ඇය පඩි පෙළ දිගේ පහතට බසින්නී ය. ඇය සෙමෙන් සෙමෙන් ඇවිද යන්නේ ඇන්ටනට් නිදා සිටින නිදන ශාලාව වෙතටයි. සියල්ලම නිහඬය. ඇන්ටනට් අසලට ගිය ක්ලෝඩින් ඇන්ටනට් ගේ ඇඟට සෙමෙන් තට්ටු කළා ය.

ඇන්ටනට් අවදි වූවා ය. තමන්ගේ ඇඳ අසල සිටගෙන සිටින සොහොයුරිය ඇයට දැක ගත හැකි ය.

' බයවෙන්න දෙයක් නෑ ක්ලෝඩින්. මම ඔයා කියපු විදිහටම ඒ වැඩේ කරන්නම්. කිසිම දේකට කළබල වෙන්න එපා. වැඩේ හරියටම හරි යයි.'

ඉන්පසුව ක්ලෝඩින් පුංචි හොල්මනක් මෙන් නිහඬවම තමන්ගේ පාඩම් කාමරය වෙතට ඇවිද ගියා ය. ඇය ඇඳ මතට ගොඩ වූයේ උතුරා යන සතුටෙනි.

Scanned with CamScanner

sinhalaebooks.com



-මිරාබෙල් හෙට ඔයාගේ රැස්වීම නම් තියන්න ලැබෙන්නේ නෑ. ඔයා හෙට මේ පුංචි ප්‍රංශ කෙල්ලට පරදිනවා. එහෙම වුනාම ඔයාට ගොඩාක් ලැජ්ජා හිතෙයි. හැබැයි ඔයාගේ උද්දච්ච කමට ඒක හොඳ පාඩමක් වෙයි. ඒක සහතිකයි-

ක්ලෝඩින් ගේ හිත පුරා කිසියම් සතුටක් ගලා යද්දි ඈ මෙවැනි දේ ගැන බොහෝ වෙලාවක් කල්පනා කළා ය. අවසානයේදී නින්ද ඈ අවනත කරගත්තේ ය.

Scanned with CamScanner

sinhalaebooks.com

# ක්‍රීඩා රැස්වීමට මොකද වුනේ ?

සෙනසුරාදා රාත්‍රියේ තිබෙන ක්‍රීඩා රැස්වීම ගැන කිසිම ගැහැණු ළමයෙක් සතුටු වූයේ නැත. මිරාබෙල් තමන්ගේ ප්‍රීතිමත් රාත්‍රිය කඩාකප්පල් කර දැමූ වග සෑම දෙනාම අමනාපයෙන් මෙන් කියන්නට වූහ. විශේෂයෙන් තුන් වැනි. හතර වැනි සහ පස් වැනි පංතිවල ළමයින් මෙම රැස්වීමට කොහෙත්ම කැමැති වූයේ නැත.

'මිරාබෙල් හිතාගෙන ඉන්නේ මේ ඉස්කෝලේ එයාගේ කියලද දන්නේ නෑ. එයා තනියම මේ වගේ දේවල් කරන්නේ ඒ නිසා වෙන්න ඇති.'

හතර වැනි පංතියේ ඉගෙන ගන්නා බෙලින්ඩා අමනාපයෙන් කීවා ය. තුන් වැනි පංතියේ ඉගෙන ගන්නා රීටා ද චෝදනාත්මකව කථා කළා ය.

'ඇත්තටම මම සෙල්ලම් කරන්න හරිම කැමැතියි. ඒ වුනාට මිරාබෙල් ගේ වැඩ හින්දා මට දැන් සෙල්ලම් කරන එකත් එපා

Scanned with CamScanner

sinhalaebooks.com



වෙලා. මම පළමු පංතියේ ඉන්න කොට එයා සෙනග ඉස්සරහ දී ම මට අපහාස කළා.'

එසේ කීව ද රීටා එසේ කීව ද මිරාබෙල් අභිභවා යාමේ හැකියාවක් ඇයට නැත. මිරාබෙල් සතුව තිබෙන මහා බල පරාක්‍රමය ඉදිරියේ නැගී සිටින්නට තරම් ආත්ම ශක්තියක් රීටා වැනි කුඩා ළමයෙකුට කෙසේවත් නැත.

සෙනසුරාදා රාත්‍රියේ හතේ හෝරාව ආසන්න වෙත්ම පස් වැනි පංතියේ ගැහැණු ළමෝ තමන්ගේ සියළු වැඩ කටයුතු පසෙකට කළ හ. කියවමින් සිටි පොත් පැත්තකින් තැබූහ. මැහුම් කටයුතු අවසන් කළ හ. ලියන කියන කටයුතුවලට විරාමය තැබූහ. දැන් රැස්මේ කටයුතු ආරම්භ වෙන වෙලාව ද උදාවී තිබේ. එහෙත් එම වෙලාවටම රැසවීම සඳහා ප්‍රධාන ශාලාව වෙත යන්නට ඔවුන් අමතක කළේ නැත. එයට ද හේතුවක් තිබේ. ඔවුන් පස්වැනි වසරේ ළමයින් ය. පහළ පංතිවල ළමයින්ට ආදර්ශයක් වන්නට නම් ඔවුන් නීතියට අනුව කටයුතු කළ යුතු ය.

මේ අතර මිරාබෙල් ප්‍රධාන ශාලාවේ කොරිඩෝරය අසල සිටගෙන වටපිට බලන්නට වූවා ය. අද දින රැස්වීමේදි පැවසිය යුතු දෑ අඩංගු සටහනක් ද ඇගේ අතේ තිබේ. දැන් දැන් ගැහැණු ළමයින් එකා දෙන්නා බැගින් විත් ප්‍රධාන ශාලාව පිරෙයි. ශාලාව වෙත එන ගැහැණු ළමයින් කවුරුද යන වග වටහා ගන්නට මෙන් මිරාබෙල්ගේ දෑස විගසින් එහා මෙයා ගමන් කරයි. මෙම රැස්වීමට නොඑන කවරෙකු හෝ සිටිනවා නම් ඇයව හඳුනාගත යුතුය. එවිට හෙට දිනයේදි එම ගැහැණු ළමයාට මතක හිටින අවවාදයක් දෙන්නට තමන්ට හැකිවෙනු ඇතැයි මිරාබෙල් කල්පනා කළා ය.

ඇන්ටනට් ඇය සිටින තැනට දුවගෙන ආවා ය. මිරාබෙල් මේ කුඩා ප්‍රංශ ගැහැණු ළමයා දෙස බලා සිටියේ පුදුමයෙනි.

'ඇයි ඇන්ටනට් ?.'

Scanned with CamScanner

sinhalaebooks.com


මිරාබෙල් එසේ අසද්දී ඇන්ටනට් බයාදු ලෙස කථා කරන්නට වූවා ය.

' අනේ මිරාබෙල් දෙවැනි වසරේ ළමයින්ට සෙල්ලම් කරන්න බෝල දෙකක් ම තියෙනවා. අපි ළඟ තිබුන බෝල දෙකෙන් එකක් නැති වෙලා. ඉතින් අපිට සෙල්ලම් පුරුදු වෙන්න අමාරුයි. ඉතින් අපිට අළුත් බෝලයක් ගන්න පුළුවන් ද?.'

' ආ හා'

මිරාබෙල් ඇන්ටනට් දෙස සැකයෙන් හැරී බැලුවා ය ක්‍රීඩාවට එතරම් කැමැත්තක් නොදක්වන ඇන්ටනට් මෙවැනි දෙයක් පැවසීම ඇයට කෙසේවත් විශ්වාස කළ නොහැක. මිරාබෙල් ටික වෙලාවක් ඇන්ටනට් දෙස බලා හිඳ මෙසේ කීවා ය.

' ඇයි මේ වගේ දෙයක් කථා කරන්න වයලට් ආවේ නැත්තේ ?'

' වයලට් ට සනීප නෑ. එයා ඉන්නේ අසනීප කාමරේ.'

ඇන්ටනට් කීවා ය.

' හොඳයි කමක් නෑ. අළුත් බෝලය ගැන කථාකරන්න සඳුදට එන්න. ඒ වගේ දෙයක් ගැන කථා කරන්න මේ වෙලාවේ මම කැමැති නෑ. අපි තව ටික වෙලාවකින් ගොඩාක් වැදගත් රැස්වීමක් පවත්වනවා කියලා ඔයා දන්නවා. ඉතින් බෝලයක් ගැන අහන්න එන්න ඉස්සර වෙලා ඔයාට ඒ ගැනත් හිතන්න තිබුනා.'

මිරාබෙල් නොකැමැත්තෙන් මෙන් කියද්දී ඇන්ටනට් හනි හනික එතැනින් යන්නට ගියා ය. ඇත්තෙන්ම ඇන්ටනට් ගැන මිරාබෙල් ගේ හිතේ කිසිම මනාපයක් නැත. ඇය ත් ක්ලෝඩින් ට සමාන හැසිරීම් රටාවක් ඇති ගැහැණු ළමයෙකි. කිසිම දෙයකට උනන්දුවක් නොදක්වන ඇන්ටනට් සමහර අවස්ථාවලදී කරන්නේ විශ්වාස කළ නොහැකි තරම් පුදුම හිතෙන දේවල් ය.

Scanned with CamScanner

sinhalaebooks.com



දැන් ගැහැණු ළමයි සෑම දෙනාම ප්‍රධාන ශාලාවට වීත් වාඩිවී සිටිති. මිරාබෙල් හාත්පසම විපරම් කළා ය. ජේන් ටිල් පළමු පංතියේ ළමුන් වාඩිවී සිටින බංකුව මත වාඩිවී සිටින ආකාරය ඇයට දැක ගත හැකිය. ජේන් ගේ මුහුණ සුදුමැලි වෙලා ය. අද දින සන්ධ්‍යා කාලයම ජේන් ගත කළේ ඇන්ජෙලා සමග ය. ඇන්ජෙලාට තමන්ගේ හිස කෙස් සෝදා ගන්නට ද ජේන් උපකාරී කළා ය. මේ කාරණය දැනගත් සැනින්ම මිරාබෙල් ජේන් දෙස කෝපයෙන් රවා බැලුවා ය. ජේන් පමණක් නොව පළමු වසරේ අනිත් ළමයින් ද අහංකාර ඇන්ජෙලාට මෙහෙකාරකම් කිරීම ගැන මිරාබෙල් කිසිම කැමැත්තක් නොදක්වන්නී ය.

ඒ අතර මිරාබෙල් පස් වැනි පංතියේ ළමයින් වාඩි වී සිටින බංකුව දෙස විමසිලිමත් බැල්මක් යොමු කළා ය. පංතියේ සෑම දෙනාම පෙනෙන්නට සිටියද ෆෙලිසිටි නම් තවමත් රැස්වීමට ඇවිත් නැත. ඒ අතරම කොරිඩෝරය දිගේ ඈන් මාරි ඇවිද ආවා ය. මිරාබෙල් ඇගෙන් මෙසේ ඇසුවා ය.

'කෝ ෆෙලිසිටි ?.'

' එයා ඉක්මනට එයි මිරාබෙල්.'

ඈන් මාරි ගේ පිළිතුර කෙටි ය. අද දින සෑම දෙනාම මිරාබෙල් ට පිළිතුරු දෙන්නේ එවැනි කෙටි ආකාරයේ පිළිතුරු ය. කරදරකාරී ක්‍රීඩා රැස්වීම නිසා තමන් ට විනෝද වෙන්නට තිබූ අවස්ථාව නැතිවීමේ කෝපය සහ දුක සෑම දෙනාගෙම හිත් වල නො අඩුව තිබේ.

'ෆෙලිසිටි ට මොනවද සංගීත ප්‍රස්ථාර වගයක් පිටපත් කරන්න තියෙනවා. ඒක ඉවර වුන ගමන් එනවා කීවා.'

' කමක් නෑ. මම එයා නැතිව රැස්වීම පටන්ගන්නවා. එයා හැමදාම මෙහෙම තමයි. කවදාවත් වෙලාවට එන්නේ නෑ. බලන්න

Scanned with CamScanner

sinhalaebooks.com



දැනටමත් හත පහුවෙලා විනාඩියයි. පහළ පංතිවල ළමයි ෆෙලිසිටි ආදර්ශයට ගත්තොත් නම් කිසිම වැඩක් නෑ කියලා මට හිතෙනවා.'

එසේ කියූ මිරාබෙල් ප්‍රධාන ශාලාවට ගියා ය. දැන් සෑම දෙනාම තම තමන් ගේ ආසන වල වාඩිවී සිටිති. ගැහැණු ළමයින් සෑම දෙනාගෙම මුහුණු වල කිසියම් නොරිස්සුම් සහගත හැඟීමක් තැවරී තිබෙන බව මිරාබෙල් ට නම් වටහාගත හැකි වූයේ නැත. ඈ ශාලාව ඉදිරිපිට තිබෙන කුඩා වේදිකාව වෙතට ගොස් ගැඹුරු එමෙන්ම පැහැදිලි හඬකින් කථා කරන්නට කරන්නට වූවා ය.

' හැම දෙනාටම සුබ හැන්දෑවක්. ඇත්තටම අපිට වැදගත් දේවල් ගොඩාක් කථා කරගන්න තියෙනවා. ඒ නිසයි මම මේ වැදගත් රැස්වීමට හැම දෙනාටම එන්න කියලා කීවේ. මේ රටේ තියෙන ඉස්කෝලවලින් අපේ ඉස්කෝලේ කැපී පෙනෙන ඉස්කෝලයක් කරන්න මට ඕනෑ වෙලා තියෙනවා. මම කියන්නේ ක්‍රීඩා ව අතින් අපේ ඉස්කෝලෙත් දක්ෂ හොකී කණ්ඩායමක් හදන්න මම හිතාගෙන ඉන්නවා. එතකොට මට ඕනෑ වෙලා තියෙනවා...'

මිරාබෙල් දිගින් දිගටම කථා කරගෙන යද්දි පළමු පංතියේ ගැහැණු ළමයෙක් නැගිට ඇයට බාධා කළා ය.

'මිරාබෙල් ජේන් ට සනීප නෑ. එයා මේ රැස්වීමෙන් යන්න කැමැති නෑ. ඒ වුනාට එයාට හොඳටම අසනීපයි. එයාට තව දුරටත් මෙතැන ඉන්න අමාරුයි.'

එසේ කථා කළේ ජේන් ටිල් ගේ යෙහෙළිය වන සැලී ය. ඒ සමඟම සෑම දෙනාම අසරණ ජේන් දෙස හැරී බැලුවා ය. ජේන් ගේ මුහුණ සුදුමැලි ය. ඇය ක්ලාන්ත වෙන්නට ආසන්න වූවාක් මෙනි.

' සැලී එයාව කාමරේට එක්ක යන්න.'

මිරාබෙල් නොකැමැත්තෙන් කීවා ය. තමන්ගේ කථාව ආරම්භ වෙද්දීම මෙවැනි බාධාවක් සිදුවීම ගැන ඇගේ හිතේ කිසිම

Scanned with CamScanner

sinhalaebooks.com



මනාපයක් නැත. ඒ අතර සැලී අපහසුවෙන් මෙන් ජේන් වත්තම් කරගෙන කාමරයෙන් පිටව ගියා ය. 'මොකද සැලී ඔයාටත් සනීප නැද්ද ?.' යනුවෙන් ඇසූ මිරාබෙල් නැවතත් කථාව ආරම්භ කළා ය. මේ වනවිටත් ඇගේ කථාවෙන් විනාඩි හතරක් පහක් පමණ අපතේ ගොසිනි.

' අපි සෙල්ලම් කරන හැම ලක්‍රොස් මැච් එකක්ම දිනන්න ඕනෑ. අනික අපි කවදාවත් පරදින්නේ නැති හොඳ හොකී කණ්ඩායමකුත් හදන්න ඕනෑ. ඒ වගේම අපි... '

මිරාබෙල් දිගින් දිගටම කථා කරගෙන ගිය ද කිසිවෙකුටත් ඇගේ කථාව අසන්නට උනන්දුවක් දැක්වූයේ නැත. තවත් මොහොතක් ගතවූයේ ය. ප්‍රධාන ශාලවේ සිටි සෑම දෙනාම බයෙන් මුසපත් කරමින් කන් බිහිරි කරවන හඬක් පැතිර ගියේ ය. ඒ හඬ නැගුනේ ගිනි අනතුරු හඟවන සයිරන් නලාවෙනි.

' ක්ලැන්ග්.... ක්ලැන්ග්.... ක්ලැන්ග්..... ක්ලැන්ග්.'

මිරාබෙල් තමන්ගේ කථාව එක්වරම නතර කොට වටපිට විපරම් කළා ය. හදිසි ගින්නක් පිළිබඳව අනතුරු හඟවන නලා හඬක් නැගේ. එහෙත් මෙය ගිනි අනතුරු පුහුණුවක් පිළිබඳ අඟවන නලා හඬක් නොවේ. මේ අවස්ථාවේ වැදගත් රැස්වීමක් පැවැත්වෙන බව මිස් තියෝබෝල්ඩ් හොඳාකාරවම දනියි. ඒ නිසා ඇය ගිනි අනතුරු ගැන හදිසි පුහුණුවක් කැඳවන්නට නලාව නාද කරන්නේ නැති බව මිරාබෙල් ට සහතිකය.

හදිසි ගිනි අනතුරු නලා හඬ නිසා පළමු සහ දෙවැනි වාර වල ගැහැණු ළමෝ බයෙන් ගැහෙන්නට වූහ. මෙම රැස්වීමේ කිසිම ගුරුවරියක් නොසිටියි. ඒ නිසා කුඩා ගැහැණු ළමෝ වැඩිමහල් ගැහැණු ළමුන් ගේ ආරක්ෂාව පතා ආයාචනා කරන්නට වූහ.

හිලරි මුලින්ම නැගී සිටියා ය. ඇගේ මුහුණෙහි කිසිම කළබලයක් නැත. ඈ නිවුන් සොයුරියන්ට මෙසේ කීවා ය.

Scanned with CamScanner

sinhalaebooks.com



'පළමු සහ දෙවැනි පංතිවල ළමයි එළියට අරගෙන යන්න මට උදව් කරන්න. අපි ඒ අයව පැති දොරෙන් එළියට අරගෙන ඉස්කෝලේ පිට්ටනියට එක්ක යමු.'

ඒ අතර මිරාබෙල් ද සෑම දෙනාටම අණ කරන්නට වූවා ය. ඇගේ ගැඹුරු සහ තියුණු කටහඬ ශාලාව පුරා පැතිරෙන්නට වූයේ නිමේෂයකිනි

'ඒ ඇහෙන්නේ ඉස්කෝලේ ගිණි අනතුරු හඟවන සීනුව. දැන් කරන්න ඕනෑ මොකක් ද කියලා ඔයාලා දන්නවනේ. කරුණා කරලා හැම දෙනාම ඉක්මන් කරන්න.'

ගැහැණු ළමෝ හනි හනික තම තමන්ගේ ආසන වලින් නැඟී සිටියහ. ඒ අතර තිවුන් සොයුරියන්, බොබී සහ ජැනට් පළමු පංතිවල ළමයින් ශාලාවෙන් පිටතට කැඳවාගෙන යන ආකාරය ද මිරාබෙල් ට දැකගත හැකිවිය. ඒ අතර පළමු වසරේ ගැහැණු ළමයින් බයෙන් මෙන් වටපිට බලන ආකාරය ද මිරාබෙල් ට දැකගත හැකිවිය. ඈ හයියෙන් කෑගසා ඒ ගැහැණු ළමයින්ට මෙසේ අණ කළා ය.

'දකුණට හැරෙන්න. ඊට පස්සේ හිලරි වෙන්ට්වෝර්ද් පස්සෙන් යන්න.'

එය කිසිම ආකාරයක කළබලයක් නොවන ආකාරයෙන් කළ දැඩි අණ කිරීමක් වැනි ය. පළමු සහ දෙවැනි වාරවල ළමයින් හිලරි පසුපස ඇවිද යන්නට වූහ. ඔවුන් ගෙවත්තේ පැති දොර විවෘත කරගෙන පාසලේ ක්‍රීඩාංගනය කරා ඇවිද යන්නට වූහ. දැන් සනදුරු රාත්‍රිය උදවෙලා ය. එහෙත් ගැහැණු ළමයින්ට පාසලේ ක්‍රීඩාංගනය කරා ඇවිද යන්නට අපහසුවක් නැත

පැට් සහ ඉසබෙල් දෙවැනි වසරේ ළමයින් ශාලාවෙන් පිටතට රැගෙන ආවෝ ය. බොබී සහ ජැනට් තුන් වැනි වසරේ ළමයින් ක්‍රීඩාංගනයට රැගෙන එද්දි එම පංතියේ නායිකාවද ඔවුන්ට උපකාර කළා ය. ඒ සමඟම හතර වැනි වසරේ ගැහැණු ළමෝ

Scanned with CamScanner

sinhalaebooks.com



පස්වැනි වසරේ ළමයින් සමගම ක්‍රීඩාංගනය කරා ඇවිද ආවෝය. ඔවුන් සියල්ලෝම වටපිට විපරම් කළ ද හදිසි ගින්නක සේයාවක් හෝ අඩුම තරමෙන් දුම් රොදක් හෝ දැකගත නොහැකි විය.

අවසානයට ප්‍රධාන ශාලාවෙන් නික්ම ගියේ මිරාබෙල් ය. ඕනෑම හදිසි අවස්ථාවකදී ඈ නිතරම මුලින්ම ඉදිරිපත් වන්නී ය. මිරාබෙල් ගේ ගැඹුරු සහ තියුණු නියෝග ඕනෑම ගැහැණු ළමයෙකුගේ හිතට දිරි වඩවයි. මේ හදිසි ගින්න ඇති වී තිබෙන්නේ කොහිදැයි ඈ විපරම් කළේ කිසියම් දෙයක් හැකි ඉක්මනින්ම කිරීමේ අදිටනිනි.

මේ අතර මැඩමොසෙල් ද එතැනට ආවා ය. මිස් තියෝබෝල්ඩ් පාසලෙන් පිටතට ගොස් ඇති මේ වෙලාවේ පාසලේ කටයුතු බලාගන්නේ මැඩමොසෙල් ය. කොරිඩෝරය දිගේ ඇවිද එන මැඩමොසෙල් ගේ ගැඹුරු සහ බයෙන් මුසපත් වූ කටහඬ පිට්ටනියේ සිටින ගැහැණු ළමයින්ට හොඳින් ම ඇසේ.

' ආ... කොහෙද මේ ගෑණු ළමයි ?. හරි... හරි... ඒ අය ඉන්නේ රැස්වීම් ශාලවේ. මිස් තියෝබෝල්ඩ් ඉස්කෝලෙන් එළියට ගියාට පස්සේ හදිසි ගින්නක් ඇති වුනේ කොහොමද කියලා මට නම් හිතාගන්න බෑ. ළමයි ඔයාලා කොහෙද ඉන්නේ ?. ක්ලෝඩින්. ඇන්ටනට්. ඔයාලා ඉන්න තැනකින් ඉක්මනට කථාකරන්න. ඔයාලට කරදරයක් නෑ නේද ?.'

'අපිට කරදරයක් නෑ.'

ක්ලෝඩින් ගේ සිහින් කටහඬ කළුවර අතරින් මැඩමොසෙල්ට ඇසුනේ ය. ඒ අතර ක්‍රීඩාංගනයේ අඳුර අතරින් මෑත් වූ ඇන්ටනට් මැඩමොසෙල් සිටගෙන සිටින තැනට දුව ගොස් මෙසේ කීවා ය.

' මටත් කිසිම කරදරයක් නෑ.'

Scanned with CamScanner

sinhalaebooks.com



මැඩමොසෙල් වහාම තම දෑත ඇන්ටනට්ගේ කර වටා දමාගත්තා ය. ඇගේ මුහුණේ තිබෙන්නේ ඇන්ටනට් මහා ගින්දරකින් බේරාගත්තා ක් වැනි හැඟීමකි.

' අනේ මගේ පුංචි ඇන්ටනට්. ඔයා ගොඩාක් බය වුනා ද?. කිසි දේකට බයවෙන්න එපා. ඔයාගේ ගොඩාක් ශක්තිමත් නැන්දා හැමවෙලාවෙම ඔයා ළඟ ඉන්නවා.'

' මැඩමොසෙල්. කොහෙද ගින්න තියෙන්නේ ?.'

ගැහැණු ළමයින් ගේ නොඉවසිලිමත් කටහඬ සෑම පැත්තෙන්ම ඇසෙන්නට විය.

' ආ ගින්න ද ?. ඇත්තටම කොහෙද ගින්න තියෙන්නේ ?.'

මැඩමොසෙල් ද පුදුමයෙන් මෙන් එම පැනයම ප්‍රතිරාවය කළා ය. ඇත්තෙන්ම ගින්න තිබෙන්නේ කොහිද යන කාරණය ඇයටද ගැටළුවකි.

මේට්‍රන් වරිය මෙතැනට ආවේ ඒ අවස්ථාවේදී ය. ගිනි අනතුරු හඟවන සීනුව නාදවෙන මොහොතේදීම මේට්‍රන්වරිය මුළු පාසල පුරාම පරීක්ෂා කළා ය. පාසලේ කොහේවත් ගින්නක සළකුණක් ඇයට දැකගත හැකිවූයේ නැත. ඉන්පසුව ඇ අනතුරු හඟවන සීනුව තිබෙන තැනට ද ගියා ය. සීනුවද එලෙසම තිබේ. සිදුව තිබෙන දේ ඇයට වැටහෙයි. කිසිවෙකු හෝ විහිළුවට ගිනි අනතුරු හඟවන සීනුව නාද කරන්නට ඇත. සෙන්ට් ක්ලෙයාර් පාසලේ සිදුවෙන කුඩා විහිළුවක් බොහෝ දුර ගමන් කරන බව ඇය අත්දැකීමෙන් ම දනියි. දැන් සිදුව තිබෙන්නේ ද එවැනි දෙයක් බවට නම් කිසිම සැකයක් නැත.

' ළමයි ඔක්කොම මෙහාට එන්න.'

ගැහැණු ළමයි අසලට ගිය මේට්‍රන් වරිය තියුණු එහෙත් තිවුනු හඬකින් එසේ කීවා ය.

Scanned with CamScanner

sinhalaebooks.com



මෙහේ කොහෙවත් ගින්නක් නෑ. මොනව වුනත් අනතුරු හඟවන සීනුව නාද වුනාම ඔයාලා ඒ ගැන ඉක්මනින්ම සැළකිලිමත් වෙන එක ගැන මම ගොඩාක් සතුටු වෙනවා. හැමදාම ඔයාලා මේ වගේ හැසිරෙනවා නම් ඇත්තටම කාටවත් කිසිම අනතුරක් වෙන්නේ නෑ කියලා මට සහතිකයි.'

'ඇත්තටම අපි මේ ප්‍රධාන ශාලාවෙයි හිටියේ.'

හිලරි කීවා ය.

'ඉතින් සීනුව ඇහුන ගමන් අපි පිට්ටනියට දුවගෙන ආවා. ඒත්. මේට්‍රන් කවුද සීනුව ගහලා තියෙන්නේ ?.'

' අපිට ඒ කෙනා කවුද කියලා පස්සේ හොයාගන්න පුළුවන්. කොහොම වුනත් ඔයාලා දැන්මම ඉස්කෝලේ ඇතුළට ගියොත් හොඳයි.'

මේට්‍රන් වරිය කිසියම් නියෝගයක ආකාරයකින් කියද්දි ගැහැණු ළමෝ හනි හනික පාසල තුළට යන්නට සූදානම් වූහ. එළිමහනේ තිබෙන දැඩි සීතල නිසා සමහර ගැහැණු ළමෝ කට කට ගා වෙව්ලති. මේට්‍රන් මේ බව දුටුවා ය. ඇයට එක්වරම සිහිවූයේ අසනීප කාමරයයි. දැඩි සීතල නිසා අසනීප වූ කිසිම ගැහැණු ළමයෙක් පසුගිය සති කිහිපය තුළම අසනීප කාමරයට යැවුනේ නැත. එහෙත් තව වැඩි වෙලාවක් එළිමහනේ සිටිහොත් ඉක්මනින් ම ඒ දෙය සිදුවිය හැකි බව ඇයට වැටහෙයි. ඇය ඉක්මනින් ම තම ඔර්ලෝසුව දෙස බලා ළමයින්ට මෙසේ කීවා ය.

' ළමයි. ඔයාලා ඉක්මනට පාඩම් කාමර වලට ගිහිං පාඩම් කටයුතු පටන්ගන්න. කරුණාකරලා පංති නායිකාවෝ ඉක්මනට ගිහිං විවේක කාමරවල ගිනි උදුන් පත්තු කරන්න. කාමර උණුසුම් වෙලා විනාඩි දහයක් ගියාට පස්සේ එක පංතියකින් ගැහැණු ළමයි දෙන්නා ගානේ කුස්සියට එන්න. එතකොට උණුසුම් කොකෝවා ජෝග්ගුවක් ගානේ අරන් යන්න පුළුවන් වෙයි. ඔයාලට මොනව

Scanned with CamScanner

sinhalaebooks.com



හරි උණුසුම් දෙයක් ඉක්මනට බොන්න දෙන්න ඕනෑ කියලා මට හිතෙනවා.'

එය මොන තරම් රසවත් ආරංචියක් ද ?. ගිනි උදුන් වලින් උණුසුම් වූ කාමර වලට ගොනු වී උණුසුම් එමෙන්ම රසවත් කොකෝවා කෝප්පයක් පානය කිරීම කදිම අදහසකි. එහෙත් මෙට්‍රන්වරියගේ අදහසට මිරාබෙල් ගේ කිසිම කැමැත්තක් තිබුනේ නැත. ඇය මෙට්‍රන් වරියට මෙසේ කිවා ය.

'මෙට්‍රන් මම ඒකට කැමැති නෑ. අපි ගොඩාක් වැදගත් රැස්වීමකයි හිටියේ. ඒ හින්දා මේ අය ආයෙමත් කාමරවලට යනවට මම කැමැති නෑ. මම ඒ අයට මේ ගැන කියන්නද ?. එහෙම නැතිනම් ඔයා කියනවද ?.'

මෙට්‍රන් වරිය මිරාබෙල් දෙසට තියුණු බැල්මක් යොමු කළා ය. ඉන්පසුව ඈ මෙසේ කිවා ය.

'ඔයාවත් මමවත් ඒ ගැන අමුතුවෙන් කියන්න දෙයක් නෑ. මොකද මම කියපු දේ ඔයාට හොඳට ඇහුනා නේද ?. මේ ළමයි සීතල පරිසරයේ හිටියොත් අසනීප වෙනවා. ඒ වගේ දෙයක් වෙන්න දෙන්න මම කැමැති නෑ. ඒ හින්දා අද රෑ කිසිම රැස්වීමක් තියන්න බෑ.'

' නියමයි. අපේ හරිම හොඳ මෙට්‍රන්.'

ගැහැණු ළමුන් දෙතුන් දෙනෙකුගේ සිහින් ඔල්වරසන් හඬක් ද ඇසුනේ ය. මෙට්‍රන් වරියගේ තීරණය ඔවුන් ගේ හිත්වලට දැඩි සතුටක් ගෙන දුන්නාට කිසිම සැකයක් නැත.

එහෙත් මිරාබෙල් ද පරාජය පිළිගන්නට කැමැති නැතුවා සේය. ඇය මෙට්‍රන් වරිය සමඟ තර්ක කරන්නට වූයේ ඒ නිසා ය.

' ඒ වුනාට මෙට්‍රන් මේක ගොඩාක් වැදගත් රැස්වීමක්. මට කරන්න දෙයක් නෑ. මම ගිහිං මිස් තියෝබෝල්ඩ් හම්බ වෙලා මේ

Scanned with CamScanner

sinhalaebooks.com

ගැන කියනවා. මගේ රැස්වීම දිගටම කරගෙන යන්න එයා මට අවසර දෙයි. ඔයා මේ අයට අවසර දෙන්නේ නැතිනම් මට කරන්න තියෙන්නේ එච්චරයි.'

'බොහෝම හොඳයි මිරාබෙල්. දැන්මම ගිහිං ප්‍රින්සිපල් ගෙන් අහන්නකෝ.'

මේට්‍රන් වරිය සැහැල්ලුවෙන් කීවා ය. මිස් තියෝබෝල්ඩ් පාසලේ නොමැති බව ඈ දැන සිටියා ය. තමාගේ අපූරු රැස්වීම අතර මග කඩාකප්පල් වූ කෝපයෙන් යුතුවම මිරාබෙල් විදුහල්පතිනියගේ කාමරය වෙත ගියා ය.

අවාසනාවකි. මිස් තියෝබෝල්ඩ් කාමරයේ සිටියේ නැත. බලාපොරොත්තු කඩ වූ මිරාබෙල් නැවතත් ආපසු ආවා ය. මේට්‍රන්වරිය ගැන දැන් නම් ඇගේ සිතේ තිබෙන්නේ කෝපයකි. එහෙත් කළ හැකි දෙයක් නැත.

මිරාබෙල්. මුහුණ කෝපයෙන් කළු වෙලා ය. කර කියා ගත හැකි දෙයක් නොමැතිව ඈ තමාටම මෙසේ කියා ගත්තා ය.

'හොඳයි. රැස්වීම කඩාකප්පල් කරන්න හිතාගෙන සීනුව ගහපු කෙනා මම හොයාගන්නම්කෝ. ඊට පස්සේ මම එයාට හොඳ පාඩමක් උගන්වනවා. මුළු ඉස්කෝලෙටම දැනෙන්න.'

## අපූරු ඉස්කෝලේ අවසන් වාරේ

Scanned with CamScanner